## 1990 අංක 06 දරණ

# බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය

(සහතිකය සටහන් කළේ 1990 ඔක්තෝබර් මස 29 වන දින)

## 1992 අංක 04 දරණ සංශෝධනය දක්වා

බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

මිළ රු.125/=

# 1990 අංක 06 දරණ

# බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය

(සහතිකය සටහන් කළේ 1990 ඔක්තෝබර් මස 29 වන දින)

1992 අංක 04 දරණ සංශෝධනය දක්වා

බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

## පෙරවදන

1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ මෙම පුනර් මුද්‍රණයට 1992 අංක 04 දරණ සංශෝධනය දක්වා කරන ලද සියළුම සංශෝධනයන් අන්තර්ගත වේ. කෙසේ වුවද, එය ව්‍යවස්ථාපිත පුනර් මුද්‍රණයක් නොවේ. එය හුදෙක් පහසුව සඳහා නිකුත් කරන ලද්දකි.

සංශෝධන අන්තර්ගත කිරීම සහ සෝදුපත් කියවීම සඳහා නියෝජ්‍ය කොමසාරිස් කේ. සී. සේනාසිංහ සහ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු එස්. මුදලිගේ මහත්වරුන් ගෙන් ලැබුණු දායකත්වය අගය කොට සලකමි.

එස්. ඩී. ජේ. බී. හයිසින්ත්
පළාත් ආදායම් කොමසාරිස්
බස්නාහිර පළාත.

1997 ඔක්තෝබර් මස 01 වෙනි දින.

# පටුන


| වගන්තිය | | පිටුව |
|---|---|---|
| 1. | ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය. | 1 |
| 2. | නිලධාරීන් පත් කිරීම. | 1 |
| | *I වන කොටස* | |
| | *I වන පරිච්ඡේදය* | |
| | *පිරිවැටුම් බද්ද පැනවීම* | |
| 3. | පිරිවැටුම් බදු පැනවීම. | 2 |
| 4. | යම් තැනැත්තකු පිරිවැටුම් බද්ද ගෙවිය යුත්තේ කවර අවස්ථාවලදී ද යන්න. | 2 |
| | *II වන පරිච්ඡේදය* | |
| | *නිදහස් කිරීම* | |
| 5. | පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම. | 3 |
| | *III වන පරිච්ඡේදය* | |
| | *පිරිවැටුම* | |
| 6. | පිරිවැටුම. | 3 |
| | *IV වන පරිච්ඡේදය* | |
| | *බදු අනුප්‍රමාණ* | |
| 7. | පිරිවැටුම් බදු අනුප්‍රමාණය. | 4 |
| 8. | බැහැර කරනු ලැබූ භාණ්ඩ. | 5 |
| 9. | - එම - | 6 |
| | *V වන පරිච්ඡේදය* | |
| | *වාර්තා* | |
| 10. | වාර්තා සහ තොරතුරු. | 6 |
| | *VI වන පරිච්ඡේදය* | |
| | *බදු ගෙවීම* | |
| 11. | පිරිවැටුම් බද්ද ගෙවීම. | 9 |
| 12. | ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩනය. | 10 |
| | *VII වන පරිච්ඡේදය* | |
| | *තක්සේරු කිරීම්* | |
| 13. | තක්සේරු කිරීමට තක්සේරුකරුට ඇති බලය. | 11 |
| 14. | අතිරේක තක්සේරු. | 12 |
| 15. | - එම - | 13 |
| 16. | වාර්තාවක් පිළි නොගැනීම පිළිබඳව තක්සේරුකරු හේතු දැක්විය යුතු බව. | |
| | *VIII වන පරිච්ඡේදය* | |
| | *තක්සේරුවල අවසානාත්මක භාවය හා වැරදි වාර්තා සඳහා දණ්ඩනය.* | |
| 17. | තක්සේරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත්මක විය යුතු බව. | 13 |
| 18. | පිරිවැටුම් බද්ද අඩුවෙන් ගෙවීම සඳහා දඩුවම්. | 14 |

**වගන්තිය** **පිටුව**

### *IX වන පරිච්ඡේදය*
### *විශේෂ අවස්ථා, දණ්ඩන සහ වැරදි*


19. අශක්නුතාවට පත් තැනැත්තකු විසින් ක්‍රියා කළ හැකිද යන බව. 14
20. හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියා කළ යුතු බව. 15
21. සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් ප්‍රධාන නිලධාරියා ක්‍රියා කළ යුතු බව. 15
22. ව්‍යාපාරය අවසන් වන අවස්ථාවේදී පිරිවැටුම් බද්ද ගෙවීමේ වගකීම. 16
23. පිරිවැටුම් බද්ද ගෙවීමට පොල්මෑකරුවන් යටත් බව. 16
24. තමන්ට අයත් නොවන ව්‍යාපාර සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද ගෙවීම සඳහා ඇතැම් තැනැත්තන් සතු වගකීම. 18
25. ඒකාබද්ධ අනුයෝජිතයන් භාරකරුවන් හා පොල්මෑකරුවන්. 18
26. සමාගමක් ඇවර කිරීමේදී හෝ පුද්ගල මණ්ඩලයක් විසුරුවා හැරීමේදී පිරිවැටුම් බද්ද ගෙවිය යුතු වන තැනැත්තන්. 18
27. තක්සේරුවල වලංගු භාවය. 19
28. ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය. 20
29. ව්‍යාපාර ස්ථාන පරීක්ෂා කිරීමට ඇති බලය. 22
30. පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින්ම වවුචරය පිළියෙල කොට නිකුත් කළ යුතු බව. 23
31. ගනුදෙනු පිළිබඳ ලේඛනය. 24
32. රහස්‍යතාව කඩකිරීම් හා වෙනත් කාරණා වැරදි වන බව. 24
33. වංචා සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන. 25
34. වාර්තා ආදියට අදාළ දණ්ඩන විධිවිධාන. 26
35. වැරදි සමථයට පත් කිරීම. 27
36. නඩු පැවරීම කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව විය යුතු බව. 27


### *2 වන කොටස*
### *X වන පරිච්ඡේදය*
### *මුද්දර ගාස්තු පැනවීම*


37. මුද්දර ගාස්තු පැනවීම. 27
38. වෙනස් කරුණු කීපයකට අදාළ සාධන පත. 27


### *XI වන පරිච්ඡේදය*
### *නිදහස් කිරීම්*


39. නිදහස් කිරීම්. 28


### *XII වන පරිච්ඡේදය*
### *මුද්දර ගැසිය යුතු වේලාව සහ ආකාරය*


40. මුද්දර ගාස්තු ගෙවිය යුතු වේලාව සහ ආකාරය. 30
41. අලවන මුද්දර අවලංගු කිරීම. 31

| වගන්තිය | | පිටුව |
|---|---|---|


*XIII වන පරිච්ඡේදය*

*ඇතැම් සාධන පත්‍රවල මුද්දර ගැසිය යුතු අන්දම*

| | | |
|---|---|---|
| 42. | එකම මුද්දර ගාස්තුවක් සඳහා එක සාධන පත්‍රයක් විය යුතු බව. | 31 |
| 43. | හුවමාරු කිරීම්වලට බලපාන සාධන පත්‍රවල මුද්දර ගැසිය යුත්තේ කෙසේද යන වග. | 32 |
| 43.(අ) | - එම - | 32 |
| 44. | නඩු කටයුතු වල ලේඛන. | 33 |
| 45. | ඇතැම් සාධන පත්‍රවල අනු පිටපත්වල මුද්දර ගැසීම. | 33 |

*XIV වන පරිච්ඡේදය*

*මුද්දර ගාස්තු සමථයට පත් කිරීම*

| | | |
|---|---|---|
| 46. | ගෙවිය යුතු මුද්දර ගාස්තු සමථයට පත් කිරීම. | 33 |

*XV වන පරිච්ඡේදය*

*නඩු කටයුතුවල ගොනු කරනු ලබන ලේඛනවලට අදාළ විශේෂ විධිවිධාන*

| | | |
|---|---|---|
| 47. | සිවිල් නඩුවල වටිනාකම. | 34 |

*XVI වන පරිච්ඡේදය*

*මුද්දර ගාස්තුව සඳහා වටිනාකම තක්සේරු කිරීම*

| | | |
|---|---|---|
| 48. | මුද්දර ගාස්තුව සඳහා වටිනාකම තක්සේරු කිරීම. | 35 |
| 49. | - එම - | 36 |
| 50. | ගාස්තු ගෙවීම වලක්වාලීම සඳහා සාධන පත්‍ර කිහිපයක් සකස් කිරීම. | 36 |

*XVII වන පරිච්ඡේදය*

*මුද්දර ගාස්තු ගෙවීමට බැඳී සිටින තැනැත්තෝ*

| | | |
|---|---|---|
| 51. | මුද්දර ගාස්තු ගෙවිය යුත්තේ කවුරුන් විසින් ද යන වග. | 37 |
| 52. | මුද්දර ගාස්තු සම්බන්ධයෙන් වෙනත් පාර්ශවකරුවන්ගේ බැඳීම. | 37 |
| 53. | සමාගම ගණන් බේරා වසා දැමූ විට, ඇතිවන බැඳීම. | 38 |

*XVIII වන පරිච්ඡේදය*

*සාධන පත්‍ර තහනමට ගැනීම*

| | | |
|---|---|---|
| 54. | සාධන පත්‍ර තහනමට ගෙන පරීක්ෂා කිරීම සඳහා ඇතැම් නිලධරයන් සතු බලය. | 39 |
| 55. | තහනමට ගන්නා ලද සාධන පත්‍ර කොමසාරිස්වරයා වෙත යැවිය යුතු බව. | 41 |
| 56. | අහම්බෙන් නිසි පරිදි මුද්දර නොගැසූ සාධන පත්‍ර ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කිරීම. | 41 |
| 57. | තහනමට ගන්නා ලද සාධන පත්‍ර සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් ක්‍රියා කළ යුතු බව. | 42 |
| 58. | ගාස්තු ගෙවනු ලැබූ සාධන පත්‍රයක් පිටසන් කිරීම. | 43 |
| 59. | යවන ලද සාධන පත්‍ර නැතිවීම සම්බන්ධයෙන් වගකීමක් නැති බව. | 44 |

| වගන්තිය | | පිටුව |
|---|---|---|
| | ***XIX* වන පරිච්ඡේදය** | |
| | ***සාධන පත්‍ර පිළිගැනීම*** | |
| 60. | සාධන පත්‍ර පිළිගැනීම. | 44 |
| 61. | ඇතැම් අවස්ථාවලදී කුවිතාන්සි පිළිගැනීම. | 45 |
| | ***XX* වන පරිච්ඡේදය** | |
| | ***මුද්දර ගාස්තු නිශ්චය කිරීම*** | |
| 62. | නිසි මුද්දර ගාස්තු නිශ්චය කිරීම. | 45 |
| 63. | - එම - | 46 |
| 64. | තක්සේරුකරුගේ පිටසන. | 46 |
| | ***XXI* වන පරිච්ඡේදය** | |
| | ***මුද්දර සදහා දීමනා*** | |
| 65. | පාවිච්චි නොකරන ලද හා නරක් වූ මුද්දර සදහා දීමනා. | 47 |
| | ***XXII* වන පරිච්ඡේදය** | |
| | ***වැරදි සහ දණ්ඩන*** | |
| 66. | නිසි පරිදි මුද්දර නොගැසූ සාධන පත්‍ර ලියා අත්සන් කිරීම ආදිය සදහා දණ්ඩනය. | 48 |
| 67. | මහජන නොතාරිස්වරුන් විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම. | 49 |
| 68. | සභාවට වංචා කිරීම සදහා දණ්ඩනය. | 50 |
| 69. | - එම - | 51 |
| 70. | දණ්ඩන ආදිය සදහා යම් නඩු කටයුත්තක් තිබුණද, මුද්දර ගාස්තු ප්‍රමාණය හෝ දඩය ගෙවිය යුතු බව. | 51 |
| 71. | නඩු පැවරීම. | 52 |
| 72. | සමථයකට පත්කිරීමට කොමසාරිස්වරයාට ඇති බලය. | 52 |
| | ***XXIII* වන පරිච්ඡේදය** | |
| | ***සාමාන්‍ය කරුණු*** | |
| 73. | දැන්වීමක් අත්සන් කිරීම භාරදීම සහ එහි වලංගු භාවය. | 52 |
| 73(8) | තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලය. | 53 |
| 74. | දණ්ඩන සම්බන්ධයෙන් අභිමතය පාවිච්චි කිරීම. | 54 |
| 75. | මුද්දර ගාස්තු හෝ දණ්ඩන ගෙවන තැනැත්තන් විසින් ඇතැම් අවස්ථාවලදී ඒ ගාස්තු හෝ දණ්ඩන ආපසු ලබාගත හැකි බව. | 55 |
| 76. | නියමයන්. | 55 |
| 77. | නියෝග. | 56 |
| 78. | පැවරීමේ පත්‍රවලට බලපාන කරුණු. | 56 |
| | ***3 වන කොටස*** | |
| | ***XXIV* වන පරිච්ඡේදය** | |
| | ***අභියාචනා*** | |
| 79. | පළාත් කොමසාරිස්වරයා වෙත අභියාචන ඉදිරිපත් කිරීම. | 58 |

### XXV වන පරිච්ඡේදය
### සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීම


| | | |
|---|---|---|
| 80. | සමාලෝචන මණ්ඩලයේ සංයුතිය. | 63 |
| 81. | සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනය කිරීම. | 63 |
| 82. | පළාත් කොමසාරිස්වරයා විසින් අභියාචන, සමාලෝචන මණ්ඩලයට යොමු කළ හැකිය. | 64 |
| 83. | - එම - | 64 |


### XXVI වන පරිච්ඡේදය
### අභියාචනාධිකරණයට කරනු ලබන අභියාචන


| | | |
|---|---|---|
| 84. | නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණයට අභියාචනා කිරීම. | 67 |


### XXVII වන පරිච්ඡේදය
### බද්ද අයකර ගැනීම


| | | |
|---|---|---|
| 85. | බද්ද අයකර ගැනීම. | 70 |
| 86. | - එම - | 72 |
| 87. | - එම - | 73 |
| 88. | - එම - | 74 |
| 89. | - එම - | 77 |
| 90. | - එම - | 79 |
| 91. | ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන්ගෙන් අයකර ගැනීම. | 82 |
| 92. | අයකර ගැනීම සඳහා එකකට වැඩි මාර්ග ගණනක් උපයෝගී කර ගැනීම. | 83 |
| 93. | ගාස්තුව අය කර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීමට ඇති බලය. | 83 |


### 4 වන කොටස
### XXVIII වන පරිච්ඡේදය
### සුරාබදු ආදායම


| | | |
|---|---|---|
| 94. | සුරාබදු බලපත්‍ර ගාස්තු සහ තැබෑරුම් කුලී. | 83 |
| 95. | - එම - | 84 |


### 5 වන කොටස
### XXIX වන පරිච්ඡේදය
### ලොතරැයි


| | | |
|---|---|---|
| 96. | ලොතරැයි බද්ද. | 84 |
| 97. | බද්ද ගෙවීම. | 85 |


### 6 වන කොටස
### XXX වන පරිච්ඡේදය
### මෝටර් වාහන


| | | |
|---|---|---|
| 98. | මොටර් වාහන ගාස්තු | 85 |

වගන්තිය පිටුව

*7 වන කොටස*
*XXXI වන පරිච්ඡේදය*
*අධිකරණ දඩ*

99. අධිකරණ දඩ සහ ගාස්තු. 86

*8 වන කොටස*
*XXXII වන පරිච්ඡේදය*
*සාමාන්‍ය කරුණු*

100. දැන්වීමක් අත්සන් කිරීම එය භාරදීම. 86
101.(1) අනවධානයෙන් ගෙවන ලද මුද්දර ගාස්තුව හෝ දණ්ඩන මුදල්. 87
101.(2) වැඩියෙන් ගෙවූ පිරිවැටුම් බදු ආපසු ගෙවිය යුතු බව. 87
102. නිල රහස්‍යතාව. 88
103. ආකෘති හා ගණුදෙනු ලේඛන. 92

*XXXIII වන පරිච්ඡේදය*
*ක්‍රියාත්මක කිරීම*

104. නිලධරයන්. 92
105. - එම - 93

*XXXIV වන පරිච්ඡේදය*
*අර්ථ නිරූපනය*

106. අර්ථ නිරූපනය. 93

*XXXV වන පරිච්ඡේදය*

107. 1989 අංක 6 දරණ මුදල් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම- බස්නාහිර පළාත් සභාව. 101

## බදු සහ ගාස්තු පැනවීම සහ අයකිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

මේ ප්‍රඥප්තිය, සංශෝධිත පරිදි වූ 1981 අංක 69 දරණ පිරිවැටුම් බදු පනත, සංශෝධිත පරිදි වූ 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත, සංශෝධිත පරිදි වූ සුරාබදු ආඥාපනත, සංශෝධිත පරිදි වූ මහනගර සභා ආඥාපනත, සංශෝධිත පරිදි වූ නගර සභා ආඥාපනත, සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යන පනත්හි ඇතැම් විධිවිධාන වලට අනනුකූල වේ.

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. (1) මේ ප්‍රඥප්තිය 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට එහි විධිවිධාන ක්‍රියාත්මක වන්නේය.

(2) මේ ප්‍රඥප්තියේ ඒ ඒ කොටස් සඳහා වෙනස් වෙනස් දිනයන් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකිය. 1 වන හෝ 2 වන කොටස ක්‍රියාත්මක කරනු ලැබූ කවර වුවද අවස්ථාවකදී එකී 1 වන හෝ 2 වන කොටස පළමුව ක්‍රියාත්මක කරනු ලැබූ දින සිට 3 වන සහ 8 වන කොටස්ද 4 වන, 5 වන, 6 වන හෝ 7 වන කොටස් ක්‍රියාත්මක කරනු ලැබූ කවර වුවද අවස්ථාවකදී එවකටත් 8 වන කොටස ක්‍රියාත්මක කොට නොතිබුනේ නම්, එකී 4 වන, 5 වන 6 වන හෝ 7 වන කොටස්වලින් කවරක් හෝ පළමුව ක්‍රියාත්මක කරනු ලැබූ දින සිට 8 වන කොටස ද ක්‍රියාත්මක කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

නිලධාරීන් පත්කිරීම

2. මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයකු සහ නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරුන්, පළාත් තක්සේරුකරුවන් සමග වෙනත් නිලධරයන් අවශ්‍ය සංඛ්‍යාවක් පත්කරනු ලැබිය හැකිය.

## 1 වන කොටස

## I වන පරිච්ඡේදය

## පිරිවැටුම් බද්ද පැනවීම

පිරිවැටුම් බදු පැනවීම

3. (1) පළාත් තුළ ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ සැම තැනැත්තකුගෙන්ම 1991 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන සැම කාර්තුවක් සඳහා ම (මෙහි මින් මතු "පිරිවැටුම් බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාගේ පිරිවැටුම සම්බන්ධයෙන්, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව ආගණනය කරනු ලැබූ බද්දක්, පාර්ලිමේන්තුව විසින් සාදනු ලබන නීතිවලින් සහ මේ පනතේ වෙනත් විධිවිධානවලින් නියම කර ඇති සීමාවලට සහ නිදහස් කිරීම්වලට යටත්ව අය කරනු ලැබිය යුතුය.

(2) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා, "ව්‍යාපාරය" යන්නෙන්, යම් පාරිභෝගික ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් තොග වශයෙන් නැතහොත් සිල්ලරට විකිණීම අදහස් වන නමුත් නිෂ්පාදකයකු විසින් කරනු ලබන විකිණීමක් ඊට අයත් නොවේ.

යම් තැනැත්තකු පිරිවැටුම් බද්ද ගෙවිය යුත්තේ කවර අවස්ථාවලදී ද යන්න.

4. (1) පළාත තුළ යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් එක් එක් කාර්තුව සඳහා පිරිවැටුම් බද්ද ඔහුගෙන් අයකර ගනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාගෙන් පිරිවැටුම් බද්ද අයකර ගනු ලැබිය යුතු විටක සහ ඒ ව්‍යාපාරයේ අයිතිය මාරුවීමක් සිදුවී ඇති විටක, (1) වන උපවගන්තියේ සලස්වා ඇති විධිවිධාන නොතකා ඒ ව්‍යාපාරයේ නව අයිතිකරු ඒ ව්‍යාපාරයේ අයිතිය වෙනස්වීමට පෙරාතුවම ඒ ව්‍යාපාරයේ අයිතිකරුව සිටියාක් මෙන් සලකා ඒ ව්‍යාපාරයේ නව අයිතිකරුගෙන් පිරිවැටුම් බදු අයකර ගනු ලැබිය යුතුය.

## II වන පරිච්ඡේදය

## නිදහස් කිරීම

පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම

5\. (1) අමාත්‍යවරයා විසින්, පළාතේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය බව තමාගේ මතය වේ නම්, ගැසට් පත්‍රයේ පළකරන නියමය මගින්, යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් හෝ නිශ්චිත වශයෙන් දක්වනු ලබන ව්‍යාපාරයක් හෝ පිරිවැටුම් බද්දෙන් නිදහස් කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙහි සිට හෝ ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු අතර, ඒ නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූදින සිට, මාස තුනක කාලසීමාවක් ඇතුළත හෝ, ඒ කාලසීමාව ඇතුළත පළාත් සභාවේ රැස්වීමක් පවත්වනු නොලැබුවහොත්, ඒ කාලසීමාව ඉකුත් වීමෙන් පසුව පවත්වනු ලබන පළාත් සභාවේ ප්‍රථම රැස්වීමේ දී හෝ ඒ නියමය අනුමත කරන ලෙසට වූ යෝජනාවක් මගින් ඒ නියමය පළාත් සභාව ඉදිරියට ගෙන එනු ලැබිය යුතුය.

(3) පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් නියමයක්, ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින "තෙක්" ඒ නියමයේ වලංගු භාවයට හානියක් නොමැතිව ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරන ලදැයි සලකනු ලැබිය යුතු අතර, ඒ නියමය යම් දිනයකදී ප්‍රත්‍යාදිෂ්ට කරන ලදැයි සැලකෙන්නේ ද ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

## III වන පරිච්ඡේදය

## පිරිවැටුම

පිරිවැටුම

6\. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් "පිරිවැටුම" යන්නෙන් ඒ

ව්‍යාපාරය සම්බන්ධයෙන් එළඹුණු ගනුදෙනුවලින් ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදල් ප්‍රමාණය අදහස් වේ.

(2) ඉහත (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "පිරිවැටුම" යන්නට මූලධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබීමට ඇති යම් මුදල් ප්‍රමාණයක් ඇතුළත් නොවේ.

(3) යම් කාර්තුවක් සම්බන්ධයෙන් ඒ කාර්තුව ඇතුළත ලබා ගත හැකි යම් මුදල් ප්‍රමාණයක් සඳහා පිරිවැටුම් බද්ද ගෙවන ලද අවස්ථාවක ඒ මුදල් ප්‍රමාණය නියම වශයෙන් ලබාගන්නා ලද්දේ යම් කාර්තුවක් ඇතුළත ද ඒ කාර්තුව සම්බන්ධයෙන් ඒ මුදල් ප්‍රමාණය සඳහා කිසිම බද්දක් ගෙවනු ලැබීම අවශ්‍ය නොවේ.

(4) යම් කාර්තුවක් සඳහා ව්‍යාපාරයක පිරිවැටුම් නිශ්චය කිරීමේ දී, කලින් කාර්තුවක් සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුමෙහි ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ ද ඒ සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ගෙවනු ලැබ ඇත්තා වූ ද ඒ ව්‍යාපාරය විසින් දරන ලද බොල් ණයක් වන්නා වූ ද මුදලක් වන ඒ කාර්තුව තුළ බොල් ණයක් වී ඇත්තා වූ යම් බොල් ණයකට සමාන මුදලක් අඩුකරනු ලැබිය යුතුය.

එසේ වුව ද බොල් ණයක් සම්බන්ධයෙන් මේ උපවගන්තිය යටතේ කලින් අඩු කරනු ලැබූ මුදලක් වෙනුවෙන් යම් කාර්තුවක දී යම් මුදලක් ලැබුණහොත් ඒ මුදල් භාර ගනු ලැබුවේ යම් කාර්තුවක දී ද ඒ කාර්තුව සඳහා වූ ඒ ව්‍යාපාරයේ පිරිවැටුමෙහි ඒ මුදල ඇතුළත් කරනු ලැබිය යුතුය.

## IV වන පරිච්ඡේදය

### බදු අනුප්‍රමාණ

පිරිවැටුම් බදු අනුප්‍රමාණය

7. (1) යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බදු අනුප්‍රමාණ ඒ ව්‍යාපාරයේ ස්වභාවය අනුව තීරණය කරනු ලැබිය හැකි අතර, ඒ අනුව, අමාත්‍යවරයා විසින් ඒ ඒ වෙනස් පන්තිවල හෝ වර්ගවල ව්‍යාපාර සඳහා වෙනස්, වෙනස් බදු අනුප්‍රමාණ තීරණය කොට ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මඟින් යම් ව්‍යාපාර පංතියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් පිරිවැටුම් බදු ප්‍රමාණය කලින් කල වෙනස් කිරීම කරනු ලැබිය හැකිය.

(3) (1) වන උපවගන්තිය යටතේ සෑම තීරණයක් ම හා (2) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ ඒ තීරණය කිරීමෙහි හෝ නියමයෙහි සඳහන් කරනු ලැබූ පසු දිනයක සිට බලාත්මක විය යුතු අතර, ඒ තීරණය කිරීම හෝ නියමය ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දිනයේ සිට තුන් මසක කාලසීමාවක් ඇතුළත හෝ ඒ කාලසීමාව ඇතුළත පළාත් සභාවේ රැස්වීමක් පවත්වනු නොලැබුවහොත් ඒ කාලසීමාව ඉකුත්වූ පසු පවත්වනු ලබන ප්‍රථම පළාත් සභා රැස්වීමේ දී ඒ තීරණය කිරීම හෝ නියමය අනුමත කරනු ලැබීමට යෝජනාවක් මඟින් පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එවැනි සෑම යෝජනාවකම උපලේඛනයක ඒ යෝජනාවේ සඳහන් කරනු ලබන්නේ යම් තීරණය කිරීමක් හෝ නියමයක් ද, ඒ තීරණය කිරීමෙහි හෝ නියමයෙහි පෙල දක්වනු ලැබිය යුතුය.

(4) පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ (1) වන උපවගන්තිය යටතේ වූ යම් තීරණය කිරීමක් හෝ (2) වන උපවගන්තිය යටතේ වූ යම් නියමයක්, ඒ යටතේ කරන ලද යම් දෙයක වලංගු භාවයට හානියක් නොවන පරිදි, ඒ ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතුය. එවැනි යම් තීරණය කිරීමක් හෝ නියමයක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

බැහැර කරනු ලැබූ භාණ්ඩ.

8. අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ඒ නියමයෙහි නියමිත යම්

භාණ්ඩයක් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා බැහැර කරන ලද භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කළ හැකිය. වෙනස් වෙනස් පංති හෝ වර්ගවල ව්‍යාපාර සම්බන්ධයෙන් වෙනස් වෙනස් භාණ්ඩ බැහැර කරන ලද භාණ්ඩ ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

9. 8 වැනි වගන්තිය යටතේ යම් භාණ්ඩයක් යම් ව්‍යාපාර පංතියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් බැහැර කරන ලද භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක ඒ භාණ්ඩය විකිණීමෙන් ලබා ගන්නා මුදල් වෙනුවෙන් කිසිම පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු නොවන්නේය.

## V වන පරිච්ඡේදය

## වාර්තා

වාර්තා සහ තොරතුරු.

10. (1) පළාත තුළ යම් ව්‍යාපාරයක් කරගෙන යන සෑම තැනැත්තකුම විසින්, එක් එක් කාර්තුවේ දී ඒ ව්‍යාපාරයේ පිරිවැටුම දැක්වෙන වාර්තාවක් ඒ එක් එක් කාර්තුව අවසානවීමෙන් පසු දින පහළොවක් ගතවීමට පෙර පළාත් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි සෑම වාර්තාවක්ම නියමිත ආකෘතිය මගින් විය යුතු අතර ඒ ආකෘතියෙහි ඇතුළත් කළ යුතු යයි නියමිත සියලූ තොරතුරු ඒ ආකෘතියෙහි ඇතුළත් කළ යුතුය.

(2) තක්සේරුකරුවකු විසින්, ඔහුගේ විනිශ්චය පරිදි පිරිවැටුම් බදු අය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු වෙත යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාලය ඇතුළත තක්සේරුකරුට අවශ්‍ය වන විස්තර ඇතුළත් වාර්තාවක් සපයන ලෙස විධාන කළ හැකිය.

(3) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක පිරිවැටුම සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබාගැනීමේ කාර්යය සඳහා තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තා වෙත යවනු ලබන ලිඛිත දැන්වීමකින්.

(අ) ඒ දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත එහි සඳහන් යම් පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක්පත්,

ගෙවිලි තුණ්ඩු , විගණක වාර්තා හෝ ඒ තැනැත්තා සන්තකයෙහි ඇති ඒ දැන්වීමෙහි සඳහන් වෙනත් යම් ලේඛන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලද හෝ තක්සේරුකරු වෙත යවන ලෙස;

(ආ) ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් පිරිවැටුම පිළිබඳ පරීක්ෂා කරනු ලැබීමේ කාර්යය සඳහා ඒ දැන්වීමේ සඳහන් යම් ස්ථානයකට එහි සඳහන් යම් දිනයක හා වේලාවක තමාම හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පැමිණෙන ලෙස.

නියම කරනු ලැබිය හැකිය.

(4) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමකින්.

(අ) ඒ දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත එහි සඳහන් යම් පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක්පත්, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ ඒ තැනැත්තා සන්තකයෙහි ඇති ඒ දන්වීමෙහි සඳහන් වෙනත් ලේඛන ඉදිරිපත් කරන ලෙස හෝ ඒ නියෝජ්‍ය කොමසාරිස්වරයා වෙත යවන ලෙස;

(ආ) ඒ දන්වීමේ සඳහන් යම් කරුණක් හෝ කරුණු පිළිබඳ ඔහු පරීක්ෂා කරනු ලැබීම සඳහා දන්වීමේ සඳහන් යම් ස්ථානයකට එහි සඳහන් යම් දිනයක හා වේලාවක තමා ම හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පැමිණෙන ලෙස,

නියම කරනු ලැබිය හැකිය.

(5) (4) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමක් ප්‍රකාර පැමිණෙන යම් තැනැත්තකුට එසේ පැමිණීමෙන් ඔහු විසින් සාධාරණව දරන ලද වියදම් කොමසාරිස් වරයා විසින් අනුමත කරනු ලැබිය හැකිය.

(3) වන උපවගන්තිය යටතේ හෝ 4 වන උපවගන්තිය යටතේ නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත හෝ නියෝජ්‍ය

කොමසාරිස්වරයකුගේ අනුමැතිය ඇතිව තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ ඉදිරිපත් කර තිබුණා වූ හෝ ප්‍රේෂණය කරනු ලැබූ හෝ ප්‍රේෂණය කොට තිබුණා වූ හෝ වෙනත් ආකාරයකින් තම සන්තකයට පත්වන හෝ පත්ව තිබෙන යම් පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු. ලේඛන, වවුචර, චෙක්පත්, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ වෙනත් ලියකියවිලි මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තම භාරයෙහි යම් කාලයක් සඳහා රඳවා ගැනීමට අවශ්‍ය වන්නේද ඒ කාලය සඳහා තම භාරයෙහි රඳවා ගනු ලැබිය හැකිය.

(6) තක්සේරුකරුවකු විසින් අවශ්‍ය යයි තමා අදහස් කරන කවර විටක සහ විටින් විට යම් තැනැත්තකුට ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්:-

(අ) වඩා පරිපූර්ණ හෝ වැඩිමනත් වාර්තා, හෝ

(ආ) තක්සේරුකරුගේ අදහස පරිදි ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු පිරිවැටුම් බද්ද තක්සේරු කිරීමෙහි ලා අවශ්‍ය වන්නාවූ හෝ අදාළ වන්නා වූ යම් කාරණයක් පිළිබඳව වඩාත් පරිපූර්ණ හෝ වැඩිමනත් තොරතුරු

ඒ නිවේදනයෙහි සඳහන් නියමිත කාලය තුළ සපයන ලෙස නියම කරනු ලැබිය හැකිය.

(7) යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් මේ ප්‍රඥප්තිය යටතේ සපයනු ලැබිය යුතු යැයි සලකනු ලබන වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘතියක් අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ සපයන ලද බවට සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර ඊට පටහැනිව කරුණු ඔප්පු කරන්නේ නම් මිස, එවැනි යම් වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘතියක් අත්සන් කරන යම් තැනැත්තකුට ඒ වාර්තාවේ, ප්‍රකාශයේ හෝ ආකෘතියේ ඇතුළත් සියලු කරුණු පිළිබඳ දැනීම ඇති බවට සළකනු ලැබිය යුතුය.

(8) (2) වන උපවගන්තිය යටතේ තක්සේරුකරුවකු විසින් යම් තැනැත්තකුට දෙන ලද දැන්වීමක නියමයන් අනුව කටයුතු කිරීමට ඔහු පැහැර හරින අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින් :-

(අ) ඒ තැනැත්තා මත රුපියල් දස දහසක් නොඉක්මවන දණ්ඩනයක් පැනවිය හැකිය; තවද

(ආ) (i) ඒ දඩ ගෙවීමට, සහ

(ii) තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට දෙන ලද දැන්වීමෙහි සඳහන් වන වාර්තාව කොමසාරිස්වරයාගේ දැන්වීමෙහි සඳහන් යම් කාලයක් ඇතුළත සැපයීමට

ඒ තැනැත්තාට නියම කළ හැකිය.

(9) යම් තැනැත්තකු විසින් වාර්තාවක් සැපයීම පැහැර හැරීමට හේතුව තම පාලනයෙන් බාහිර වූ අවස්ථානුගත කරුණු නිසා බවට සහ දණ්ඩනය නියම කිරීමෙන් පසු තමා විසින් ඒ වාර්තාව සපයා ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, මේ වගන්තිය යටතේ ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් කොමසාරිස්වරයා විසින් අඩුකරනු ලැබිය හැකිය; නැතහොත් අත්හරිනු ලැබිය හැකිය.

(10) (8) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දණ්ඩනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දැන්වීමට අදාළව 34 වන වගන්තිය යටතේ වරදක් සඳහා වූ අපරාධ චෝදනාවකට ඒ තැනැත්තා යටත් නොවිය යුතුය.

## VI වන පරිච්ඡේදය

### බදු ගෙවීම

පිරිවැටුම් බද්ද ගෙවීම.

11. යම් කාර්තුවක් සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ඒ කාර්තුව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ පහළොස්වන දින පසුවීමට පෙර ගෙවිය යුතුය. එසේ නොගෙවන ලද

යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ යම් බද්දක් එක් තැනැත්තෙකුට වැඩි දෙනෙකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති අවස්ථාවක ඒ තැනැත්තන්ගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු විසින් ද මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා ගෙවීම පැහැර හැරියකු ලෙස සලකනු ලැබිය යුතුය.

ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩනය

12. (1) යම් පිරිවැටුම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක ගෙවීම පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දට අතිරේකව දණ්ඩනයක් වශයෙන්.

(අ) ගෙවීම පැහැර හැර ඇති මුදලින් සියයට දහයකට සමාන මුදලක්; සහ

(ආ) ගෙවීම පැහැර හැරඇති යම් මුදලක් ඒ බද්ද ගෙවීම පැහැර හැරීම ඇරඹී ඇත්තේ යම් මාසයක් ඇතුළත ද ඒ මාසයට පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පෙර නොගෙවන ලද අවස්ථාවක ගෙවීම පැහැර හැර තිබෙන කාලසීමාවේ එක් එක් මාසයේ හෝ ඉන් කොටසෙහි පහළොස් වන දිනයෙන් අවසන්වන එක් එක් කාලසීමාව වෙනුවෙන්, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිපුර මුදලක්,

ගෙවනු ලැබිය යුතුය.

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවනු ලැබිය යුතු මුළු මුදල ගෙවීම පැහැර හැර ඇති බද්දෙන් සියයට පනහක් කවර අවස්ථාවක දී හෝ නො ඉක්මවිය යුතු අතර ගෙවීම පැහැර හැරීම සිදු වී ඇති යම් විශේෂ කාරණා හේතු කොට ගෙන ඒ මුදල අත්හැරීම හෝ අඩු කිරීම සාධාරණ සහ යුක්ති සහගත බව කොමසාරිස්වරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි යම් මුදලක් අත්හැර දැමීම හෝ අඩුකිරීම කළ හැකිය.

(2) 79 වන වගන්තිය යටතේ අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කිරීම මත (1) වන උපවගන්තිය යටතේ එකතු කරනු ලැබූ යම් මුදලක් හෝ මුදල් ද සමග යම් පැහැර හරින ලද බද්දක් අඩු කරන ලද විටක, ඒ මුදල හෝ මුදල්, එසේ අඩු කරන ලද බද්ද මත ගණන් බැලිය යුතුය.

## VII වන පරිච්ඡේදය

## තක්සේරු කිරීම්

තක්සේරු කිරීමට තක්සේරුකරුට ඇති බලය.

13. (1) යම් තැනැත්තකු -

(අ) තක්සේරුකරුවකුගේ මතය පරිදි පිරිවැටුම් බද්ද ගෙවිය යුතු වන්නේද, ඒ තැනැත්තා යම් කාර්තුවක් සඳහා 10 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයීම සහ ඒ කාර්තුව සඳහා බදු ගෙවීම පැහැර හැරිය හොත්;

(ආ) පිරිවැටුම් බද්ද ගෙවිය යුතු වන්නේ ද ඒ තැනැත්තා යම් කාර්තුවක් සඳහා 10 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයූ නමුත් ඒ කාර්තුව සඳහා බදු ගෙවීම පැහැර හැරිය හොත්.

තක්සේරුකාරුගේ මතය අනුව ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු පිරිවැටුම් බදු ප්‍රමාණය පළාත් තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ඒ මුදල වහාම ගෙවන ලෙස ඒ තැනැත්තාට ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතුය. යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා එසේ තක්සේරු කරන ලද මුදල් ප්‍රමාණය, 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බදු ප්‍රමාණය ලෙස සලකනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා (1) වන උපවගන්තිය යටතේ කරන ලද තක්සේරුවකින්, ඒ තක්සේරු කරන ලද මුදල එම කාර්තුව සඳහා ඔහුගෙන් අයවිය යුතු පිරිවැටුම් බදු මුදල වූවාක් සේ සලකා 12 වන වගන්තිය යටතේ දණ්ඩනයකට ඒ තැනැත්තා යටත් විය යුතු වීම කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතුය.

(3) යම් කාර්තුවක් සම්බන්ධයෙන් 10 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයීම පැහැර හරින ලද තැනැත්තකු විසින් ඒ කාර්තුව සඳහා ගෙවන ලද පිරිවැටුම් බදු මුදල පළාත් තක්සේරුකරුගේ මතය අනුව, ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු නියම මුදලට වඩා අඩු වූ විටක පළාත් තක්සේරුකරුගේ විනිශ්චය අනුව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල පළාත් තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලැබූදිනයකට පෙර, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතුය.

(4) යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා පිරිවැටුම් බද්ද වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ඒ කාර්තුව සඳහා ගෙවීම පැහැර හරින ලද පිරිවැටුම් බද්ද ලෙස සැලකිය යුතුය. ඒ අනුව 11 වන වගන්තිය යටතේ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුනේ යම් දිනයක ද එදින සිට ඒ තැනැත්තා 12 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ, ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතුය.

අතිරේක තක්සේරු.

14. පිරිවැටුම් බද්ද අය කරනු ලැබිය යුතු යම් තැතැත්තකු විසින්, යම් කාර්තුවක් සඳහා බද්ද වශයෙන්, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු හෝ ඒ කාර්තුව සඳහා අයකර ගත යුතු නියම මුදල් ප්‍රමාණයට වඩා අඩු මුදල් ප්‍රමාණයක්, ගෙවනු ලැබ ඇති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක ඒ තක්සේරුකරු විසින් කවර විටක වුව ද තම විනිශ්චයට අනුව ඒ තැනැත්තා විසින් බද්ද ගෙවනු ලැබිය යුතුව තිබුණේ යම් අතිරේක මුදල් ප්‍රමාණයකට ද ඒ අතිරේක මුදල් ප්‍රමාණය අනුව ඒ තැනැත්තාගෙන් පිරිවැටුම් බද්ද අයවිය

යුතු ලෙස තක්සේරු කරනු ලැබිය හැකිය. තක්සේරුකරු විසින් ඒ තැනැත්තා වෙත තක්සේරු කිරීමේ දැන්වීමක් දෙනු ලැබිය යුතුය.

15. යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන්, 14 වන වගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක එසේ තක්සේරු කරන ලද මුදල ඒ කාර්තුව සඳහා නොගෙවා පැහැර හරින ලද පිරිවැටුම් බද්ද ලෙස සැලකිය යුතුය. ඒ අනුව 11 වන වගන්තිය යටතේ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුණේ යම් දිනයක ද ඒ එදින සිට ඒ තැනැත්තා 12 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතුය.

වාර්තාවක් පිළි නොගැනීම පිළිබඳව තක්සේරුකරු හේතු දැක්විය යුතු බව.

16. යම් තැනැත්තකු විසින් 10 වන වගන්තිය යටතේ යම් කාර්තුවක් සඳහා සපයන ලද වාර්තාවක්, තක්සේරු විසින් පිළිනොගෙන ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා 13 වන වගන්තිය හෝ 14 වන වගන්තිය යටතේ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක ,ඔහු විසින් ඒ වාර්තාව පිළිනොගැනීමට හේතු තැපෑලෙන් යවන ලද ලියාපදිංචි කරන ලද ලිපියක් මගින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැන්විය යුතුය.

## VIII වන පරිච්ඡේදය

## තක්සේරුවල අවසානාත්මකභාවය හා වැරදි වාර්තා සඳහා දණ්ඩනය

තක්සේරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත්මක විය යුතු බව.

17. පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් තක්සේරුවකට විරුද්ධව මේ ප්‍රඥප්තියේ නියමිත කාලසීමාව තුළ වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක, හෝ ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් 79(5) වගන්තිය යටතේ එකඟ වී ඇති අවස්ථාවක හෝ අභියාචනයේදී නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි, කරන ලද හෝ එකඟ වන ලද හෝ අඩු කරන ලද හෝ වැඩි කරන ලද හෝ ස්ථිර කරන ලද තක්සේරුව ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක වන්නේය:

එසේ වුව ද, යම් කාර්තුවක් සඳහා අභියාචනයේදී නිශ්චය කරනු ලැබ ඇති යම් කරුණක් නැවත සලකා බැලීම ඇතුළත් නොවන්නේ නම් ඒ කාර්තුව සඳහා තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීමෙහි ලා තක්සේරුකරුවකු මේ ප්‍රඥප්තියේ අඩංගු කිසිවක් නිසා නොවැළැක්වෙන්නේය.

පිරිවැටුම් බද්ද අඩුවෙන් ගෙවීම සඳහා දඩුවම්

18. යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවකදී පිරිවැටුම් බද්දේ ප්‍රමාණය, ස්වකීය වාර්තාවේ නියමිත පිරිවැටුම මත අයවිය යුතු මුදල් ප්‍රමාණය ලෙස ඔහු විසින් එවකට ගෙවනු ලැබ ඇති මුදල් ප්‍රමාණය ඉක්මවන්නා වූද, තක්සේරුව 17 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින්, ස්වකීය වාර්තාවේ පිරිවැටුම එළිදරව් කිරීමේ දී හෝ ඒ පිරිවැටුම සම්බන්ධ පිරිවැටුම් බදු අනු ප්‍රමාණය අදාළ කිරීමේ දී හෝ වංචාවක් හෝ ඕනෑකමින් ම පැහැර හැරීමක් සිදු වී නොමැති බව පළාත් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන පරිදි සනාථ කරනු ලබන්නේ නම් මිස, සාවද්‍ය වාර්තාවක් පිළියෙල කිරීම සඳහා හෝ තම වාර්තාවෙහි දක්වා ඇති පිරිවැටුමට සාවද්‍ය පිරිවැටුම් බදු අනුප්‍රමාණයක් අදාළ කිරීම සඳහා දණ්ඩනය වශයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන මුදලක් හා තක්සේරුවෙන් පෙන්නුම් කරන මුළු පිරිවැටුම් බද්ද සහ වාර්තාව මත ගෙවනු ලැබූ පිරිවැටුම් බද්ද අතර ඇති වෙනස මෙන් දෙගුණයකට සමාන මුදලක් ද ගෙවන ලෙස පළාත් කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලක් මගින් නියම කරනු ලැබිය හැකිය.

## IX වන පරිච්ඡේදය

## විශේෂ අවස්ථා, දණ්ඩන සහ වැරදි

අශක්නුතාවට පත් තැනැත්තකු විසින් ක්‍රියා කළ හැකි ද යන බව.

19. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, ඒ තැනැත්තා අශක්නුතාවට පත් තැනැත්තකු නම්, ඒ අශක්නුතාවට පත් තැනැත්තාගේ භාරකරු විසින් කරනු ලැබිය යුතුය.

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියා කළ යුතු බව.

20. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතුය.

එසේ වුව ද, හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දනුම්දීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තකු ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු නොවන බව හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් තැනැත්තකු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වන බව හෝ සනාථ කරන්නේ නම් මිස, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතුය.

සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් ප්‍රධාන නිලධාරියා ක්‍රියා කළ යුතු බව.

21. (1) සංස්ථාගත කළ හෝ සංස්ථා ගත නොකළ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, මේ පනත යටතේ කළ යුතු යයි නියමිත සියලු ක්‍රියා, කාරණා හෝ දේවල් සම්බන්ධයෙන්, ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමණාකරු, අධ්‍යක්ෂ හෝ වෙනත් ප්‍රධාන නිලධාරියකු වග කිව යුතුය.

එසේ වුවද යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමග තමන්ගේ කිසිදු සම්බන්ධතාවයක් නැති බව හෝ ශ්‍රී ලංකාවේ වාසික වෙනත් යම් තැනැත්තකු ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ප්‍රධාන නිලධරයා බව ඔප්පු කළහොත් මිස ඒ තැනැත්තා ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා ලෙස සලකනු ලැබිය යුතුය.

(2) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ

පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමණාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකු ම, ඒ වරද කර ඇත්තේ තමාගේ අනුදැනුම නොමැතිව බව සහ එම තනතුරේ තම කර්තව්‍යවල, ස්වභාවය සහ යෙදී ඇති වෙනත් සියලු කරුණු ගැන සැලකිලිමත්ව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියා කළ යුතු වූ පරිදි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියා කළ යුතු වූ ඔප්පු කරතහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

ව්‍යාපාරය අවසන් වන අවස්ථාවේදී පිරිවැටුම් බද්ද ගෙවීමේ වගකීම.

22. (1) පිරිවැටුම් බද්ද අය කරනු ලැබිය හැකි වූ තැනැත්තකු ඒ බද්ද අයකළ හැකි වනුයේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද, ඒ ව්‍යාපාරය යම් කාර්තුවක් අවසන් කරන අවස්ථාවක, ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාම ඔහු විසින් අවසන් කරනු ලැබ තිබුණ ද, ඒ කාර්තුව තුළ දී ඔහු ඒ ව්‍යාපාරය පවත්වාගෙන ගිය කාල සීමාව සඳහා මෙහි මින් මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව ඒ බද්ද ගෙවීමට ඔහු බැඳී සිටින්නේය.

(2) යම් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන යම් තැනැත්තකු විසින් ඒ ව්‍යාපාරය වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලබන අවස්ථාවක, ඒ පැවරුමට පෙරාතුව වූ කාල සීමාව සඳහා ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්ද පැවරුම්කරුගෙන් අයකර ගත නොහැකි නම් පැවරුම්ලාභී වෙත තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද පැවරුම්ලාභීන්ගෙන් එය අයකර ගත හැකි වන අතර, පිරිවැටුම් බද්ද එකතු කිරීම හෝ අයකර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

පිරිවැටුම් බද්ද ගෙවීමට පොල්මෑකරුවන් යටත් බව.

23. (1) පිරිවැටුම් බද්ද අය කළ හැකි වූ යම් තැනැත්තකු මිය ගිය අවස්ථාවක, ඒ තැනැත්තාගේ මරණය සිදුවීමට පෙරාතුව වූ සියලුම කාලසීමාවන් සම්බන්ධයෙන්, ඒ තැනැත්තා ජීවත්ව සිටියේ නම්, ඔහුගෙන් අයකළ හැකි වූ පිරිවැටුම් බද්ද ඒ තැනැත්තාගේ පොල්මෑකරුගෙන් අය කරනු ලැබිය යුතු වන අතර, ඒ මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් මේ ප්‍රඥප්තිය යටතේ

වගකිව යුතු වූ සියලු ක්‍රියා, කාරණා හා දේවල් සම්බන්ධයෙන් ඒ පොල්ම:කරු වගකිව යුතුය.

එසේ වුවද,

(අ) මිය ගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්ම:කරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතුය.

(ආ) ඒ තැනැත්තාගේ මරණය සිදු වූ දිනයට පෙරාතුව වූ කාල පරිච්ඡේදයන් සම්බන්ධයෙන් කිසිදු තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් මරණය සිදුවූ කාර්තුවේ අවසානයේ සිට තුන් අවුරුද්දකට පසුව කරනු නොලැබිය යුතුය.

(ඇ) මේ වගන්තිය යටතේ පොල්ම:කරුගේ වගකීම

(i) මේ වගන්තිය යටතේ පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් බැඳීම් පැන නගින බවට පොල්ම:කරුට දැන්වීම දෙනු ලබන දිනය වනවිට ඔහු සන්තකයෙහි හෝ ඔහුගේ පාලනයෙහි පැවති මිය ගිය තැනැත්තාගේ බුදලේ ප්‍රමාණයට; සහ

(ii) අර්ථලාභියකු අතට පත්ව තිබිය හැකි ඒ බුදලයේ යම් කොටසක ප්‍රමාණයට,

සීමා විය යුතුය.

(2) පොල්ම:කරුවකු විසින් මිය ගිය තැනැත්තකුගේ බුදලය වෙනුවෙන් ඒ බුදලයේ කොටසක් වන යම් ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන අවස්ථාවේ ඒ මිය ගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අය කර ගත හැකිව තිබුණු පිරිවැටුම් බද්ද, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන්, ඒ පොල්ම:කරුගෙන් අයකර ගනු ලැබිය යුතුය.

තමන්ට අයත් නොවන ව්‍යාපාර සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද ගෙවීම සඳහා ඇතැම් තැනැත්තන් සතු වගකීම.

24\. පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු යම් ව්‍යාපාරයක් යම් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඒ වෙනත් තැනැත්තාගේ අනුයෝජක වශයෙන් පවත්වා ගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් මෙහි පසුව සඳහන් කළ තැනැත්තාගෙන් අය කළ යුතුව තිබුණු ආකාරයට ම සහ ප්‍රමාණයට ම වූ පිරිවැටුම් බද්දක් පළමුව සඳහන් කළ තැනැත්තාගෙන් අයකර ගත යුතුය.

ඒකාබද්ධ අනුයෝජිතයන් භාරකරුවන් හා පොල්මඃකරුවන්.

25\. තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙන් හෝ මිය ගිය තැනැත්තකුගේ බූදලයේ පොල්ම:කරුවන්ගේ තත්ත්වයෙන් හෝ ක්‍රියා කරන අවස්ථාවක, මේ ප්‍රඥප්තිය යටතේ ඔවුන්ගෙන් අය කළ හැකි වන පිරිවැටුම් බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ඔවුන්ගෙන් අය කරනු ලැබිය හැකි වන අතර, ඒ බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ගෙවීමට ඔව්හු යටත් වෙති.

සමාගමක් ඈවර කිරීමේදී හෝ පුද්ගල මණ්ඩලයක් විසුරුවා හැරීමේදී පිරිවැටුම් බද්ද ගෙවි යුතු වන තැනැත්තන්.

26\. (1) සමාගම් ආඥාපනතේ කුමක් සඳහන් වුව ද සමාගමක් ඈවර කර වසා දමනු ලබන අවස්ථාවක දී ඒ සමාගම විසින් ගෙවිය යුතු වූ යම් පිරිවැටුම් බද්දක් අයකර ගත නොහැකි වූ විටක, බද්ද අය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව තුළ යම් කාලයක් සඳහා සමාගමේ අධ්‍යක්ෂවරයකුව සිටි සෑම තැනැත්තකුට, ඒ බද්ද ගෙවීම පැහැර හැරීම, සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දැඩි නොසැලකිල්ලක්, ව්‍යතික්‍රමයක් හෝ යුතුකම් පැහැර හැරීමක් නිසා නොවන බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා තනි තනිව වගකිව යුතු වන අතර, පිරිවැටුම් බද්ද එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

(2) පුද්ගල මණ්ඩලයක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක දී පුද්ගල මණ්ඩලය විසින් ගෙවිය යුතු වූ යම් පිරිවැටුම් බද්දක් අය කරගත නොහැකි වූ විටක, බද්ද අය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද, ඒ කාලසීමාව තුළ ඒ පුද්ගල මණ්ඩලයේ

සමාජිකයකු වූ සෑම තැනැත්තකුම, ඒ බද්ද ගෙවීම පැහැර හැරීම, ඒ මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ දැඩි නොසැළකිල්ලක්, ව්‍යතික්‍රමයක් හෝ යුතුකම් පැහැර හැරීමක් නිසා නොවන බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා තනි තනිව වගකිව යුතුවන අතර, පිරිවැටුම් බද්ද එකතු කර ගැනීම හා අය කර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

(3) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දේ ප්‍රමාණය අඩු කරන්නා වූ හෝ අඩු කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙනු ලැබිය හැකි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් කෘත්‍රිම බව හෝ ව්‍යාජ බව සහ යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඇත්ත වශයෙන් ම, ක්‍රියාත්මක කරනු නොලබන බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, එවැනි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඔහු විසින් නොසලකා හැරිය හැකිය.

මේ වගන්තියෙහි "බැහැර කිරීම" යන්නට යම් භාරයක්, ප්‍රදානයක්, ප්‍රතිඥාවක්, ගිවිසුමක්, හෝ සැකැස්මක් ඇතුළත් වේ.

තක්සේරුවල වලංගු භාවය.

27. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල යයි අදහස් කරනු ලබන යම් දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක් එහි සාරය හා බලපෑම අනුව මේ ප්‍රඥප්තියේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම් හෝ ගැලපේ නම් සහ එමගින් තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ එය බලපාන්නා වූ හෝ තැනැත්තා කවුරුන්දැයි පොදු අධ්‍යාශයට සහ වැටහීමට අනුව, එහි නම් කර තිබේ නම්, එහි ආකෘතියේ ඌණතාවක් හේතුවෙන් නිෂ්ප්‍රභාකරනු ලැබීම හෝ ශුන්‍ය ලෙස හෝ ශුන්‍ය කළ හැකි ලෙස සලකනු ලැබීම හෝ නොකළ යුතු අතර එහි ඇති යම් වරදකින්, දෝෂයකින් හෝ

අඩුපාඩුවකින් ඒ කිසිවක් කෙරෙහි බලපෑමක් නොසිදුවිය යුතුය.

(2) යම් තක්සේරුවක් පිළිබඳ දැන්වීම, අයකර ගැනීම අපේක්ෂා කරනු ලැබූ තැනැත්තා වෙත යථා පරිදි භාර දී ඇත්නම් සහ මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් විස්තරවල සාරය හා බලපෑම් ඒ දැන්වීමෙහි ඇත්නම්, (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක,

(අ) බදු අයකරනු ලැබීමට යටත් තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව හෝ පිරිවැටුම් ප්‍රමාණය පිළිබඳව හෝ අය කරනු ලැබූ පිරිවැටුම් බදු ප්‍රමාණය පිළිබඳව හෝ වරදක් තිබීම, හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳ දැන්වීම අතර යම් වෙනසක් තිබීම ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර එකී හේතුවක් ඊට විරුද්ධ නොවිය යුතුය.

ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය.

28. (1) කොමසාරිස් වරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ පළාත් රාජ්‍ය සේවයේ බදු අයකිරීමේ කටයුතු කරන යම් නිලධරයකු විසින් සාම නිලධරයකු සමග ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටු කළ හැකිය.

(අ) මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් නඩු කටුයත්තක් සඳහා ප්‍රයෝජන වන්නේ යයි හෝ ඊට අදාළ වන්නේ යයි ඔහු අදහස් කරන යම් ගිණුම් පොත්, ලේඛන වාර්තා හෝ වෙනත් ලියකියවිලි ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා සෝදිසි කිරීම සහ ඒවා සොයා ගනු ලැබුවහොත් ඒවා පරීක්ෂා කිරීම;

(ආ) එබඳු ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි තහනමට ගැනීම හෝ එහි හඳුනා ගැනීමේ ලකුණු තැබීම හෝ එයින් උධෘත හෝ පිටපත් ගැනීම;

(ඇ) මේ වගන්තිය යටතේ යම් සෝදිසියක් කිරීමේ දී සොයා ගනු ලැබූ මේ ප්‍රඥප්තිය

යටතෙහි වූ යම් නඩු කටයුතුවලට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි ඔහුට අදහස් වන, වෙනත් යම් දෙයක සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සෑදීම.

තවද, 1970 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම් වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ වූ සෝදිසි කිරීම් වලට අදාළ විය හැකි තාක් දුරට අදාළ විය යුතුය.

මේ උපවගන්තියේ "සාම නිලධරයා" යන්නෙහි අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිලධරයකුට බලය දීමට පෙර ඒ නිලධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම අවශ්‍යවීමට තුඩු දුන් කරුණු පළාත් කොමසාරිස්වරයා විසින් සටහන් ගත කළ යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ පළාත් කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් යම් තැනැත්තකුගේ තහනමට ගනු ලබන අවස්ථාවක, එසේ තහනමට ගනු ලැබ ඇති ඒ පොත, ලේඛනය, වාර්තාව, හෝ වෙනත් ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ නිලධරයා විසින් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතුය.

(4) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තහනමට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක් වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු පැවරීම සඳහා හෝ අවශ්‍ය විය හැකිතාක් කල් ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල ඒ නිලධරයා සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකිය.

යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් තම සන්තකයට ගනු ලබන අවස්ථාවක එම නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ පොත, ලේඛනය, වාර්තාව, හෝ ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතුය.

(3) යම් නිලධරයකු විසින් 1 වන උපවගන්තිය යටතේ තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් පරීක්‍ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා හෝ අවශ්‍ය විය හැකි තාක් කල් ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල ඒ නිලධාරියා සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකිය.

පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින්ම වවුචරය පිළියෙල කොට නිකුත් කළ යුතු බව

30. පිරිවැටුම් බද්ද අය කරනු ලැබිය හැකි සෑම තැනැත්තකු විසින් ම, තම ව්‍යාපාරය පවත්වා ගෙන යාමේදී තමා එළඹුණු එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන්-

(අ) ඒ ගණුදෙනුවට එළඹුණු දිනය;

(ආ) ඒ ගණුදෙනුවේ ස්වභාවය;

(ඇ) ඒ ගණුදෙනුව සම්බන්ධයෙන් ලැබුණු හෝ ලැබිය යුතු මුදල් ප්‍රමාණය සහ

(ඈ) ඒ ගණුදෙනුවට ඇතුලත් වූයේ යම් තැනැත්තකු සමග ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය

දක්වමින් වවුචරයක් පිළියෙල කිරීම හෝ පිළියෙල කිරීමට සැලැස්වීම හෝ කළ යුතුය. ඒ ගණුදෙනුවට එළඹුණේ යම්කිසි තැනැත්තකු සමග ද ඒ තැනැත්තාට ඒ වවුචරයේ මුල් පිටපත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඒ වවුචරය පිළියෙල කරන ලද්දේ යම්කිසි තැනැත්තකු විසින්ද, නැතහොත් යම්කිසි තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා විසින් ඒ වවුචරය පිළියෙල කරනු ලැබූ කාර්තුව ඉකුත්වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් ඒ වවුචරයේ පිටපත රඳවා තබා ගැනීම

හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතුය. තව ද මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද වෙනස් වෙනස් ව්‍යාපාරවල දී ගණුදෙනු වාර්තා කළ යුතු ආකාරය සහ ඒ සඳහා භාවිතා කළ යුතු ආකෘතියේ ආකාරය පළාත් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

ගණුදෙනු පිළිබඳ ලේඛනය.

31. (1) පිරිවැටුම් බද්ද අය කරනු ලැබිය හැකි සෑම තැනැත්තකු විසින්ම තම ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී තමා එළඹුණු ගණුදෙනු සම්බන්ධයෙන් එක් එක් කාර්තුව වෙනුවෙන් වූ ගණුදෙනු පිළිබඳ ලේඛනයක් තබා ගැනීම හා පවත්වා ගෙන යාම කළ යුතුය.

(2) යම් කාර්තුවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් තබා ගනු ලැබූ ගණුදෙනු පිළිබඳ ලේඛනය ඔහු විසින් එම කාර්තුව ඉකුත් වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් රඳවා තබා ගැනීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතුය.

රහස්‍යතාව කඩකිරීම් හා වෙනත් කාරණා වැරදි වන බව.

32. (අ) 102 වන වගන්තිය යටතේ රහස්‍යතාව පිළිබඳ දිවුරුම් දීමට නියමිත තැනැත්තකුව සිටිය දී එම දිවුරුම් නොදී මේ කොටස යටතේ කටයුතු කරන්නා වූ ; හෝ

(ආ)102 වැනි වගන්තියේ විධිවිධාන කඩකරමින් කටයුතු කරන්නා වූ හෝ

(ඇ)මේ කොටසේ විධිවිධාන වලින් කිසිවක් කඩ කරමින් කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ අනුබල දෙන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹ වන්නා වූ ; හෝ

සෑම තැනැත්තකු ම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

වංචා සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන

33. (අ) මේ කොටසේ විධිවිධාන අනුව අසනු ලැබූ යම් ප්‍රශ්නයකට හෝ තොරතුරු සපයන ලෙස කරනු ලැබූ ඉල්ලීමකට, වාචිකව හෝ ලිඛිතව යම් අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ ; හෝ

(ආ) මේ කොටස යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවක තමා විසින් ඇතුළත් කළ යුතුව තිබුණු යම් විස්තර ඒ වාර්තාවෙහි ඇතුළත් නොකර අත් හරින්නා වූ;

(ඇ) මේ කොටස යටතේ යම් අසත්‍ය වාර්තාවක් කරන්නා වූ හෝ මේ කොටස යටතේ සපයනු ලබන යම් වාර්තාවක් යම් අසත්‍ය සටහනක් කරන්නා වූ

සහ එමගින් පිරිවැටුම් බද්ද ගෙවීම මග හරින්නා වූ හෝ මග හැරීමට තැත් කරන්නා වූ හෝ ඒ බද්ද ගෙවීම මග හැරීමට හෝ මග හැරීමට තැත් කිරීමට වෙනත් යම් තැනැත්තෙකුට ආධාර කරන්නා වූ යම් තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට-

(i) වරද කරනු ලැබුවේ යම් කාර්තුවක් සම්බන්ධයෙන් ද නැතහොත් ඇතුළත ද ඒ කාර්තුව සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ එසේ සහාය දෙනු ලැබූ අන් තැනැත්තා හෝ මේ ප්‍රඥප්තිය යටතේ ගෙවීමට යටත් ව සිටින්නා වූ ද මග හැරියා වූ හෝ මග හැරීමට තැත් කළා වූ ද, බදු මුදල් ප්‍රමාණය මෙන් දෙගුණයකට සමාන මුදලකින් ; සහ

(ii) රුපියල් පන්දහසක් නොඉක්මවන මුදලකින්

සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතුය.

වාර්තා ආදියට අදාළ දණ්ඩන විධිවිධාන.

34. (අ) 10 වන වගන්තියේ හෝ 30 වන වගන්තියේ හෝ 31 වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ; හෝ

(ආ) 10 වන වගන්තිය හෝ 79 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමක නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ; හෝ

(ඇ) 10 වන වගන්තිය හෝ 79 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඉදිරියේ පෙනී සිට, ඒ නිලධරයා විසින් නීත්‍යානුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සැහෙන හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ ; හෝ

(ඈ) පිරිවැටුම් බද්දට තමා යටත් වීම හෝ වෙනත් යම් තැනැත්තකු යටත්වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම් සාවද්‍ය තොරතුරක් සපයන්නා වූ ; හෝ

(ඉ) 28 වන වගන්තිය හෝ 29 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයාට හෝ වෙනත් යම් නිලධරයකුට ඕනෑකමින් ම බාධා කරන්නා වූ හෝ කොමසාරිස්වරයා හෝ වෙනත් යම් නිලධරයකු ප්‍රමාද කරන්නා වූ ; හෝ

(ඊ) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට විරුද්ධව කටයුතු කිරීමට වෙන යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹ වන්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතුය.

වැරදි සමථයට පත් කිරීම.

35. 32 වන වගන්තිය, 33 වන වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ වූ යම් වරදක් කොමසාරිස්වරයා විසින් සමථයට පත් කළ හැකිය. තවද ඒ යටතේ වූ යම් නඩු කටයුත්තක් නඩු තීන්දුවට පෙර නතර කිරීම හෝ සමථයට පත් කිරීම ඔහු විසින් කළ හැකිය.

නඩු පැවරීම කොමසාරිස් වරයාගේ අනුමතය ඇතිව විය යුතු බව.

36. 32 වගන්තිය, 33 වන වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කොමසාරිස්වරයාගේ මෙහෙයවීමෙන් හෝ ඔහුගේ අනුමතය ඇතිව හෝ හැර, ආරම්භ කරනු නොලැබිය යුතුය.

## 2 වන කොටස

## X වන පරිච්ඡේදය

## මුද්දර ගාස්තු පැනවීම

මුද්දර ගාස්තු පැනවීම.

37. පහත දක්වෙන පරිදි, එනම් -

(අ) බස්නාහිර පළාතේ පිහිටි නිශ්චල දේපළ පැවරීමකට අදාළ සෑම සාධන පත්‍රයක් සඳහා;

(ආ) ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත තුළ නීතියෙන් පිහිටුවන ලද යම් අධිකරණයක පවරනු ලබන නඩු කටයුතු වල දී ඉදිරිපත් කරනු ලබන හෝ ගොනුගත කරනු ලබන සෑම ලේඛනයක් සඳහා;

(ඇ) බස්නාහිර පළාත තුළ දී මෝටර් රථයක අයිතිය පිළිබඳව කරනු ලබන සෑම පැවරීමක් සඳහා

නියමිත අනුප්‍රමාණවලට අනුකූලව මුද්දර ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය. විවිධ පන්තිවල හෝ වර්ගවල සාධන පත්‍ර සඳහා වෙනස් වෙනස් ගාස්තු අනුප්‍රමාණ නියම කරනු ලැබිය හැකිය.

වෙනස් කරුණු කීපයකට අදාළ සාධන පත්‍ර.

38. එකිනෙකට වෙනස් කරුණු කීපයකින් සමන්විත වන සේ එවැනි කරුණු කීපයකට අදාළ යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට ඒ එක් එක් කරුණ සඳහා වෙන වෙනම සාධන පත්‍රය බැගින් සකස් කරන ලද්දේ නම් ඒ එක් එක් සාධන පත්‍රය සඳහා අය කරනු ලැබිය යුතු මුද්දර ගාස්තුවේ එකතුවට සමාන මුද්දර ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය.

## XI වන පරිච්ඡේදය

## නිදහස් කිරීම්

නිදහස් කිරීම්

39. පහත දැක්වෙන සාධන පත්‍ර සහ ලේඛන මුද්දර ගාස්තුවෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(1) අපරාධ නඩුවල ඇප ඔප්පු;

(2) ආණ්ඩුව විසින් හෝ යම් තැනැත්තකු විසින් ආණ්ඩුව සඳහා නැතහොත් ආණ්ඩුව වෙනුවෙන් යම් නිශ්චල දේපළක් හෝ මෝටර් රථයක් පැවරීමේ හෝ විකිණීමේ;

(3) යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් අය කරනු ලැබිය යුතු මුද්දර ගාස්තුව, මෙයින් කරනු ලබන නිදහස් කිරීම නිසා නොවන්නට ආණ්ඩුව විසින් ගෙවිය යුතු වේද, ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුවේ නමට හෝ ලියාඅත්සන් කරනු ලබන එවැනි සාධන පත්‍රයක්,

(4) 76 (2) වන වගන්තිය යටතේ වූ නියමයන් බලපාන යම් රටක ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුවේ නමට ලියා අත්සන් කරනු ලබන සාධන පත්‍රයක්;

(5) නඩු කටයුතුවල දී ඉදිරිපත් කරනු ලබන පහත දැක්වෙන ලේඛන;

(අ) මහේස්ත්‍රාත් අධිකරණ වලදී සහ ප්‍රාථමික අධිකරණවලට ඉදිරිපත් කරනු ලබන සියලුම ලේඛන සහ අපරාධ නඩු කටයුතුවල කාර්යය සඳහා වෙනත් යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන;

(ආ) යම් අධිකරණයකදී තම නිල බලයෙන් රජයේ නිලධරයන් විසින් නඩු පැවරීමේදී, ඔවුන්ට විරුද්ධව නඩු පවරනු ලැබීමේදී හෝ මැදිහත් වීමේදී ඒ අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන ලේඛන;

(ඇ) යම් අධිකරණයක නඩු කටයුතුවලදී දිළින්දකු වශයෙන් නඩු පැවරීමට,

විත්තිවාචක ඉදිරිපත් කිරීමට හෝ මැදිහත් වීමට යථා පරිදි ඉඩ දෙන ලද තැනැත්තකු විසින් ඒ අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලබන ලේඛන;

(ඈ)වස්තු භංගත්වයට පත්වූවකු ලෙස ප්‍රකාශ කරවා ගැනීම සඳහා යම් අධිකරණයකින් ඉල්ලුම් කරන තැනැත්තකු විසින් ඒ අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලබන ලේඛන;

(ඉ)හබයාස්කෝපුස් රිට් ආඥාවක් සඳහා කරනු ලබන ඉල්ලීමක කාර්ය පිණිස යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන ලේඛන;

(ඊ)ජාතික රාජ්‍ය සභාවේ, 1978 අංක 27 දරන නීති ආධාර පනත යටතේ සපයනු ලබන නීති ආධාර උපයෝගි කරගෙන, නඩුවක් පවරා ඇති, නඩුවකදී විත්ති වාචක ඉදිරිපත් කරන හෝ නඩුවකදී මැදිහත් වන තැනැත්තකු ලෙස, ඒ පනත යටතේ අනුමත කර ඇති නීති ආධාර ක්‍රමයේ පරිපාලක නිලධාරියා විසින් සහතික කරනු ලැබ ඇති හෝ ඔහු විසින් විධිමත් ලෙස අනුමත කර ඇති යම් නිලධරයකු විසින් සහතික කරනු ලැබ ඇති තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් ගොනු කරනු ලබන සියළුම ලේඛන.

(උ)මෝටර් වාහනයකින් සිදු වූ මරණයක් හෝ අලාභයක් නිසා උද්ගතවන අලාභ ඉල්ලා සිටින යම් තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සියළු ලේඛන;

(ඌ)යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන මෝසම් ;

(එ)ඉල්ලීමක් මත හෝ අධිකරණයේ අභිමතය මත හෝ නිකුත් කරනු ලබන වරෙන්තු;

(6) නොතාරිස්වරයකු සහතික කළ හෝ අන්‍යාකාරයක අන්තිම කැමති පත්‍ර තෙස්තමේන්තු හෝ කොඩිසිල් පත්‍ර.

## XII වන පරිච්ඡේදය

## මුද්දර ගැසිය යුතු වේලාව සහ ආකාරය

මුද්දර ගාස්තු ගෙවිය යුතු වේලාව සහ ආකාරය.

40. (1) යම් සාධන පත්‍රයක් සඳහා අය කළ යුතු මුද්දර ගාස්තු ඒ සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට පෙර හෝ ලියා අත්සන් කරන වේලාවේදීම හෝ ගෙවනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තියෙන් අන්‍යාකාරයකට අවසරදී ඇතහොත් ඒ පරිදි හැර, ඒ ගෙවීම කර ඇති බව අලවන මුද්දර හෝ ලාංඡිත මුද්දර හෝ මෙහි (2) වන උපවගන්තියේ සඳහන් ගෙවීම් සහතිකයක් මගින් ඒ සාධන පත්‍රයෙහි දැක්විය යුතුය.

(2) නිශ්චල දේපළ පැවරීමකට අදාළ යම් සාධන පත්‍රයක් සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තු නියමිත බැංකුවකට ගෙවිය හැකි අතර ගෙවන ලද මුද්දර ගාස්තු ප්‍රමාණය සහ ඒ මුද්දර ගාස්තුව ගෙවන ලද දිනය දැක්වෙන සහතිකයක් ඒ බැංකුව විසින් නියමිත ආකෘතිය මගින් නිකුත් කළ යුතුය. තවද බැංකුව විසින් එසේ නිකුත් කරන ලද සහතිකය ඒ සාධන පත්‍රයෙහි අලවා තිබිය යුතුය. යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීමට පෙර හෝ ලියා අත්සන් කරන අවස්ථාවේදීම හෝ යම් බැංකුවකට ඒ ගෙවීම කිරීම, ඒ මුද්දර ගාස්තු ගෙවිය යුතු තැනැත්තාගේ පාලනයෙන් පරිබාහිර යම් හේතුවක් කරණකොට ගෙන ඒ තැනැත්තාට නොහැකි වන අවස්ථාවකදී, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත්ද ඒ නොතකා ඒ සාධන පත්‍රය ලියා අත්සන් කරන ලද දින සිට දින 7 ක් ඉකුත්වීමට පෙර ඒ ගාස්තුව ගෙවනු ලැබිය යුතුය. මුද්දර ගාස්තු ගෙවීම සඳහා වූ සහතිකය අලවා ඇති යම් සාධන පත්‍රයක් යථා පරිදි මුද්දර ගැසූ සාමාන්‍ය සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(3) යම් සාධන පත්‍රයක් සඳහා අයකළ යුතු මුද්දර ගාස්තු ගෙවූ බව දැක්වෙන සේ අලවන මුද්දර හෝ ලාංඡිත මුද්දර භාවිත කිරීම නැතහොත් ඉහත සඳහන් පරිදි බැංකුවක් වෙත ගෙවීම

ප්‍රායෝගික වශයෙන් අපහසු වන අවස්ථාවකදී, ඒ සාධන පත්‍රය සඳහා අයකළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුදලක් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබූ විට, එසේ ගෙවන ලද මුදල් ප්‍රමාණය සහ ගෙවීම් කළ දිනය ඒ සාධන පත්‍රය මත කොමසාරිස්වරයා විසින් පිටසන් කරනු ලැබිය හැකිය. එසේ පිටසන් කරනු ලැබූ සාධන පත්‍රයක් යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

අලවන මුද්දර අවලංගු කිරීම.

41. (1) යම් සාධන පත්‍රයක් සඳහා අයකළ යුතු මුද්දර ගාස්තුව ගෙවූ බව අලවන මුද්දර මගින් පෙන්නුම් කොට ඇති අවස්ථාවකදී, ඒ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තා හෝ තැනැත්තන් අතුරින් කවරකු හෝ විසින් ඒ මුද්දරය නැවත පාවිච්චි කිරීම වැළැක්වීම සඳහා ඒ මුද්දරය හරහා තම නම තීන්තෙන් ලියා කෙටි අත්සන යෙදීමෙන් ඒ මුද්දරය අවලංගු කරනු ලැබිය යුතුය.

(2) රුපියල් පනහක හෝ ඊට වැඩි වටිනාකමකින් යුතු අලවන මුද්දරයක් යම් සාධන පත්‍රයකට ගසා තිබේ නම්, (1) වන උපවගන්තියේ සඳහන් පරිදි එය හරහා ලිවීමට අමතරව කූරකින්, විදිනයකින්, කපනයකින්, තෙරපුම් උපකරණයක් මගින් කැපීමෙන් ද ඒ මුද්දරය අවලංගු කරනු ලැබිය යුතුය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවලින් දක්වා ඇති අකාරයට අවලංගු කොට නොමැති අලවන මුද්දරයක් ගසන ලද යම් සාධන පත්‍රයක් ඒ මුද්දරයේ වටිනාකමේ ප්‍රමාණයට මුද්දර නොගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

## XIII වන පරිච්ඡේදය

## ඇතැම් සාධන පත්‍රවල මුද්දර ගැසිය යුතු අන්දම

එකම මුද්දර ගාස්තුවක් සඳහා එක සාධන පත්‍රයක් විය යුතු බව.

42. ගාස්තු අය කළ යුතු සාධන පත්‍රයක් ලිවීමට එවකට භාවිතා කොට ගෙන තිබෙන මුද්දර ගැසූ කඩදාසියක් මත මුද්දර ගාස්තු අය කළ යුතු තවත් කිසිම සාධන පත්‍රයක් ලිවීම නොකළ යුතුය.

එසේ වුවද, යම් සාධන පත්‍රයකින් යම් අයිතියක් ඇති කරන ලද හෝ ඒ සාධන පත්‍රය ඒ අයිතිවාසිකමට සාක්ෂි දරන විටක, ඒ අයිතිවාසිකම පැවරීමේ කාර්යය සඳහා ඒ සාධන පත්‍රය මත හෝ යම් සාධන පත්‍රයකින් ගෙවීම ආරක්ෂා කොට ඇති මුදලක් හෝ භාරදීම ආරක්ෂා කොට ඇති බඩු ලැබුණු බව දැන්වීමේ කාර්යය සඳහා ඒ සාධන පත්‍රය මත හෝ යම් විනිමය පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් ගෙවීම සඳහා වූ කාලය දීර්ඝ කිරීමේ කාර්යය සඳහා යම් සාධන පත්‍රයක් මත හෝ නිසි පරිදි මුද්දර ගැසූ හෝ මුද්දර ගාස්තු අය නොකළ යුතු යම් පිටසනක් යෙදීම මේ වගන්තියේ ඇති කිසිවකින් නොවැළැක්විය යුතුය.

හුවමාරු කිරීම් වලට බලපාන සාධන පත්‍රවල මුද්දර ගැසිය යුත්තේ කෙසේද යන වග.

43. දේපළ හුවමාරු කිරීමකදී ඒ දේපළ හිමිකර දීමට හෝ පැවරීමේ සාධන පත්‍ර කීපයක් ඇති අවස්ථාවක, ඒ හුවමාරු කිරීම සඳහා අය කළ යුතු යම් මුද්දර ගාස්තුවක් තිබේ නම්, ඒ මුද්දර ගාස්තුවට සමාන මුද්දර පළමුව ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයේ ගැසිය යුතු අතර සෙසු සියලු සාධන පත්‍රවල, රුපියල් පහක් වූ මුද්දර ගාස්තුවට සමාන මුද්දර ගැසිය යුතුය.

එසේ වුවද, පළමු සාධන පත්‍රය ලියා අත්සන්කරනු ලැබූ දින සිට මාස තුනක කාලයකින් පසුව ලියා අත්සන් කරන ලද එවැනිම යම් තදනන්තර සාධන පත්‍රයකට මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන අදාළ නොවිය යුතුය.

43 අ. බස්නාහිර පළාත තුළ හෝ ශ්‍රී ලංකාවේ එක් පළාතක් හෝ ඊට වැඩි පළාත් සංඛ්‍යාවක් තුළ හෝ පිහිටි, යම් නිශ්චල දේපළක් හෝ නිශ්චල දේපළ පැවරීම සම්බන්ධයෙන් සාධන පත්‍රයක් අදාළ වන අවස්ථාවක, ඒ සාධන පත්‍රය වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර මේ ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා තිබෙන ආකාරයෙන් ඒ සාධන පත්‍රයේ ගසා තිබේ නම් හෝ ඒ සාධන පත්‍රය අදාළ වන නිශ්චල දේපළ හෝ නිශ්චල දේපළ කිහිපය අතුරින් යම් එක් දේපළක් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් පළාත් සභාවක බල

ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති විටක, ඒ පළාත් සභාවේ මුදල් ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා තිබෙන ආකාරයෙන්, ඒ සාධන පත්‍රය වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර ඒ සාධන පත්‍රයේ ගසා තිබේ නම්, බස්නාහිර පළාතේ පිහිටි ඒ ඉඩම හෝ ඉඩම් සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රයේ නිසි පරිදි මුද්දර ගසා ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

නඩු කටයුතුවල ලේඛන.

44. යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කරනු ලැබූ සහ මුද්දර ගාස්තු අය කළ යුතු සෑම ලේඛනයක්ම සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර මේ පනතින් විධිවිධාන සලසා ඇති ආකාරයට, ඒ ලේඛන ලැයිස්තුවට ගසා.වලංගු කර තිබේ නම්, ඒ ලේඛන නිසි පරිදි මුද්දර ගසනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

ඇතැම් සාධන පත්‍රවල අනු පිටපත්වල මුද්දර ගැසීම.

45. මුද්දර ගාස්තු අය කළ යුතු යම් සාධන පත්‍රයක් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ තමාගේ තනතුරේ කාර්ය ඉටු කිරීමේ දී පිස්කල්වරයකු ඉදිරියේ දී ලියා අත්සන් කරන ලද හෝ පිළිගන්නා ලද හෝ අවස්ථාවකදී ඒ සාධන පත්‍රය සඳහා අයකළ යුතු මුද්දර ගාස්තු මුල් සාධන පත්‍රය මත වෙනුවට, එහි අනුපිටපත හෝ ප්‍රතිරූපය මත අය කළ යුතු අතර, මුල් සාධන පත්‍රයෙහි රුපියල් එකක මුද්දරයක් ඇලිය යුතුය. නැතහොත් රුපියල් එකක මුද්දර ගාස්තුවක් 40 (2) වන වගන්තියේ සඳහන් කර ඇති ආකාරයෙන් නියමිත බැංකුවකට ගෙවිය යුතුය.

## XIV වන පරිච්ඡේදය

## මුද්දර ගාස්තු සමථයට පත් කිරීම

ගෙවිය යුතු මුද්දර ගාස්තු සමථයට පත් කිරීම.

46. (1) නීතියෙන් ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ අධිකරණයක නඩු කටයුතු වලදී ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද හෝ පවරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තු ද පහත දැක්වෙන කොන්දේසි මත සමථයට පත් කිරීමට ඒ අධිකරණයක යම් නිලධරයකුට කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලැබිය හැකිය:-

(i) අධිකරණයකට පවරනු ලැබූ නඩු කටයුතු වලදී ඉදිරිපත් කරන ලද ගොනුගත කරන ලද ලේඛනවල වාර්තාවක් ඒ නිලධාරියා විසින් පවත්වා ගෙන යා යුතු වීම:

(ii) කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් අවසානයේදී

(අ) ඒ නිලධරයා පත් කරනු ලැබ තිබෙන අධිකරණයේ පවරා තිබෙන සිවිල් හෝ අද්මිරාල්ති නඩු කටයුතු වල දී ඉදිරිපත් කරනු ලැබූ හෝ ගොනු ගත කරනු ලැබූ ලේඛන සඳහා; හෝ

(ආ) ඒ කාලපරිච්ඡේදය තුළදී යම් තැනැත්තකු විසින් කරන ලද සාධන සඳහා

ගෙවිය යුතු මුද්දර ගාස්තුවල එකතුව ඒ නිලධාරියා විසින් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතුවීම.

(2) නීතියෙන් ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ යම් අධිකරණයක පවරනු ලැබූ සිවිල් හෝ අද්මිරාල්ති නඩු කටයුතුවල දී ඉදිරිපත් කරනු ලැබූ හෝ ගොනුගත කරනු ලැබූ ලේඛනයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තු ද මේ වගන්තිය යටතේ සමථයට පත් කරනු ලැබූ අවස්ථාවක දී ඒ ලේඛන මත ගෙවිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය කවරේ ද යන්නත් මේ වගන්තිය යටතේ ඒ මුද්දර ගාස්තු ගෙවීම සමථයට පත් කර ඇති බවත් 1 වන උපවගන්තිය යටතේ බලය දෙනු ලැබූ ඒ අධිකරණයේ නිලධරයා විසින් ඒ ලේඛනයෙහි පිටසන් කළ යුතු අතර ඉන්පසුව, ඒ ලේඛනයේ නිසිපරිදි මුද්දර ගසා ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

## XV වන පරිච්ඡේදය

## නඩු කටයුතුවල ගොනු කරනු ලබන ලේඛනවලට අදාළ විශේෂ විධිවිධාන

සිවිල් නඩුවල වටිනාකම.

47. (1) (අ) නීතියෙන් පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් අධිකරණයක පවරනු ලැබූ නඩු කටයුතුවලදී, හෝ

(ආ) මහාධිකරණයේ පවරනු ලැබූ යම් අද්මිරාල්ති නඩු කටයුතුවල දී ,

ඉදිරිපත් කරනු ලබන හෝ ගොනු කරනු ලබන ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තු තීරණය කිරීමේ කාර්යය සඳහා, මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් අන්‍යාකාර විධිවිධාන සලසා තිබේ නම් හැර, ඒ නඩු කටයුතුවල වටිනාකම

(i) ඒ නඩු කටයුතුවල දී ඉල්ලා ඇති ණය මුදලේ ඉල්ලීම්වල හෝ අලාභවල ප්‍රමාණය විය යුතුය;

(ii) ඉඩම් සම්බන්ධ අයිතිවාසිකම්, හිමිකම් හෝ සම්බන්ධතා පිළිබඳ නඩු කටයුතුවල දී, ඒ ඉඩමේ වටිනාකම විය යුතුය.

(iii) මියගිය තැනැත්තකුගේ බූදලයට අදාළ හෝ ප්‍රොබේට් බලපත්‍රය අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, ඒ බූදලයේ ශුද්ධ වටිනාකම විය යුතුය.

(iv) වෙනත් යම් අවස්ථාවක දී නම්, රුපියල් පන්දහසක් විය යුතුය.

(2) යම් අධිකරණයක නඩු කටයුත්තක දී ගොනු කරනු ලබන ලේඛන සඳහා අය කළ යුතු සම්පූර්ණ මුද්දර ගාස්තුව, නඩු කටයුත්තේ එක් එක් පාර්ශවය විසින් ගොනු කරනු ලබන පළමු ලේඛන දහය සඳහා අය කළ යුතු සම්පූර්ණ මුද්දර ගාස්තුව නොඉක්මවිය යුතුය.

## XVI වන පරිච්ඡේදය

## මුද්දර ගාස්තුව සඳහා වටිනාකම තක්සේරු කිරීම.

මුද්දර ගාස්තුව සඳහා වටිනාකම තක්සේරු කිරීම.

48. (1) සාධන පත්‍රයක් මගින් යම් දේපළක් හිමි කර දෙනු ලබන අවස්ථාවක, හිමි කර දෙනු ලබන දේපළෙහි වටිනාකම අනුව, ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් අය කළ යුතු මුද්දර ගාස්තුව ගණන් බැලිය යුතුය.

(2) ප්‍රතිඥාවක් මත පවරනු ලබන යම් දේපළක් යම් උකසකට, බැඳීමකට හෝ සම්බන්ධතා වෙන් කර තැබීමකට යටත්වන අවස්ථාවක,

පැවරුම් සාධන පත්‍රය සම්බන්ධයෙන් අය කළ යුතු මුද්දර ගාස්තුව, ඒ උකස බැඳීම හෝ වෙන් කර තැබීම පිළිබඳව යම් අඩුකිරීමක් නොකර, විකුණනු ලබන දේපළෙහි

වටිනාකම

අනුව ගණන් බැලිය යුතුය.

(3) ත්‍යාගදායකයාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ වාසියට කරනු ලබන යම් රඳවා ගැනීමකට යටත්ව, යම් දේපළක් ත්‍යාග කරනු ලබන අවස්ථාවක, ත්‍යාග සාධන පත්‍රය සම්බන්ධයෙන් අය කළ යුතු මුද්දර ගාස්තුව, ඒ දේපළ ඒ රඳවාගැනීම නොමැතිව ත්‍යාගලාභියා වෙත ත්‍යාග කරන ලද විටක මෙන්, ඒ දේපළෙහි වටිනාකම මත ගණන් බැලිය යුතුය.

49. ශ්‍රී ලංකාවේ මුදල් නොවන වෙනත් යම් මුදල් වර්ගයකින් ප්‍රකාශිත මුදලක් සම්බන්ධයෙන් වූ සාධන පත්‍රයක් සඳහා මුද්දර ගාස්තු අය කළ යුතුව ඇති අවස්ථාවක දී ඒ සාධන පත්‍රයෙහි සඳහන් දිනයේදී ඇති විනිමය අනුපාතය ප්‍රමාණයට අනුකූලව ඒ මුදලට සමානව ගණන් බලනු ලබන ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රමාණය අනුව මුද්දර ගාස්තු ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් අය කරනු ලැබිය යුතුය.

ගාස්තු ගෙවීම වළක්වාලීම සඳහා සාධන පත්‍ර කිහිපයක් සකස් කිරීම.

50. යම් නිශ්චල දේපළක් හෝ ඉන් යම් කොටසක් සාධන පත්‍ර කිහිපයක් මගින් කැබලි වශයෙන් එකම තැනැත්තා වෙත හිමි කර දෙනු ලැබූ හෝ පවරනු ලැබුවාවූ ද, ඒ සාධන පත්‍ර කිහිපය මගින් හිමි කර දෙනු ලැබූ හෝ පවරනු ලැබූ සම්පූර්ණ දේපළ එකම සාධන පත්‍රයක් මගින් නම් කර දෙනු ලැබුවේ නම් හෝ පවරනු ලැබුවේ නම් අය කළ හැකිව තිබූ මුද්දර ගාස්තුව ගෙවීම වලක්වාලීමේ චේතනාව ඇතිව එසේ සාධන පත්‍ර කිහිපයක් ලියා අත්සන් කරනු ලැබ ඇති බව තක්සේරුකරුට පෙනී යන්නා වූ ද අවස්ථාවක, ඒ සාධන පත්‍ර එවැනි චේතනාවක් ඇතිව ලියා අත්සන් නොකරන ලද බව තමා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන ලෙස ඔහු විසින් ඒ සාධන පත්‍රවල පාර්ශවකරුවනට නියම කරනු ලැබිය හැකි අතර, එවැනි සාධන ඉදිරිපත් කරනු නොලැබුවේ නම් හෝ ඉදිරිපත් කරන ලද සාධන

ප්‍රමාණවත් නොවේ නම් හෝ එකී සියලුම සාධන පත්‍ර සම්බන්ධයෙන් අය කළ යුතු මුද්දර ගාස්තුවල මුළු ප්‍රමාණය ඒ සාධන පත්‍රය මගින් හිමිකර දෙන සහ පවරන ලද මුළු ඉඩම් ප්‍රමාණය එසේ හිමි කිරීම සඳහා සහ පැවරීම සඳහා එක සාධන පත්‍රයක් පමණක් ලියා අත්සන් කරන ලද නම් අය කළ යුතුව තිබුණ මුද්දර ගාස්තුව මෙන් එකහමාරකට සමාන වන ලෙස ගණන් බලා එක් එක් සාධන පත්‍රයෙහි හිමි කර දෙන ලද සහ පවරන ලද දේපළ කොටසේ සමානුපාතික වටිනාකම අනුව ඒ එක් එක් සාධන පත්‍රය සම්බන්ධයෙන් මුද්දර ගාස්තු අය කළ යුතුය.

## XVII වන පරිච්ඡේදය

## මුද්දර ගාස්තු ගෙවීමට බැඳී සිටින තැනැත්තෝ

මුද්දර ගාස්තු ගෙවිය යුත්තේ කවුරුන් විසින්ද යන වග.

51. මීට පටහැනි යම් ගිවිසුමක් තිබෙන අවස්ථාවක හැර, මුද්දර ගාස්තුව -

(අ) පැවරීමේ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ප්‍රදානලාභියා විසින්ද,

(ආ) වෙනත් යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ඒ සාධන පත්‍රය සකස් කරන, සාදන හෝ ලියා අත්සන් කරන තැනැත්තා විසින්ද,

ගෙවිය යුතුය.

මුද්දර ගාස්තු සම්බන්ධයෙන් වෙනත් පාර්ශවකරුවන්ගේ බැඳීම.

52. (1) මුද්දර ගාස්තු අය කළ යුතු යම් සාධන පත්‍රයක් පළාත තුළ ලියා අත්සන් කරනු ලැබ හෝ පළාත තුළ පිහිටි යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් ලියා අත්සන් කරනු ලැබ ඇත්තා වූ ද ඒ සාධන පත්‍රයෙහි නිසි පරිදි මුද්දර අලවා නොමැත්තා වූද අවස්ථාවක දී ඒ සාධන පත්‍රය ලියා අත්සන් කරන සෑම තැනැත්තකුම, ඒ ගාස්තු ප්‍රමාණය ද ඒ ගාස්තු නොගෙවීම නිසා ගෙවිය යුතු වන යම් දණ්ඩනයක් ද කොමසාරිස්වරයා වෙත ගෙවීමට බැඳී සිටින්නේය.

(2) යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තු සහ දණ්ඩනයක් වේනොත්, එය ද ගිවිසුමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ 51 වන වගන්තිය යටතේ ඒ සාධන

පත්‍රය වෙනුවෙන් මුද්දර ගාස්තුව ගෙවීමට බැඳී සිටින තැනැත්තා නොවන යම් තැනැත්තකුගෙන් කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ලබා ගන්නා ලද විට, එසේ ලබා ගනු ලැබූ ගාස්තුවේ ප්‍රමාණය සහ දණ්ඩනයක් වේතොත්, එය ද පළමුව සඳහන් කරන ලද තැනැත්තාගෙන් ලබාගැනීමට දෙවනුව සඳහන් කරන ලද තැනැත්තාට අයිතිවාසිකම ඇත්තේය.

(3) 51 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන බලාත්මක විය යුතුය.

(4) යම් මියගිය තැනැත්තකු ජීවත්ව සිටියේ නම්, මේ ප්‍රඥප්තිය යටතේ කිරීමට ඔහු යටත් වන සියලු ක්‍රියා, කරුණු සහ දේවල් කිරීමටද, ඒ මිය ගිය තැනැත්තා ජීවත් ව සිටියේ නම්, ඔහු පාර්ශ්වකරුවකු වන සියලුම සාධන පත්‍ර සම්බන්ධයෙන් ඔහුගෙන් අය කළ යුතු මුද්දර ගාස්තු ගෙවීමට ද ඒ මියගිය තැනැත්තාගේ බූදලයේ පොල්මෑකරු බැඳී සිටින්නේය. එසේ වුවද -

(i) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්මෑකරුට විරුද්ධව කිසිම නඩුවක් නොපැවරිය යුතුය.

(ii) මේ උපවගන්තිය යටතේ පොල්මෑකරුවකුගේ බැඳීම-

(අ) මේ උපවගන්තිය යටතේ මුද්දර ගාස්තුව පිළිබඳ බැඳීමක් ඇතිවන බවට තමා වෙත දැනුම්දුන් දිනයෙහිදී, තමාගේ සන්තකයේ හෝ පාලනයේ පවත්නා මිය ගිය තැනැත්තාගේ බූදලයට; සහ

(ආ) අර්ථලාභියකු වෙත ලැබී ඇති බූදලයේ යම් කොටසකට සීමා විය යුතුය.

සමාගම ගණන් බේරා වසා දැමූ

53. (1) 1982 අංක 17 දරන සමාගම් පනතේ කුමක් සඳහන් වී තිබුණ ද, යම් පෞද්ගලික

විට, ඇති වන බැඳීම.

සමාගමක් වසා දමනු ලැබුවා වූ ද මුද්දර ගාස්තු වශයෙන් යම් මුදලක් ගෙවීමට එම සමාගමේ ඇති බැඳීම, ඒ සමාගම ඈවර කිරීමට පෙර, ඈවර කරනු ලබන අතරතුර හෝ ඈවරකිරීමෙන් පසුව වුව ද ඒ මුදල අයකර ගත නොහැකි වන්නා වූ ද අවස්ථාවක, ඒ ගාස්තුව ගෙවීම සඳහා සමාගමේ බැඳීම ඇති වූ කාල සීමාව තුළ කවර හෝ විටක දී සමාගමේ අධ්‍යක්ෂවරයකුව සිටි සෑම තැනැත්තකුම විසින් සමාගමේ කටයුතුවලට අදාළව ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී ඇති වූ දැඩි නොසැලකිල්ල හෝ බලය අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ කාර්ය නොකර හැරීම හෝ හේතු කොටගෙන ඒ මුදල ගෙවීම පැහැර හැරීම සිදු නොවූ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ මුදල ගෙවීම සම්බන්ධයෙන් ඒ තැනැත්තා තනි තනිව හා වෙන් වෙන්ව බැඳී සිටිය යුතුය.

(2) මේ වගන්තියේ "පෞද්ගලික සමාගම" යන යෙදුමට 1982 අංක 17 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම ඇත්තේය.

## XVIII වන පරිච්ඡේදය

## සාධන පත්‍ර තහනමට ගැනීම

සාධන පත්‍ර තහනමට ගෙන පරීක්ෂා කිරීම සඳහා ඇතැම් නිලධරයන් සතු බලය

54. (1) සාක්ෂි භාර ගැනීමට නීතියෙන් හෝ පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත ප්‍රකාර හෝ බලය ඇති සෑම තැනැත්තකුම විසින් සහ ( පොලිස් නිලධරයකු නොවන ) රජයේ කාර්යාලයක යම් නිලධරයකු වෙත සහ රාජ්‍ය සංස්ථාවක හෝ බැංකුවක හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක යම් නිලධරයකු විසින්, ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී මුද්දර ගාස්තු අය කළ යුතු යයි ඔහු අදහස් කරන සාධන පත්‍රයක් ඔහු ඉදිරියට පමුණුවනු ලැබූ විටක හෝ ඔහුට ලැබුණු විටක ඒ සාධන පත්‍රයෙහි විධිමත් ලෙස මුද්දර අලවා නොමැති බව ඔහුට පෙනී ගිය හොත් ඔහු විසින් ඒ සාධන පත්‍රය තහනමට ගත යුතුය.

එසේ වුව ද යම් මහේස්ත්‍රාත්වරයකු වෙත හෝ අපරාධ අධිකරණයක විනිශ්චයකාරවරයකු වෙත ඒ අධිකරණයේ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කරනු ලබන යම් සාධන පත්‍රයක් තහනමට ගැනීම හෝ පරීක්ෂා කිරීම හෝ සුදුසු නොවන බව ඔහු සලකන්නේ නම්, ඔහු විසින් එසේ තහනමට ගනු ලැබීම හෝ පරීක්ෂා කරනු ලැබීම මේ වගන්තියේ ඇති කිසිවකුන් අවශ්‍ය කරන ලෙස නොසැලකිය යුතුය.

(2) මුද්දර ගාස්තු අය කළ යුතු සාධන පත්‍රයක්, තම කර්තව්‍යය ඉටු කිරීමේදී, රජයේ කාර්යාලයක හෝ සංස්ථාවක හෝ බැංකුවක හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක යම් නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ පමුණුවනු ලැබූ විටක:-

(අ) ඒ සාධන පත්‍රයේ නිසි පරිදි මුද්දර අලවා තිබේදැයි නිශ්චය කිරීම සඳහා එය පරීක්ෂා කිරීමට,

(ආ) ඒ සාධන පත්‍රය තහනමට ගැනීමට කොමසාරිස්වරයා විසින් ඒ නිලධරයාට නියම කරනු ලැබිය හැකිය.

(3) යම් සාධන පත්‍රයක් පරීක්ෂා කිරීමට හෝ තහනමට ගැනීමට (2) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ සාධන පත්‍රය, අවස්ථාවෝචිත පරිදි තහනමට ගැනීම හෝ පරීක්ෂා කිරීම සහ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන යම් වැඩිදුර පියවර ගැනීම ඒ තැනැත්තාගේ කාර්යය වන්නේය.

(4) කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, යම් රජයේ කාර්යාලයක, සංස්ථාවක හෝ බැංකුවක හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක ඇති යම් සාධන පත්‍රයක නිසි පරිදි මුද්දර අලවා තිබේදැයි නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒ රජයේ කාර්යාලය, සංස්ථාව හෝ බැංකුව හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනය භාර යම් තැනැත්තකු වෙත නිසි පරිදි දැනුම් දීමකින් පසුව, ඒ සාධන

පත්‍රය ඒ කාර්යාලයේ දී සංස්ථාවේදී, හෝ ණය දෙන නියෝජ්‍යායතනයේදී පරීක්ෂා කර බැලිය හැකි අතර ඒ සාධන පත්‍රයේ මුද්දර අලවා නොමැති නම් එය තහනමට ගනු ලැබිය හැකිය.

තහනමට ගන්නා ලද සාධන පත්‍ර කොමසාරිස්වරයා වෙත යැවිය යුතු බව.

55. (1) සාක්ෂි භාර ගැනීමට නීතියෙන් හෝ පාර්ශ්වකරුවන් ගේ කැමැත්ත ප්‍රකාර බලය ඇති යම් තැනැත්තකු විසින් හෝ රෙජිස්ට්‍රාර්ජනරාල්වරයා විසින් හෝ 60 වන වගන්තියේ අතුරු වගන්තියේ විධිවිධානවලට අනුකූලව, යම් සාධන පත්‍රයක් සාක්ෂිවලදී පිළිගනු ලබන හෝ ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ සාධන පත්‍රය දෙනු ලබන තැනැත්තාගේ වියදමින් සපයනු ලබන, ඒ සාධන පත්‍රයේ සත්‍යයනය කරන ලද පිටපතක් ද, ඒ සම්බන්ධයෙන් අය කරනු ලැබූ මුද්දර ගාස්තුවේ සහ දණ්ඩනයේ මුදල් ප්‍රමාණය දැක්වෙන ලිඛිත සහතිකයක්ද කොමසාරිස්වරයා වෙත යැවිය යුතු අතර ඒ මුදල් ප්‍රමාණය ද කොමසාරිස්වරයා වෙත යැවිය යුතුය.

(2) වෙනත් සෑම අවස්ථාවක දීම, සාධන පත්‍රයක් එසේ තහනමට ගන්නා තැනැත්තා විසින් එහි මුල් පිටපත කොමසාරිස්වරයා වෙත යැවිය යුතුය.

අහම්බෙන් නිසි පරිදි මුද්දර නොගැසූ සාධන පත්‍ර ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කිරීම.

56. රුපියල් දෙකකට නොවැඩි මුද්දර ගාස්තුවක් අය කළ යුතු සාධන පත්‍රයක් නොවන, මුද්දර ගාස්තු අය කළ යුතු වූ ද නිසි පරිදි මුද්දර ගසනු නොලැබුවා වූද යම් සාධන පත්‍රයක් එය ලියා අත්සන් කරන ලද දිනයේ සිට එක් අවුරුද්දක් ඇතුළත යම් තැනැත්තකු විසින් සිය මෙහෙයීමෙන් ම තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් හෝ ඒ සාධන පත්‍රයෙහි නිසි පරිදි මුද්දර නොගසා ඇති බව ඒ තැනැත්තා විසින් ඒ තක්සේරුකරුට දැනුම් දෙනු ලැබුවහොත් සහ නිසි ගාස්තු ප්‍රමාණය හෝ ගාස්තු ප්‍රමාණය සම්පූර්ණ වීමට අවශ්‍ය මුදල තක්සේරුකරුට ගෙවීමට ඉදිරිපත් වුවහොත් සහ ඒ සාධන

පත්‍රයෙහි මුද්දර ගැසීම නොකර හැර ඇත්තේ අහම්බෙන්, වැරදීමකින් හෝ හදිසි හේතුවක් නිසා බවට තක්සේරුකරු සෑහීමට පත්වුවහොත්, ඔහු විසින්, සාධන පත්‍රය තහනමට ගැනීම වෙනුවට, ඒ මුදල භාර ගත හැකි අතර ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් අය කළ යුතු නියම මුද්දර ගාස්තු ප්‍රමාණය ගෙවූ බව එහි කරනු ලබන පිටසන් මගින් දැක්විය යුතුය.

තහනමට ගන්නා ලද සාධන පත්‍ර සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් ක්‍රියා කළ යුතු බව.

57. (1) රුපියල් දෙකක ගාස්තුවක් අය කළ යුතු සාධන පත්‍රයක් නොවන යම් සාධන පත්‍රයක්, කොමසාරිස්වරයා විසින් 54 වන වගන්තිය යටතේ තහනමට ගනු ලබන හෝ 55 (2) වන වගන්තිය යටතේ භාර ගනු ලබන අවස්ථාවක, ඔහු විසින් එය තක්සේරුකරුවකු වෙත යොමු කළ යුතු අතර, ඒ තක්සේරුකරු විසින් ඒ සම්බන්ධයෙන් පහත දක්වෙන ක්‍රියා පරිපාටිය අනුගමනය කළ යුතුය.

(අ) ඒ සාධන පත්‍රයෙහි නිසි පරිදි මුද්දර ගසා තිබෙන බව හෝ ඒ සඳහා මුද්දර ගාස්තු අය කළ යුතු නොවන බව ඔහුගේ මතය වුවහොත්, ඔහු විසින් අවස්ථාවෝචිත පරිදි, එය නිසි පරිදි මුද්දර ගසා ඇති බවට හෝ ඒ සඳහා එසේ ගාස්තුවක් අය කළ යුතු නොවන බවට එහි කරනු ලබන පිටසන් මගින් සහතික කළ යුතුය.

(ආ) ඒ සාධන පත්‍රය සඳහා මුද්දර ගාස්තු අය කළ යුතුව තිබුණ බවත්, නිසි පරිදි එහි මුද්දර නොගසා ඇති බවත් ඔහුගේ මතය වුවහොත් ඔහු විසින් නියම මුද්දර ගාස්තුවේ මුදල මෙන් තෙගුණයක් නොඉක්මවන දණ්ඩනයක් ද සමග නියම මුද්දර ගාස්තුව හෝ ගාස්තුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රමාණයට හෝ ගෙවන ලද මුද්දර ගාස්තුව ගෙවීමට බැඳී සිටින තැනැත්තාට ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතුය.

(2) එවැනි යම් සාධන පත්‍රයක් සඳහා නියම මුද්දර ගාස්තු ප්‍රමාණය ගෙවනු ලැබ ඇත්තා වූ ද එහෙත් ඒ සාධන පත්‍රය ලියා අත්සන්

කරනු ලැබූ ක්‍රමයෙහි යම් අක්‍රමිකතාවයක් නිසා හෝ නීතියෙන් නියමිත වේලාවේ දී එහි මුද්දර ගසා නොතිබූ නිසා එය තහනමට ගනු ලැබුවා වූ ද අවස්ථාවක. ඒ අක්‍රමිකතාව අහම්බෙන් වැරදීමක් හෝ හදිසි හේතුවක් නිසා සිදු වූවක් බවට තක්සේරුකරු සෑහීමට පත්වුවහොත්, රුපියල් පන්සියයකට නොවැඩි දඩයක් ගෙවනු ලැබූ කල්හී සාධන පත්‍රයෙහි නිසි පරිදි මුද්දර ගසා ඇති බවට ඔහු විසින් එහි කරනු ලබන පිටසන් මගින් කරනු ලැබිය හැකි අතර, එසේ පිටසන් කරනු ලැබූ සෑම සාධන පත්‍රයක් ම, එය ලියා අත්සන් කරනු ලැබූ දින පටන් නිසි පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

ගාස්තු ගෙවනු ලැබූ සාධන පත්‍රයක් පිටසන් කිරීම.

58. (1) යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් 56 වන වගන්තිය යටතේ ගෙවිය යුතු හෝ 57(1)(ආ) වගන්තිය යටතේ වූ දැන්වීමක් ප්‍රකාර ගෙවිය යුතු හෝ 60 වන වගන්තිය යටතේ ගෙවිය යුතු මුද්දර ගාස්තු ද දණ්ඩනයක් වේතොත් එය ද ගෙවනු ලැබූ හෝ ලබා ගනු ලැබූ අවස්ථාවක, තක්සේරුකරු හෝ සාක්ෂියේ දී ඒ සාධන පත්‍රය පිළිගනු ලබන හෝ ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කරන හෝ තැනැත්තා විසින් -

(i) ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් නියම මුද්දර ගාස්තුව සහ දණ්ඩනය ගෙවනු ලැබූ;

(ii) ඒවා ගෙවන තැනැත්තාගේ නම සහ ලිපිනය; සහ

(iii) ගෙවූ දිනය

එහි කරනු ලබන පිටසනක් මගින් සහතික කළ යුතුය.

එම සහතිකය, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා, එහි දක්වන ලද කරුණු පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් වන්නේය.

(2) (1) වන උපවගන්තියට අනුකූලව පිටසන් කරනු ලැබූ සෑම සාධන පත්‍රයක් ම නිසි පරිදි මුද්දර ගසා ඇති සාධන පත්‍රයක් ලෙස සළකනු ලැබිය යුතු අතර, සාක්ෂි

වල දී පිළිගනු ලැබිය යුතුය. තව ද එහි එසේ මුද්දර ගසා ඇති විටක මෙන්, එය ලියාපදිංචි කිරීම ද, ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කිරීම ද එය සත්‍යයනය කිරීම ද කළ යුතු අතර එය තහනමට ගත් නිලධරයාට එය ලැබුනේ යම් තැනැත්තකුගේ සන්තකයේ තිබිය දී ද, ඒ තැනැත්තාගේ ඉල්ලීම පිට, ඔහු වෙත ආපසු යැවිය යුතුය.

යවන ලද සාධන පත්‍ර නැතිවීම සම්බන්ධයෙන් වගකීමක් නැති බව.

59. (1) 55 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත යවන ලද යම් සාධන පත්‍රයක් සම්ප්‍රේෂණයේ දී නැති වුවහොත්, විනාශ වුවහොත් හෝ පලුදු වුවහොත් එය යවන තැනැත්තා ඒ නැතිවීම, විනාශවීම හෝ පලුදු වීම සම්බන්ධයෙන් වගකීමට නොබැඳෙන්නේය.

(2) යම් සාධන පත්‍රයක් එසේ යැවීම සඳහා සූදානම් කොට තිබෙන විට, එය තහනමට ගත් තැනැත්තාට එය ලැබුනේ යම් තැනැත්තකුගේ සන්තකයේ තිබිය දී ද, තම වියදමින් ඒ සාධන පත්‍රයේ පිටපතක් සකස් කරන ලෙස එය තහනම් කළ තැනැත්තා විසින් අනෙක් තැනැත්තාට නියම කළ හැකි අතර,ඉන්පසු පිටපත සත්‍යයනය කරනු ලැබිය හැකිය.

## XIX වන පරිච්ඡේදය

## සාධන පත්‍ර පිළිගැනීම

සාධන පත්‍ර පිළිගැනීම.

60. මුද්දර ගාස්තු අය කළ යුතු කිසිම සාධන පත්‍රයක නිසි පරිදි මුද්දර ගසනු ලැබ තිබේනම් මිස ඒ සාධන පත්‍රය සාක්ෂි භාර ගැනීමට නීතියෙන් හෝ පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත ප්‍රකාර බලය ඇති යම් තැනැත්තකු විසින් සාක්ෂියේ දී භාර ගැනීම හෝ පිළිගැනීම හෝ එවැනි යම් තැනැත්තකු විසින් හෝ රජයේ කාර්යාලයක හෝ සංස්ථාවක හෝ බැංකුවක හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක යම් නිලධරයකු විසින් හෝ ලියාපදිංචි කිරීම හෝ සත්‍යයනය කිරීම හෝ ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කිරීම හෝ නොකළ යුතුය.

එසේ වුව ද, එවැනි සාධන පත්‍රයක් සඳහා අයකළ යුතු නියම මුද්දර ගාස්තුව හෝ එම ගාස්තුව සම්පූර්ණවීම සඳහා අවශ්‍ය මුදල සහ එම ගාස්තුවෙහි තුන් ගුණයක් නොඉක්මවන දඩ මුදලක් ද ගෙවනු ලැබූ විට,

(අ) සාක්ෂි පිළිගැනීමට නීතියෙන් හෝ පාර්ශවකරුවන්ගේ කැමැත්ත ප්‍රකාර බලය ඇති යම් තැනැත්තකු විසින් සාක්ෂියේදී ඒ සාධන පත්‍රය පිළිගනු ලැබීම හෝ;

(ආ) ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව රුපියල් පන්දහසක් හෝ ඊට අඩු ගණනක් නම්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් බලය ලබා දෙනු ලැබූ යම් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු හෝ යම් සහකාර රෙජිස්ට්‍රා! ජනරාල්වරයකු විසින් ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කරනු ලැබීම කළ හැකිය.

ඇතැම් අවස්ථාවලදී කුවිතාන්සි පිළිගැනීම.

61. මුද්දර ගසන ලද කුවිතාන්සියක් දීමට නියම වී ඇති යම් තැනැත්තකු විසින් මුද්දර ගසා නැති කුවිතාන්සියක් දී ඇති අවස්ථාවක, ඒ කුවිතාන්සියේ මුද්දර ගසා තිබේ නම්, එය ඔහුට විරුද්ධව සාක්ෂි ලෙස පිළිගැනීමට හැකි නම් 60 වන වගන්තියේ කුමක් සඳහන් වී තිබුණ ද ඒ කුවිතාන්සිය ඉදිරිපත් කරන තැනැත්තා විසින් රුපියල් පහක් වූ දණ්ඩන මුදලක් ගෙවූ විට ඒ කුවිතාන්සිය මුලින් සඳහන් තැනැත්තාට විරුද්ධව සාක්ෂි ලෙස පිළිගත යුතුය.

## XX වන පරිච්ඡේදය

## මුද්දර ගාස්තු නිශ්චය කිරීම

හිසි මුද්දර ගාස්තු හිශ්චය කිරීම.

62. ලියා අත්සන් කරනු ලැබූ හෝ නොලැබූ සහ කලින් මුද්දර ගසන ලද හෝ එසේ නොගසන ලද යම් සාධන පත්‍රයක්, එහි පිටපතක් ද සමග තක්සේරුකරුවකු වෙත ගෙන එනු ලැබූ අවස්ථාවක සහ ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුවක් වේ නම්, ඒ පිළිබඳව තක්සේරුකරුගේ මතය දැන ගැනීම සඳහා ඒ සාධන පත්‍රය රැගෙන එන තැනැත්තා විසින් අයදුම් කරනු ලැබූ සහ රුපියල් දෙසිය පනහක

ගාස්තුවක් ගෙවනු ලැබූ අවස්ථාවක තක්සේරුකරුගේ මතය අනුව ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු යම් මුද්දර ගාස්තුවක් වේ නම් එය ඔහු විසින් තීරණය කළ යුතු අතර, තම තීරණය ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

63. තම මතය ප්‍රකාශ කිරීමේ කාර්යය සඳහා සාධන පත්‍රය සඳහා මුද්දර ගාස්තු අය කළ යුතු වීම හෝ එය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුවේ ප්‍රමාණය හෝ සම්බන්ධයෙන් අදාළ කරුණු ඔප්පු කිරීම සඳහා අවශ්‍ය වන යම් ලේඛනයක් හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස තක්සේරුකරු විසින් සාධන පත්‍රය රැගෙන එන තැනැත්තාට නියම කළ හැකිය.

එසේ වුවද, එවැනි සාක්ෂි සපයන සෑම තැනැත්තකුම විසින්, ඒ සාක්ෂි අදාළ වන සාධන පත්‍රය සඳහා අය කළ යුතු සම්පූර්ණ මුද්දර ගාස්තුව ගෙවූ විට, ඉහත සඳහන් සිද්ධි හෝ අවස්ථානුගත කරුණු ඒ සාධන පත්‍රයේ සත්‍ය ලෙස ප්‍රකාශ කිරීම ඔහු විසින් පැහැර හැරීමේ හේතුව නොවන වෙනත් හේතුවක් නිසා මේ පනත යටතේ ඔහු යටත්ව ඇති යම් දණ්ඩනයකින් ඔහු මුදා හරිනු ලැබිය යුතුය.

තක්සේරුකරුගේ පිටසන.

64. (1) 62 වන වගන්තිය යටතේ තමා වෙත ගෙන එනු ලැබූ යම් සාධන පත්‍රයක් සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව ගෙවනු ලැබ ඇති බවට හෝ ඒ සාධන පත්‍රය සඳහා මුද්දර ගාස්තු අයකළ යුතු නොවන බවට තක්සේරුකරු විසින් ඒ සාධන පත්‍රය මත පිටසනකින් සහතික කළ යුතුය.

(2) මේ වගන්තිය යටතේ පිටසනක් කරනු ලැබූ යම් සාධන පත්‍රයක්, අවස්ථාවෝචිත පරිදි නිසි පරිදි මුද්දර ගසන ලද හෝ මුද්දර ගාස් අය කළ යුතු නොවන හෝ සාධන පත්‍රය් ලෙස සැලකිය යුතු අතර ඒ සඳහා මුද්ද් ගාස්තු අය කළ යුතු නම්, එය සාක්ෂි වලදී හෝ වෙනත් අවස්ථාවල, දී පිළිගත යුතු. තවද එහි මුලින් නිසි පරිදි මුද්දර ගසනු ලැබූ විටක මෙන්, ඒ පිළිබඳව ක්‍රියා කරා ලැබීම සහ එය ලියාපදිංචි කිරීම කරනු ලැබිය හැකිය.

එසේ වුවද:-

(අ) ශ්‍රී ලංකාවේ දී ලියා අත්සන් කරන ලද හෝ පළමුවෙන් ලියා අත්සන් කරන ලදුව අවස්ථාවෝචිත පරිදි, එසේ ලියා අත්සන් කිරීමේ හෝ පළමුවෙන් ලියා අත්සන් කිරීමේ දින සිට එක් මාසයක් ඉකුත් වීමෙන් පසු, තමා වෙත ගෙන එනු ලැබූ යම් සාධන පත්‍රයක; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරන ලද හෝ පළමුවෙන් ලියා අත්සන් කරන ලදුව, එය ශ්‍රී ලංකාවට පළමුවෙන්ම ලැබී එක් මාසයක් ඉකුත්වීමෙන් පසු තමා වෙත ගෙන එනු ලැබූ යම් සාධන පත්‍රයක; හෝ

පිටසනක් කිරීමට මේ වගන්තියේ ඇති කිසිවකින් තක්සේරුකරුට බලය නොපැවරෙන්නේය.

## XXI වන පරිච්ඡේදය

## මුද්දර සඳහා දීමනා

පාවිච්චි නොකරන ලද හා නරක් වූ මුද්දර සඳහා දීමනා.

65. (1) කොමසාරිස්වරයා වෙත (2) වන උපවගන්තියේ සඳහන් කාලය ඇතුළත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත සහ ඔහු ඒ කරුණු පිළිබඳ සෑහීමකට පත් වීමෙන් පසු, පාවිච්චි නොකරන ලද හෝ නරක් වූ මුද්දර සඳහා ඔහු විසින් පහත දැක්වෙන අවස්ථාවල දී දීමනාවක් දිය හැකිය.

(අ) මුද්දරයක් , අනවධානයෙන් හෝ අනභිප්‍රායෙන් නරක් වී, එය පාවිච්චි කිරීමට අපේක්ෂිත කාර්යය සඳහා නුසුදුසු වූ අවස්ථාවක; හෝ

(ආ) මුද්දරයක් යම් අසම්පූර්ණ සාධන පත්‍රයක හෝ ලියා අත්සන් නොකරන ලද සාධන පත්‍රයක හෝ ශුන්‍ය සාධන පත්‍රයක ගසා ඇති අවස්ථාවක හෝ යම් වැරැද්දක් නිසා මුද්දරයක් අපේක්ෂිත කාර්යය සඳහා නුසුදුසු වූ බව පෙනී ගිය අවස්ථාවක; හෝ

(ඇ) පසුව නිසි පරිදි මුද්දර ගසන ලද සාධන පත්‍රයකින් ප්‍රතියෝජනය කරන ලද යම් සාධන පත්‍රයක වැරදි වර්ගයකට අයත් හෝ වැරදි වටිනාකමකින් යුක්ත මුද්දරයක් අනවධානයෙන් හෝ අනභිප්‍රායෙන් ගසන ලද අවස්ථාවක් ; හෝ

(2) (1) වන උපවගන්තිය යටතේ දීමනා ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක්, පාවිච්චි නොකරන ලද හෝ නරක් වූ මුද්දර මිල දී ගත් දින සිට එක් වර්ෂයක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ දීමනා ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් ලැබුණු විට, කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරුට ඒ වර්ගයේම හා ඒ වටිනාකමින් යුත් මුද්දර දීම හෝ ඒ මුද්දරවල වටිනාකම මුදලින් ගෙවීම හෝ කරනු ලැබිය හැකි අතර, ඔහු විසින් ඒ මුද්දරවල වටිනාකම මුදලින් ගෙවනු ලබන විටක, සෑම රුපියලක්ම සඳහා හෝ ඉන් යම් කොටසක් සඳහා ශත පහක් අඩුකර ගත යුතුය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා, "මුද්දර" යන්නෙහි, ඇලෙන මුද්දර, ලාංඡිත මුද්දර හෝ 40 (2) වන වගන්තියේ සඳහන් මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳ සහතිකයක් ඇතුළත් වේ.

## XXII වන පරිච්ඡේදය

## වැරදි සහ දණ්ඩන

නිසි පරිදි මුද්දර නොගැසූ සාධන පත්‍ර ලියා අත්සන් කිරීම ආදිය සඳහා දණ්ඩනය.

66. (1) යම් තැනැත්තකු -

(අ) මුද්දර ගාස්තු අයකළ යුතු යම් සාධන පත්‍රයක් නිසි පරිදි මුද්දර නොගසා සාක්ෂිකරුවකු වශයෙන් හැර, අත්සන් කළහොත්; හෝ

(ආ) 41 වන වගන්තියෙන් නියම කර ඇති පරිදි අලවන මුද්දර අවලංගු කිරීම පැහැර හැරියහොත්,

ඔහු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ

පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

(2) නීත්‍යානුකූල බලයක් නොමැතිව, යම් මුද්දරයක් හෝ අච්චුවක් සාදන හෝ නිෂ්පාදනය කරන හෝ සෑදීමට නැතහොත් නිෂ්පාදනය කිරීමට කවර අකාරයකින් වුව ද ආධාර කරන හෝ එසේ සාදනු ලැබූ නැතහොත් නිෂ්පාදනය කරනු ලැබූ යම් මුද්දරයක් හෝ අච්චුවක් තම සන්තකයේ තබාගෙන සිටින කවර වුවද තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "මුද්දර" යන්නෙහි, ඇලෙන මුද්දර, ලාංජිත මුද්දර, හෝ 40 (2) වන වගන්තියේ සඳහන් මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳ සහතිකයක් ඇතුළත් වේ.

මහජන නොතාරිස්වරුන් විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම.

67. 78 වන වගන්තියෙන් මහජන නොතාරිස්වරයකු වෙත පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම දැන දැනම පැහැර හරින යම් මහජන නොතාරිස්වරයකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන්නකු වන අතර, මහේස්ත්‍රාත් වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට, ඒ වරද කරන ලද්දේ යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් ද ඒ සාධන පත්‍රය සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුව සහ රුපියල් පන්දහසක් යන මුදලට නොවැඩි දඩයකින් හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම හෝ ඔහුට දඬුවම් කරනු ලැබිය යුතුය.

සභාවට වංචා කිරීම සඳහා දණ්ඩනය.

68. යම් තැනැත්තකු විසින් :-

(අ) 79 වන වගන්තිය ප්‍රකාර සඳහන් කිරීමට නියමිත සිද්ධි කරුණු හා අවස්ථානුගත කරුණු සියල්ල සම්පූර්ණයෙන් සඳහන් කර නොමැති යම් සාධන පත්‍රයක් පළාත් සභාවට වංචා කිරීමේ චේතනාවෙන් සකස් කිරීම, සහතික කිරීම හෝ ලියා අත්සන් කිරීම කරනු ලැබුවහොත් ; හෝ

(ආ) තමා ලියා අත්සන් කළ, සත්‍යයනය කළ හෝ සහතික කළ යම් සාධන පත්‍රයක් සඳහා මුද්දර ගාස්තුව ගෙවීම පිණිස යම් මුදල් ප්‍රමාණයක් භාර ගැනීමෙන් පසු, ඒ මුද්දර ගාස්තුව ගෙවීමට ඒ මුදල නොයොදවනු ලැබුවහොත් හෝ ඒ මුදල හෝ ඉන් යම් කොටසක් අනිසි ලෙස තමාළඟ තබා ගනු ලැබුවහොත් හෝ රඳවා ගනු ලැබුවහොත්; හෝ

(ඇ) යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීමේ දී හෝ සත්‍යයනය කිරීමේ දී, හෝ සහතික කිරීමේදී නිර්ව්‍යාජ නොවන හෝ කලින් පාවිච්චි කරන ලද මුද්දරයක් ඒ සාධන පත්‍රයට ගැසුවහොත්, හෝ ඒ සාධන පත්‍රයෙහි යොදා අලවංගු කිරීමට සැලැස්වුවහොත්; හෝ

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ යම් ගාස්තුවක් හෝ දණ්ඩනයක් පළාත් සභාවට අහිමි කිරීමට සැලසුම් කැරෙන වෙනත් යම් ක්‍රියාවක් කළ හොත්; හෝ

(ඉ) කොමසාරිස්වරයා විසින් 54(2) වන වගන්තිය යටතේ ඔහු වෙත පනවනු ලැබූ යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුවහොත්, හෝ

(ඊ) 54(4) වන වගන්තියෙන් කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයාට ප්‍රතිරෝධය පෑම හෝ බාධා කිරීම කරනු ලැබුවහොත්,

ඒ තැනැත්තා මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත් වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට:-

(i) ඉහත (අ) අනුඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තා විසින් තමා ළඟ තබා ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද මුද්දර ගාස්තුවට සමාන මුදලකින් සහ රුපියල් පන්දහසකට නොවැඩි මුදලකින් සමන්විත වන දඩයකට:

(ii) ඉහත (ඇ) අනුඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට ඒ තැනැත්තා විසින් ගසන ලද හෝ අවලංගු කරන ලද මුද්දරවල වටිනාකම මෙන් දස ගුණයකට සමාන මුදලකින් සහ රුපියල් පන්දහසක් නොඉක්මවන මුදලකින් සමන්විත වන දඩයකට;

(iii)(අ) හෝ(ඇ)හෝ(ඉ) හෝ (ඊ) අනුඡේද යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට, හෝ ඒ සෑම අවස්ථාවක දීම මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතුය.

මේ වගන්තියේ කාර්ය සඳහා, "මුද්දර" යන්නෙහි, ඇලෙන මුද්දර, ලාංඡිත මුද්දර හෝ 40 (2) වන වගන්තියේ සඳහන් මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳ සහතිකයක් ඇතුළත් වේ.

69. 73 (8) වන වගන්තිය යටතේ තමාට දෙන ලද දැන්වීමක අඩංගු නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

දණ්ඩන ආදිය සඳහා යම් නඩු කටයුත්තක් තිබුණ ද, මුද්දර ගාස්තු ප්‍රමාණය හෝ දඩය ගෙවිය යුතුබව.

70. මේ කොටස යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩුවක් පවරා තිබීම නිසා හෝ එවැනි යම් වරදක් සඳහා දණ්ඩනයක් දඩයක් හෝ බන්ධනාගාරගත කිරීමක් යම් තැනැත්තකුට නියම කර තිබීම නිසා, මේ ප්‍රඥප්තිය යටතේ ඒ තැනැත්තා විසින් සිදු කරන ලද හෝ

සිදු කරනු ලැබිය හැකි යම් මුද්දර ගාස්තුවක් ගෙවීමේ වගකීමෙන් ඒ තැනැත්තා නිදහස් නොවන්නේය.

නඩු පැවරීම

71. මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් සඳහා නඩුවක් පැවරීම කොමසාරිස්වරයාගේ අනුමතය නොමැතිව නොකළ යුතුය.

සමථයකට පත්කිරීමට කොමසාරිස්වරයාට ඇති බලය.

72. සිදුකරන ලද වරදට අදාළ ව්‍යවස්ථානුගත කරුණු සැළකිල්ලට ගෙන, මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් කොමසාරිස්වරයා විසින් සමථයකට පත් කරනු ලැබිය හැකි අතර, නඩු තීන්දුවට පෙර, යම් නඩු කටයුතු නතර කිරීම හෝ සමථයට පත් කිරීම ඔහු විසින් කරනු ලැබිය හැකිය.

## XXIII වන පරිච්ඡේදය

### සාමාන්‍ය කරුණු

දැන්වීමක් අත්සන් කිරීම භාරදීම සහ එහි වලංගු භාවය.

73. (1) මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස්වරයා විසින් හෝ තක්සේරුකරුවකු විසින් දෙනු ලැබිය යුතු සෑම දැන්වීමකම, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම සඳහන් විය යුතු අතර කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම යථා පරිදි එවැනි දැන්වීමක මුද්‍රණය කොට හෝ අත්සන් කොට තිබේ නම් ඒ දැන්වීම වලංගු එකක් වන්නේය.

(2) මේ ප්‍රඥප්තිය ප්‍රකාර දෙන ලද සෑම දැන්වීමක්ම , යම් තැනැත්තකු වෙත පෞද්ගලිකවම භාර දීමෙන් හෝ ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටියේ යැයි දැනගැනීමට ඇති ස්ථානයට හෝ ඔහු තම ව්‍යාපාරය පවත්වාගෙන යන හෝ පවත්වාගෙන ගිය ස්ථානයට භාරදීමෙන් හෝ තැපැල් මගින් යැවීමෙන් හෝ භාර දෙනු ලැබිය හැකිය.

(3) තැපෑලෙන් යවනු ලබන යම් දැන්වීමක්, එය තැපෑලෙන් සාමාන්‍යයෙන් ලැබිය හැකි දිනයට පසු දිනයේදී භාර දෙන ලද ලෙස සලකනු ලැබිය යුතුය.

(4) තැපැල් මගින් භාර දෙන ලද බව ඔප්පු කිරීමේදී, දැන්වීම අඩංගු ලිපිය යථා පරිදි ලිපිනය ලියා තැපැල් කරන ලද බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වේ.

(5) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා දෙන ලද හෝ නිකුත් කරන ලද යම් දැන්වීමක මුද්‍රණය කරනු ලැබූ හෝ අත්සන් කරනු ලැබූ සෑම නමක්ම හෝ එසේ දෙන ලද හෝ නිකුත් කරන ලද සහතිකයක කරනු ලැබූ සෑම අත්සනක්ම, එය දීමට හෝ නිකුත් කිරීමට බලය දෙන ලද තැනැත්තාගේ යයි සලකනු ලබන්නේ නම් ඒ නම සඳහා අධිකරණ සැළකිල්ල ලැබිය යුතුය.

(6) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලයයි සලකනු ලබන දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කෘත්‍යයක් එහි සාරය සහ ඵලය අනුව මේ ප්‍රඥප්තියේ අරමුණුවලට සහ අර්ථයට අනුකූල වන්නේ නම් හෝ සැලකෙන්නේ නම් සහ ඒ දැන්වීම හෝ සහතිකය දෙනු ලබන හෝ දෙනු ලැබීමට අදහස් කරනු ලබන හෝ එය බලපාන තැනැත්තා කවරේ දැයි පොදු අධ්‍යාශයට හා අවබෝධයට අනුව එහි සඳහන් කොට තිබේ නම්, ආකෘතියේ අඩුපාඩුවක් හේතුකොට ගෙන, එය නිශ්ප්‍රභා වේ යයි හෝ අවලංගු යයි හෝ අවලංගු කරනු ලැබිය හැකි යයි හෝ, එහි අඩංගු යම් වරදක්, දෝෂයක් හෝ අතහැරීමක් හේතු කොට ගෙන ඊට බලපෑමක් ඇති වේ යයි නොසැලකිය යුතුය.

(7) මෙහි (6) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව ගාස්තු අය කරනු ලැබූ තැනැත්තා වෙත යම් දැන්වීමක් යථා පරිදි භාර දෙනු ලැබ තිබේ නම්, ගාස්තු අය කළ යුතු තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව යම් වරදක් ඒ දැන්වීමේ හෝ තක්සේරුවේ තිබීමේ හේතුව නිසා ඒ දැන්වීම හෝ තක්සේරුව දෝෂාභිරෝපනයට පත් කිරීමක් හෝ ඒ කෙරෙහි බලපෑමක් හෝ නොවිය යුතුය.

තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලය.

(8) (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පහත දැක්වෙන පරිදි යම් තැනැත්තකු වෙත ලිඛිතව දැනුම් දෙන දැන්වීමක් කොමසාරිස්වරයා විසින් හෝ නියෝජ්‍ය

කොමසාරිස්වරයා විසින් හෝ තක්සේරුකරුවකු විසින් දෙනු ලැබිය හැකිය.

(i) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය තුළ දී එය තමන් වෙත ඉදිරිපත් කරන ලෙස හෝ ප්‍රේෂණය කරන ලෙස;

(ii) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් තොරතුරක් සපයන ලෙස;

(iii) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් දිනයක දී සහ වේලාවක දී එසේ සඳහන් ස්ථානයට තමාම පැමිණ සිටින ලෙස හෝ තමා වෙනුවෙන් බලය දෙනු ලැබූ නියෝජිතයකු එවන ලෙස.

(2) යම් තොරතුරක් සපයන ලෙස නියම කරමින් (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත දැන්වීමක් බාර දෙනු ලැබූ අවස්ථාවක දී, එවැනි තොරතුරු සැපයීම තහනම් කරන වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද ඒ නොතකා ඒ තැනැත්තා විසින් යටකී නියමයනට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(3) (2) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ දැන්වීමකට අනුකූලව පැමිණෙන යම් තැනැත්තකු විසින් එසේ පැමිණීම සඳහා යුක්ති සහගත ලෙස දරනු ලැබූ වියදම් කොමසාරිස්වරයා විසින් ඔහුට ගෙවනු ලැබිය හැකිය.

(4) මේ වගන්තියේ "තැනැත්තා" යන්නට බැංකුකරුවකු ද ඇතුළත් වේ.

දණ්ඩන සම්බන්ධයෙන් අභිමතය පාවිච්චි කිරීම.

74. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකු විෂයෙහි පනවනු ලැබිය යුතු යම් දණ්ඩනයක මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් අභිමතය පාවිච්චි කිරීම කොමසාරිස්වරයා හෝ තක්සේරුකරු වෙත පවරා ඇති අවස්ථාවකදී, ඒ දණ්ඩනය නියම කරනු

ලැබීමට හේතු වූ සියලූ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්වරයා හෝ තක්සේරුකරු විසින් ඒ අභිමතය පාවිච්චි කළ යුතුය.

මුද්දර ගාස්තු හෝ දණ්ඩන ගෙවන තැනැත්තන් විසින් ඇතැම් අවස්ථා වල දී ඒ ගාස්තු හෝ දණ්ඩන ආපසු ලබාගත හැකි බව.

75. (1) යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් යම් මුද්දර ගාස්තුවක් හෝ දණ්ඩනයක් ගෙවනු ලැබ ඇත්තා වූ සහ එකහත්වයක් නිසා හෝ මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ හෝ වෙනත් යම් තැනැත්තකු ඒ සාදන පත්‍රය සම්බන්ධයෙන් මුද්දර ගාස්තුව ගෙවීමට යටත් වන අවස්ථාවක, එසේ ගෙවන ලද මුද්දර ගාස්තුව හෝ දණ්ඩන මුදල ඒ වෙනත් තැනැත්තාගෙන් ලබා ගැනීමට පළමුවෙන් සඳහන් කරන ලද තැනැත්තාට හිමිකම ඇත්තේය.

(2) එසේ ලබා ගැනීමේ කාර්යය සඳහා,සහතිකයෙහි සඳහන් තැනැත්තා විසින් සාධන පත්‍රය සම්බන්ධයෙන් වූ මුද්දර ගාස්තුව ගෙවා ඇති බවට කොමසාරිස්වරයාගේ අත්සන යටතේ වූ සහතිකයක් එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සහතිකයක් විය යුතුය.

නියමයන්.

76. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින්, ඒ නියමයේ සඳහන් වන සාධන පත්‍රවලට මුද්දර ගැසීම සඳහා ඒ නියමයේ විස්තර කොට ඇති මුද්දර පාවිච්චි කළ යුතු බව නියම කරනු ලැබිය හැකි අතර, එවැනි සාධන පත්‍ර සඳහා මුද්දර ගාස්තු ගෙවීම පිණිස එසේ විස්තර කොට ඇති මුද්දර නොවන වෙනත් මුද්දර යම් තැනැත්තකු විසින් පාවිච්චි කිරීම නීත්‍යානුකූල නොවන්නේය.

(2) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි නමට හෝ යම් රටක දී ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් ඒ රටේ දී කිසිම මුද්දර ගාස්තුවක් අය නොකරන බවට අමාත්‍යවරයා සෑහීමට පත් වූ විටක, ඒ රටේ ආණ්ඩුව විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි නමට

ලියා අත්සන් කරනු ලබන සාධන පත්‍රයක් සම්බන්ධයෙන් 39 වන වගන්තියේ 4 වන ඡේදයෙන් ප්‍රදානය කරන ලද නිදහස් කිරීම, අදාළ විය යුතු බව, ශ්‍රී ලංකාණ්ඩුව විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කළ හැකිය.

නියෝග.

77. (1) අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

(අ) නියම කළ යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති හෝ බලය දී ඇති යම් කරුණක්

(ආ) ලාංඡිත මුද්දර මගින් මුද්දර ගාස්තුව ගෙවනු ලැබිය හැකි වන යම් සාධන පත්‍ර

(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැළකිය යුතු අතර, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතුය. නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

පැවරීමේ පත්‍රවලට බලපාන කරුණු.

78. (1) මුද්දර ගාස්තුව අය කළ යුතු යම් සාධන පත්‍රයක් ලියන, සාදන, ලියා අත්සන් කරන හෝ සහතික කරන සෑම තැනැත්තකුම, එම සාධන පත්‍රයේ පාර්ශ්වකරුවන්ගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන්, ප්‍රතිෂ්ඨාව, ගෙවීමේ දිනය හා ක්‍රමය සහ ඒ සාධන පත්‍රයට මුද්දර ගාස්තුව ගෙවීම කෙරෙහි බලපාන වෙනත් සියලු කරුණු සහ අවස්ථානුගත කරුණු ද, ඒ සම්බන්ධයෙන් අය කළ යුතු මුද්දර

ගාස්තුවේ ප්‍රමාණය ද එහි දැක්විය යුතුය.

(2) පැවරුම් සාධන පත්‍රයක් සහතික කරන සෑම මහජන නොතාරිස්වරයකු විසින්, එසේ කිරීමට පෙර, මුද්දර ගාස්තුව ගෙවනු ලබන්නේ යම් වටිනාකමක් මත ද ඒ වටිනාකම පවරනු ලබන දේපළෙහි වටිනාකම වන බවට සෑහීමට පත්වීම සඳහා සියලු යුක්තිසහගත පියවර ගත යුතුය.

(3) ඇලෙන මුද්දර භාවිතා කරනු ලබන යම් සාධන පත්‍රයක් සහතික කරන සෑම මහජන නොතාරිස්වරයකුම විසින්, ඒ සාධන පත්‍රයට නියමිත විස්තරයෙන් සහ වටිනාකමින් යුක්ත මුද්දර ඇලවිය යුතු අතර මේ ප්‍රඥප්තියෙහි විධාන කරනු ලැබ ඇති ආකාරයට ඒවා අවලංගු කොට ඒ සාධන පත්‍රයෙහි ඇලවූ මුද්දර ගණන සහ ඒවායේ වටිනාකම ඔහුගේ සහතික කිරීමෙහි සඳහන් කළ යුතුය.

(4) යම් සාධන පත්‍රයක් වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුව 40 (2) වන හෝ 40 (3) වන වගන්තියේ දක්වා ඇති ආකාරයට ගෙවා ඇති අවස්ථාවක, බැංකුව විසින් 40 (2) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ගෙවීම පිළිබඳ සහතිකය විධිමත් පරිදි ඒ සාධන පත්‍රයේ අනුපිටපතට අලවා ඇති බව හෝ 40 (3) වන වගන්තියේ දක්වා ඇති ආකාරයෙන් කොමසාරිස්වරයා විසින් ඒ සාධන පත්‍රය පිටසන් කරනු ලැබ ඇති බව ඒ සාධන පත්‍රය සහතික කරන මහජන නොතාරිස්වරයා විසින් ඒ සහතිකයේ සහතික කළ යුතුය.

(5) මේ ප්‍රඥප්තිය යටතේ මුද්දර ගාස්තු අයකළ යුතු සහ 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන යටතේ හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ හෝ 1991 ජනවාරි මස 01 වන දින සිට 1991 ජුලි මස 31 වන දින දක්වා වූ කාලසීමාව තුළ විධිමත් ලෙස මුද්දර ගසන ලද යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් නිසිපරිදි මුද්දර ගසන ලද සාධන පත්‍රයක් හෝ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතුය.

## 3 වන කොටස

## XXIV වන පරිච්ඡේදය

### අභියාචන

පළාත් කොමසාරිස් වරයා වෙත අභියාචන ඉදිරිපත් කිරීම.

79. (1) පළාත් තක්සේරුකරුවකු විසින් යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරනු ලැබූ තක්සේරුවකින් හෝ අතිරේක තක්සේරුවකින් හෝ මේ ප්‍රඥප්තියේ 1 වන කොටස යටතේ පනවනු ලැබූ යම් දණ්ඩනයකින් හෝ 62 වන වගන්තිය යටතේ දෙනු ලැබූ මත ප්‍රකාශයකින් හෝ 2 වන කොටසේ 57(1) (ආ) වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ තක්සේරුවට, අතිරේක තක්සේරුවට, දණ්ඩනයට, මතයට හෝ නියමයට විරුද්ධව අභියාචනයක්, ඒ තක්සේරුව, අතිරේක තක්සේරුව, දණ්ඩනය මතය හෝ නියමය පිළිබඳ දැන්වීම තමාට ලැබී දින තිහක් ඇතුළත දී කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය. ඒ අභියාචනය තීරණය කිරීම පොරොත්තුවෙන් පිරිවැටුම් බද්ද හෝ මුද්දර ගාස්තුව හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවීම නතර කළ යුතු බවට කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබුවහොත් මිස, ඒ තැනැත්තා විසින්, ඔහුගේ අභියාචනය ගැන නොතකා, ඒ තක්සේරුවෙන් , අතිරේක තක්සේරුවෙන් හෝ මතය මගින් හෝ නියම කරනු ලැබූ නැතහොත් පනවනු ලැබූ පිරිවැටුම් බද්ද හෝ මුද්දර ගාස්තුව මේ ප්‍රඥප්තියෙන් ඒ මත පනවනු ලැබූ යම් දණ්ඩනයක් ද සමග ගෙවිය යුතුය. කොමසාරිස්වරයා විසින් ඉහත සඳහන් පරිදි වූ නියමයන් කරනු ලැබූ විට, නවත්වනු ලැබූ පිරිවැටුම් බද්ද, මුද්දර ගාස්තුව හෝ, එහි යම් කොටසක් හිඟ තබා ඇති සේ නොසලකනු ලැබිය යුතුය.

එසේ වුව ද, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, රෝගාතුර වීම, හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා, නියමිත කාල පරිච්ඡේදය තුළදී අභියාචනය කිරීමට අභියාචකට

නොහැකි වී තිබුණු බවට කොමසාරිස්වරයා සෑහීමකට පත්වුවහොත්, අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය කොමසාරිස්වරයා විසින් දීර්ඝ කරනු ලැබිය හැකිය.

(2) සෑම අභියාචනයක් ම කොමසාරිස්වරයා අමතා ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ඉදිරිපත් කළ යුතු අතර, ඒ අභියාචනයට හේතු අඩුලුහුඩුවක් නොමැතිව එහි සඳහන් කර තිබිය යුතුය.

(3) තක්සේරුව හෝ අතිරේක තක්සේරුව කර ඇත්තේ වාර්තාවක් නොසැපයීමේ හේතුවෙන් වන අවස්ථාවක දී යථා පරිදි සකස් කරන ලද වාර්තාවක් ද සමග අභියාචන පෙත්සම ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(4) (1) (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන සෑම අභියාචන පෙත්සමක්ම වලංගු එකක් නොවන්නේය.

(5) වලංගු අභියාචන පෙත්සමක් ලැබුණු විට, තක්සේරුකරුවකුගේ මාර්ගයෙන් වැඩි දුරටත් විමර්ශණයක් පැවැත්වීමට කොමසාරිස්වරයා විසින් කටයුතු යෙදිය යුතු අතර, ඒ විමර්ශණය කෙරීගෙන යන අතරතුර දී ඒ අභියාචන පෙත්සමේ සඳහන් කාරණා සම්බන්ධයෙන් එකඟත්වයකට පැමිණිය හොත්, තක්සේරුව පිළිබඳ අවශ්‍ය ගැලපීම් කිරීම හෝ මතයේ නැතහොත් දැන්වීමේ සඳහන් මුදල් ප්‍රමාණය ඒ අනුව සංශෝධනය කිරීම කරනු ලැබිය යුතුය.

(6) 5 වන උපවගන්තියේ සලස්වා ඇති විධිවිධානවල ආකාරයට අභියාචක සහ තක්සේරුකරු අතර එකඟවීමක් ඇති නොවූ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් අභියාචනය විභාග කිරීමට වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතුය.

(7) සෑම අභියාචකයකුම අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයෙහි කොමසාරිස්වරයා ඉදිරියේ පැමිණ සිටිය යුතුය. අභියාචකට පෞද්ගලිකව හෝ

බලය ලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ අභියාචනය පිළිබඳ විභාගයට පෙනී සිටිය හැකිය. අභියාචනයක් පිළිබඳ විභාගය සඳහා සුදුසු යයි කොමසාරිස්වරයා අදහස් කරන වේලාවකදී සහ ස්ථානයක දී පැවැත්වීම පිණිස ඒ විභාගය ඔහු විසින් කලින් කල අඩාලව කල් තැබිය හැකිය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයකු පැමිණ සිටින යම් අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් අභියාචනය පිළිබඳ විභාගය අඩාලව කල් තැබිය හැකි අතර, අභියාචනය ගැන තීරණයක් කිරීම සඳහා අභියාචක පෞද්ගලිකව පැමිණ සිටීම අවශ්‍යයයි ඔහු සලකන්නේ නම්, අඩාලව කල් තැබූ අභියාචනය පිළිබඳ විභාගය සඳහා නියම කර ඇති වේලාවෙහි සහ ස්ථානයේ අභියාචක පෞද්ගලිකව පැමිණ සිටිය යුතු යයි ද ඔහු විසින් නියම කරනු ලැබිය හැකිය. අභියාචනය පිළිබඳ විභාගය සඳහා හෝ අඩාලව කල් තැබූ විභාගය සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයේ පැමිණ සිටීම අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත් හෝ පෞද්ගලිකව පැමිණ සිටින ලෙස කොමසාරිස්වරයා විසින් අභියාචකට නියම කරනු ලැබූ විට, එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස්වරයා විසින් අභියාචනය නිශ්ප්‍රභ කරනු ලැබිය හැකිය.

එසේ වුවද, ඒ අභියාචනය පිළිබඳ විභාගයේදී හෝ අඩාලව කල් තැබූ විභාගයක දී තමාට හෝ තමාගේ බලයලත් නියෝජිතයාට නිසි පරිදි පැමිණ සිටීමට නොහැකි වූයේ ශ්‍රී ලංකාවේ නොසිටීම, රෝගාතුර භාවය හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බව අභියාචක විසින් ඒ අභියාචනය නිශ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත කොමසාරිස්වරයාට ඒත්තු ගැන්වුවහොත් ඔහු විසින් නිශ්ප්‍රභ කිරීමේ නියමය ඉවත් කොට අභියාචනයේ විභාගය

සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කළ හැකිය.

(8) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යැයි කොමසාරිස්වරයා සලකන යම් තැනැත්තකු තමා ඉදිරියට කැඳවීමේ බලය කොමසාරිස්වරයාට ඇති අතර කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකිය. එසේ පැමිණ සිටීමේ දී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන්ම දරන ලද යම් යුක්ති සහගත වියදමක් ලබා ගැනීමට කොමසාරිස්වරයා විසින් ඔහුට ඉඩ දිය හැකිය.

(9) යම් අභියාචනයක් පිළිබඳව තම තීරණය කිරීමට පෙර, යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, ඒ තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූ ද ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලබන්නා වූ ද යම් ඔප්පු, පිඹුරු, නාමලේඛන, සාධන පත්‍ර, පොත්, ගිණුම්, තොග ලැයිස්තු, චෙක්පත්, විගණක වාර්තා හෝ තක්සේරු වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිත කාල සීමාව ඇතුළත, පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස්වරයා වෙත එවන ලෙස හෝ ඒ තැනැත්තාට නියම කිරීමට අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන්නේ නම්, ඔහු විසින් එසේ කළ හැකිය.

(10)අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක ඒ සාක්ෂි පිළිබඳ වාර්තාවක් තබා ගැනීම හෝ තබා ගැනීමට සැලැස්වීම හෝ කොමසාරිස්වරයා විසින් කළ යුතුය.

(11)මේ වගන්තිය යටතේ අභියාචනයක් තීරණය කිරීමේ දී අභියාචනය කරනු ලැබ ඇත්තේ යම් මතයකට විරුද්ධව ද ඒ මතය කොමසාරිස්වරයා විසින් ස්ථිර කිරීම හෝ සංශෝධනය කිරීම හෝ කළ හැකිය. නැතහොත් අභියාචනය කරනු ලැබ ඇත්තේ

දැන්වීමේ සඳහන් යම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද ඒ මුදල කොමසාරිස්වරයා විසින් ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම කළ හැකිය. අනතුරුව කොමසාරිස්වරයා විසින් අභියාචනය පිළිබඳ තම තීරණය අභියාචකට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

(12) අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කළ විට හෝ 1 වන උපවගන්තිය යටතේ රඳවා ගනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් හෝ මුද්දර ගාස්තුවක් හෝ ගෙවිය යුතු යයි මුල් තක්සේරුව මගින් පිරිවැටුම් බද්ද නැතහොත් මුද්දර ගාස්තුව වැඩි යයි කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබූ විට, එවැනි යම් පිරිවැටුම් බද්දක් හෝ පිරිවැටුම් බද්දක ශේෂයක් හෝ මුද්දර ගාස්තුවක් හෝ මුද්දර ගාස්තුවක ශේෂයක් ගෙවිය යුතු කවර දිනයක දී ද නැතහොත් කවර දිනයකට පෙර ද යන්න කොමසාරිස්වරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් අභියාචක වෙත දැනුම් දිය යුතුය. එසේ නොගෙවනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් හෝ මුද්දර ගාස්තුවක් පැහැර හැර ඇති පිරිවැටුම් බද්දක් හෝ මුද්දර ගාස්තුවක් ලෙස සළකනු ලැබිය යුතුය.

(13) යම් තක්සේරුවකට හෝ මතයකට හෝ නියමයකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී දැන්වීමෙහි සඳහන් යම් පිරිවැටුම් බද්දක් හෝ මුද්දර ගාස්තුවක් ගෙවීම 1 වන උපවගන්තිය යටතේ රඳවා ගෙන ඇති විටක ඒ අභියාචනය පිළිබඳ පරීක්ෂණය පවත්වන අතරතුරේ දී හෝ ඒ අභියාචනය විභාග කරන අතරතුරේ දී, ඒ තක්සේරුව පිළිබඳ අභියාචක වෙත දෙනු ලැබූ ලිඛිත නිවේදනයෙහි සඳහන් නියමය සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද වශයෙන් හෝ මුද්දර ගාස්තුව වශයෙන් එක්තරා මුදල් ප්‍රමාණයක් තමන් විසින් ගෙවිය යුතු බව නැතහොත් ගෙවන්නට සිදු විය හැකි බවට අභියාචක එකඟ වුවහොත්, දැන්වීමෙහි සඳහන් දිනයේ දී හෝ ඊට පෙර ඒ මුදල ගෙවන

ලෙස කොමසාරිස්වරයා විසින් ඔහුට නියම කරනු ලැබිය හැකිය. එසේ නොගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් හිඟ හිට ඇති මුදලක් සේ සලකනු ලැබිය යුතුය.

## XXV වන පරිච්ඡේදය

## සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීම

සමාලෝචන මණ්ඩලයේ සංයුතිය.

80. (1) මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති ආකාරයෙන් අභියාචනා විභාග කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් පස්දෙනකුගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමාලෝචන මණ්ඩලයක් විය යුතුය. එසේ පත් කරන ලද මණ්ඩලයේ සෑම සාමාජිකයකුම අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා ධුරය දැරිය යුතුය. එහෙත් ඔහු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේය. අමාත්‍යවරයා විසින් සාමාජිකයකු සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතුය.

(2) මණ්ඩලයේ ලේකම්වරයකු විය යුතු අතර ඔහු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතුය.

(3) සභාපතිවරයා විසින් නම් කරනු ලැබූ කවර හෝ සාමාජිකයන් තිදෙනෙකු විසින් යම් අභියාචනයක් විභාග කළ හැකිය.

(4) පළාත් කොමසාරිස්වරයාගේ ඉල්ලීම පිට, මණ්ඩලයේ ලේකම්වරයා විසින් මණ්ලයේ රැස්වීමක් කැඳවිය යුතුය.

(5) මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහ ලේකම්වරයාගේ පාරිශ්‍රමිකය අමාත්‍යවරයා විසින් නියම කළ යුතුය.

සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනය කිරීම.

81. (1) කොමසාරිස්වරයා වෙත 79 වන වගන්තිය යටතේ කරනු ලැබූ අභියාචනයක් පිළිබඳව ඔහු විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් වූ යම් තැනැත්තකු විසින් ඒ තීරණය සම්බන්ධයෙන් තමා අතෘප්තියට පත් වූ බව

කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් දන්වනු ලැබිය හැකිය. එවැනි සෑම දැන්වීමක් ම තීරණයේ දින සිට එක් සතියක් ඇතුළත කරනු ලැබිය යුතුය.

(2) කොමසාරිස්වරයාගේ තීරණය පිළිබඳව තමා අතෘප්තියට පත්වූ බව අභියාචක විසින් (1) වන උපවගන්තියට අනුකූලව දක්වනු ලැබ ඇති අවස්ථාවක, ඒ තීරණයේ දින සිට එක් මාසයක් ඇතුළත කොමසාරිස්වරයා විසින් එම තීරණය සඳහා වූ තම හේතු අභියාචක වෙත ලියවිල්ලකින් ප්‍රේෂණය කළ යුතුය.

(3) කොමසාරිස්වරයා විසින් තීරණය සඳහා වූ හේතු (2) වන උපවගන්තිය යටතේ ප්‍රේෂණය කිරීමේ දින සිට එක් මාසයක් ඇතුළත, අභියාචක විසින් මණ්ඩලය අමතන ලද ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ඒ තීරණයට විරුද්ධව අභියාචනය කළ හැකිය. එවැනි සෑම පෙත්සමක්ම

(අ) අභියාචනය කරනු ලබන්නේ කොමසාරිස්වරයාගේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණයේ පිටපතක් සමග විය යුතුය.

(ආ) ඊට විරුද්ධ අභියාචනය කරනු ලබන්නේ යම් හේතු සම්බන්ධයෙන් ද එම හේතු සංක්ෂිප්ත වශයෙන් දැක්විය යුතුය ; තවද

(ඇ) මණ්ඩලයේ ලේකම්වරයාට භාර දෙනු ලැබිය යුතුය.

පළාත් කොමසාරිස්වරයා විසින් අභියාචන සමාලෝචන මණ්ඩලයට යොමු කළ හැකිය.

82. කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද යම් වලංගු අභියාචනයක් ඔහු විසින් සමාලෝචන මණ්ඩලයට යොමු කළ යුතු අතර, මණ්ඩලය විසින් ඒ අභියාචනය විභාග කොට තීරණය කළ යුතුය. තවද ඒ අනුව එසේ යොමු කරන ලද යම් අභියාචනයක් විභාග කොට තීරණය කිරීම සම්බන්ධයෙන් 83 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

83. (1) අභියාචනා පෙත්සමක් ලැබීමෙන් පසුව හැකි ඉක්මණින් මණ්ඩලයේ ලේකම්වරයා විසින් අභියාචනය විභාග කිරීම සඳහා දිනයක් වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතුය.

තවද අභියාචක සහ කොමසාරිස්වරයා යන දෙදෙනාටම ඒ පිළිබඳව දින දහ හතරක දැන්වීමක් දෙනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් ලැබුණු විට, 79(10) වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන සාක්ෂි වාර්තාවේ පිටපතක් කොමසාරිස්වරයා විසින් මණ්ඩලයට ප්‍රේෂණය කළ යුතුය.

(3) අභියාචනයක් විභාග කිරීමේදී සෑම අභියාචකයකු විසින් ම, පෞද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පැමිණ සිටිය යුතුය. අභියාචක පෞද්ගලිකව පැමිණ සිටීම හැකි කිරීමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් කල්පනා කරනු ලබන යම් කාලයක් සඳහා මණ්ඩලය විභාගය කල් තබනු ලැබිය හැකිය.

(4) යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන්නේ තක්සේරුවකට, මතයකට නැතහොත් නියමයකට විරුද්ධව ද, ඒ තක්සේරුව කරනු ලැබූ හෝ මතය දෙනු ලැබූ හෝ නියමය පනවනු ලැබූ තක්සේරුකරු හෝ කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඒ අභියාචනය විභාග කරනු ලබන මණ්ඩලයේ රැස්වීමට කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලද තක්සේරුව සනාථ කිරීමෙහි ලා පැමිණ සිටිය යුතුය.

(5) අවස්ථාවෝචිත පරිදි අභියාචනයේ දී හෝ නැතහොත් 82 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් යොමු කරනු ලැබූ විට කොමසාරිස්වරයා විසින් ස්ථිර කරනු ලැබූ තක්සේරුව, මතය හෝ නියමය අධික බව හෝ වැරදි සහගත බව ඔප්පු කිරීමේ බලය අභියාචක වෙත පැවරෙන්නේය.

(6) සියලු අභියාචනා රහසිගතව විභාග කළ යුතුය.

(7) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දීමට හැකි යැයි මණ්ඩලය විසින් සලකනු ලබන යම් තැනැත්තකුට විභාගයේ දී පැමිණ සිටීමට

සිතාසි නිකුත් කිරීමට මණ්ඩලයට බලය ඇත්තේය. තව ද සාක්ෂිකරුවකු වශයෙන් දිවුරුම් මත හෝ අන්‍යාකාරයකින් ඔහු විභාග කරනු ලැබිය හැකිය. එසේ පැමිණ සිටින යම් තැනැත්තකුට එසේ පැමිණ සිටීමේ ඔහු විසින් අවශ්‍යයෙන් දරන ලද යුක්ති සහගත වියදම් කිසිවකට මණ්ඩලය විසින් ඉඩ දෙනු ලැබිය හැකිය.

(8) මණ්ඩලයේ කැමැත්ත ඇතිව සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් නියමයන් මත හැර කොමසාරිස්වරයා ඉදිරියේ ඉදිරිපත් කරනු නොලැබුවා වූ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ කොමසාරිස්වරයා ඉදිරියේ සාක්ෂි දෙනු නොලැබුවා වූ යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි හෝ කොමසාරිස්වරයා ඉදිරියේ වූ විභාගයේ දී එවකටත් වාර්තා ගත කරනු ලැබුවා වූ යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි ඉදිරිපත් කිරීමට මණ්ඩලය විසින් විභාගයේ දී අභියාචකට ඉඩ දෙනු ලැබිය යුතුය.

(9) අභියාචන විභාගයේ දී මණ්ඩලය විසින් (8) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව වාචික වුව ද නැතහොත් ලේඛනගත වුව ද ගෙන හැර දක්වන ලද සාක්ෂි කිසිවක් ආවේශ්‍ය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම මණ්ඩලය විසින් කළ හැකි අතර සාක්ෂි ආවේශ්‍ය කිරීමට අදාළ සාක්ෂි ආඥාපනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(10) අභියාචනා විභාග කිරීමෙන් පසුව අවස්ථාවෝචිත පරිදි අභියාචනය මත හෝ 82 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් යොමු කරනු ලැබූ පරිදි කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලද තක්සේරුව මණ්ඩලය විසින් ස්ථිර කිරීම, අඩුකිරීම, වැඩි කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම කළ හැකිය. නැතහොත් එම විෂය ඒ පිළිබඳ මණ්ඩලයේ මතය සමග කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ හැකිය. මණ්ඩලය විසින් විෂයයන් එසේ ප්‍රේෂණය කරනු ලැබ ඇති අවස්ථාවක මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය පරිදි

කොමසාරිස්වරයා විසින් තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතුය. මණ්ඩලයේ තීරණය අභියාචකට සහ කොමසාරිස්වරයාට ලියවිල්ලකින් දැන්විය යුතුය.

(11)(10) වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් ඒ තක්සේරුව සම්බන්ධයෙන් අඩු කිරීමක් හෝ නිෂ්ප්‍රභ කිරීමක් කරනු නොලබන අවස්ථාවක රුපියල් පන්සීයක් නොඉක්මවන මුදලක් මණ්ඩලයේ ගාස්තු ගෙවීමට මණ්ඩලය විසින් අභියාචකට නියම කළ හැකි අතර එය තක්සේරුවෙන් අය කරනු ලබන බද්දට එකතු කොට ඒ සමග අයකර ගනු ලැබිය යුතුය.

## XXVI වන පරිච්ඡේදය

## අභියාචනාධිකරණයට කරනු ලබන අභියාචන

නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණයට අභියාචනා කිරීම.

84\. (1) මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතුය. එසේ වුව ද නීති ප්‍රශ්නයක් පිළිබඳ අභියාචනාධිකරණයේ මතය ලබා ගැනීම සඳහා එකී තීරණයට අදාළ කරුණු සැලකිරීමක් කරන ලෙස අභියාචක විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. ඒ ඉල්ලීම, මණ්ඩලයේ තීරණය, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්වරයා වෙත හෝ අභියාචක වෙත ලියවිල්ලකින් දැනුම් දෙන ලද දින සිට එක් මාසයක් ඇතුළත, රුපියල් පනහක ගාස්තුවක් ද සමග ලියවිල්ලකින් මණ්ඩලයේ ලේකම්වරයා වෙත භාර දෙනු ලැබුවහොත් මිස එය භාර නොගත යුතුය.

(2) මණ්ඩලය විසින් තීරණයට අදාල කරුණු සැලකිරීමක දී එහි සිද්ධි ද මණ්ඩලයේ තීරණය ද බදු මුදල් රුපියල් පන්දහසක් ඉක්මවන අවස්ථාවක ප්‍රස්තුත බදු මුදල ද සඳහන්ව තිබිය යුතු අතර, ඒ තීරණයට අදාළ කරුණු සැලකිරීම කරන ලෙස මණ්ඩලයෙන් ඉල්ලා සිටින පාර්ශවකරු විසින් ඒ තීරණයට අදාළ කරුණු සැල කරන ලද සහ අත්සන් කරන ලද විට, එය තමා වෙත ලැබීමෙන් දින දහ

හතරක් ඇතුළත අභියාචනාධිකරණය වෙත යවනු ලැබිය යුතුය.

(3) මුද්දර ආඥාපනතේ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා :-

(අ) අභියාචනාධිකරණය වෙත මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද එකී තීරණයට අදාළ කරුණු සැලකිරීමක් පිළිබඳව අභියාචනාධිකරණය ඉදිරියේ පැවැත්වුණු හෝ එවැනි කරුණු සැලකිරීමක් පිළිබඳව කරන ලද විභාගයක තීරණයක් පිළිබඳව හෝ ඒ පිළිබඳව අවසානයක් කිරීම පිළිබඳව පවත්වනු ලැබූ සියලූ නඩු කටයුතු රුපියල් පන්දහසක වටිනාකමින් යුක්ත හෝ කරන ලද තීරණය පිළිබඳ කරුණු සැලකිරීමේදී මණ්ඩලය විසින් ප්‍රස්තුත බදු මුදල වශයෙන් සඳහන් කරනු ලැබූ වැඩි මුදලක වටිනාකමින් යුක්ත අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නඩු කටයුතු ලෙස සැලකිය යුතුය.

(ආ) එසේ කරන ලද තීරණය පිළිබඳ සෑම කරුණු සැලකිරීමක් ම මණ්ඩලය විසින් ඊට අමුණනු ලැබූ පොත්, ලේඛන සහ ලියවිලි ද සමග අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නඩු කටයුතු වල තනි ඒකකයක් ලෙස සැලකිය යුතුය.

(ඇ) කොමසාරිස්වරයා අභියාචක වන්නේ නම්, ඔහු නිල බලය අනුව නඩුවක් පවරන රජයේ නිලධරයකු වශයෙන් ද නැතහොත් ඔහු අභියාචනයක වගඋත්තරකරුවන්නේ නම් ඔහු නිල බලයෙන් නඩුවක් පවරනු ලැබූ රජයේ නිලධරයකු වශයෙන් ද සලකනු ලැබිය යුතුය.

(4) අභියාචනාධිකරණය වෙත තීරණයට අදාළ කරුණු සැල කරන ලෙස ඉල්ලා සිටින පාර්ශවකරු විසින් ඒ කරුණු සැලකිරීම එසේ කරන වේලාවෙහි හෝ ඊට පෙර ස්වකීය ඉල්ලීමෙන් කරුණු සැලකිරීමක් කරනු ලැබූ බව දන්වමින් ලියවිල්ලකින් වූ දැන්වීමක්

අනෙක් පාර්ශවකරු වෙත යැවිය යුතු අතර, එකී කරුණු සැලකිරීමෙහි පිටපතක් ද ඒ පාර්ශවකරු වෙත සැපයිය යුතුය.

(5) යම් කරුණු සැලකිරීමක් සංශෝධනය කිරීම පිණිස අභියාචනාධිකරණයෙහි යම් විනිශ්චය කාරවරයකු විසින් මණ්ඩලය වෙත එය ආපසු යවනු ලැබිය හැකි අතර, ඒ අනුව කරුණු සැල කිරීම මණ්ඩලය විසින් සංශෝධනය කළ යුතුය.

(6) අභියාචනාධිකරණයෙහි එක් විනිශ්චයකාරවරයකු හෝ ඊට වැඩි ගණනක් විසින්, එකී කරුණු සැලකිරීමෙන් උද්ගතවන යම් නීති ප්‍රශ්නයක් විභාග කොට තීරණය කළ හැකි අතර, ඒ ප්‍රශ්නය පිළිබඳව අධිකරණය එළඹි තීරණය සම්බන්ධයෙන් අභියාචනය කරනු ලැබුවේ යම් මතයකට විරුද්ධව ද ඒ මතය ස්ථිර කිරීම හෝ සංශෝධනය කිරීම ඒ අනුව කළ හැකි අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ තක්සේරුව හෝ දැන්වීම සම්බන්ධයෙන් ස්ථිර කිරීමක්, අඩු කිරීමක්, වැඩි කිරීමක් හෝ නිෂ්ප්‍රභ කිරීමක් කළ හැකිය. නැතහොත් ඒ පිළිබඳව අධිකරණයේ මතය සමග සැල කරනු ලැබූ කාරණය මණ්ඩලය වෙත ප්‍රේෂණය කරනු ලැබිය හැකිය.

(7) අභියාචනාධිකරණය ඉදිරියේ වූ යම් නඩු කටයුත්තක දී අභියාචනාධිකරණයෙහි ගාස්තු සම්බන්ධයෙන් ද (1) වන උපවගන්තිය යටතේ ගෙවනු ලැබූ මුදල සම්බන්ධයෙන් ද සුදුසු යයි අධිකරණය සලකන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකිය.

(8) (6) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරනු ලැබූ යම් ආඥාවකට විරුද්ධව කොමසාරිස්වරයා විසින් හෝ වෙනත් යම් පාර්ශ්වකරුවකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමට හැකි කිරීමේ කාර්ය සඳහා සහ අභියාචනාධිකරණයේ නීතියකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමට

අදාළ යම් ලිඛිත නීතියක විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා :-

(අ)(6) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරන ලද ආඥාවක් සහ ඒ සමග (7) වන උපවගන්තිය යටතේ ඒ අධිකරණය විසින් කරන ලද යම් ආඥාවක් පළාත් කොමසාරිස්වරයා සහ ඒ වෙනත් පාර්ශ්වකරු අතර වූ සිවිල් නඩුවකදී අභියාචනාධිකරණය විසින් කරන ලද අවසාන නඩු තීන්දුවක් ලෙස සැලකිය යුතුය.

(ආ)ඒ සිවිල් නඩුවේ ප්‍රස්තුත කාරණයෙහි වටිනාකම රුපියල් පන් දහසක් ලෙස සැලකිය යුතුය.

එසේ වුව ද මණ්ඩලය විසින් ප්‍රස්තුත බදු මුදල් ප්‍රමාණය වශයෙන් රුපියල් පන් දහසකට වැඩි ප්‍රමාණයක්, කරන ලද කරුණු සැලකිරීමෙහි දක්වා ඇති අවස්ථාවක, ඒ සිවිල් නඩුවෙහි ප්‍රස්තුත කාරණයෙහි වටිනාකම එසේ දක්වා ඇති වැඩි ප්‍රමාණය ලෙස සැලකිය යුතුය. තවද

(ඇ)එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් එවැනි යම් ලිඛිත නීතියකින් නියමිත යම් මුදලක් තැන්පත් කරන ලෙස හෝ යම් ගාස්තුවක් ගෙවන ලෙස හෝ යම් ඇපයක් තබන ලෙස කොමසාරිස්වරයාට නියම කරනු නොලැබිය යුතුය.

## XXVII වන පරිච්ඡේදය

### බද්ද අයකර ගැනීම

85. (1) මේ පරිච්ඡේදයේ " බද්ද " යන්නෙහි "පිරිවැටුම් බද්දක්" සහ මුද්දර ගාස්තුවක් සහ ඒ "පිරිවැටුම් බද්දට" හෝ "මුද්දර ගාස්තුවට" එකතු කරන ලද යම් මුදලක් සහ මේ ප්‍රඥප්තිය යටතේ දරන ලද කවර වූ යම් දඩ, දණ්ඩන, මුදල් ගාස්තු හෝ වියදම් ඇතුළත් වේ.

(2) 4 වන වගන්තිය සහ 57 (1) (ආ) වගන්තිය යටතේ වූ යම් දැන්වීමක් මගින් ගෙවීමට නියමිත බදු මුදල ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙර ගෙවිය යුතු අතර එසේ නොගෙවන ලද බද්දක් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(3) 11 සහ 12 වන වගන්තිය යටතේ සහ 57 (1) (ආ) වගන්තිය යටතේ සෑම කාර්තුවක් තුළ ගෙවිය යුතු බද්ද, එහි සඳහන් දින හෝ ඉන් පෙර ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ බද්ද සහ බද්දෙන් සියයට 10 ක් සහ ගෙවීම නොකළ සෑම මාසයක් සඳහා පැහැර හැර ඇති බද්දෙන් සියයට 2 ක දණ්ඩන මුදලක් පැහැර හරිනු ලැබූලෙස සලකනු ලැබිය යුතු අතර, බද්ද ගෙවීමට යටත් තැනැත්තා ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සැලකිය යුතුය.

එසේ වුව ද, දණ්ඩන මුදලක් ලෙස ගෙවිය යුතු මුළු මුදල ගෙවීම පැහැර හරින ලද ගාස්තුවෙන් සියයට පනහක් නොඉක්මවිය යුතුය.

(4) යම් අභියාචනයක් ඉදිරිපත් කර ඇති විටක, ඒ අභියාචනයේ තීරණය ලැබෙන තෙක් යම් බද්දක් හෝ එහි යම් කොටසක් ගෙවීම අත්හිටුවා තබන ලෙස කොමසාරිස්වරයා නියම කළහොත් මිස, ඒ අභියාචනය නොතකා එය ගෙවිය යුතුය. එවැනි නියමයක් කරන ලද විටක එසේ ගෙවීම අත්හිටුවා තබන ලද බද්ද පැහැර හරින ලද්දක් ලෙස නොසැලකිය යුතුය.

(5) (3) වන උපවගන්තිය යටතේ ගෙවීම අත්හිටුවා තබන ලද බද්ද හෝ එහි යම් කොටසක් ලබා ගැනීමට නොහැකි වීමට ඉඩ ඇති බව හෝ අභියාචක තම අභියාචනයේ කටයුතු අයුක්ති සහගත ලෙස ප්‍රමාද කරන බව හෝ

කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් ඒ උපවගන්තිය යටතේ කළ නියමය ප්‍රත්‍යාදිෂ්ට කොට අවස්ථානුකූලව අවශ්‍ය යැයි ඔහුට පෙනී යන යම් අලුත් නියමයක් කරනු ලැබිය හැකිය. ඒ අලුත් නියමයෙහි සඳහන් කරනු ලබන දිනය හෝ ඊට පෙර නොගෙවන ලද යම් බද්දක් පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතුය.

(6) මේ කොටස යටතේ අභියාචනයක් පිළිබඳව අවසාන තීරණයක් කරනු ලැබූ විට හෝ කොමසාරිස්වරයා විසින් යම් නියමයක් කරනු ලැබූ විට, (4) වන උපවගන්තිය යටතේ ගෙවීම අත්හිටුවන ලද යම් බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක හෝ දැන්වීමක් යටතේ ගෙවනු ලැබිය යුතු බද්ද හෝ බද්දක ශේෂයක් යම් දිනයක හෝ ඊට පෙර ගෙවිය යුතු ද, ඒ දිනය නියම කරමින් කොමසාරිස්වරයා විසින් අභියාචක වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් යැවිය යුතුය. ඒ දිනයට පෙර ගෙවනු නොලැබූ යම් බද්දක් පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතුය.

86. ගෙවීම පැහැර හරිනු ලැබූ යම් බද්දක්, පැහැර හැර ඇති තැනැත්තාගේ සියලු වත්කම් විෂයෙහි ප්‍රථම වැය බරක් විය යුතුය. එසේ වුව ද

(i) 88 වන වගන්තියෙහි විධිවිධාන වලට අනුව තහනමට ගනු ලැබීමට පෙර පැහැර හැරි තැනැත්තා විසින් වටිනාකම දී සද්භාවයෙන් මිළ දී ගන්නකුට විකුණන ලද වත්කම්වලට ඒ වැය බර ව්‍යාප්ත නොවිය යුතුය. නැතහොත් ඒ වැය ඒ වත්කම්වලට බල නොපෑ යුතුය. තවද ;

(ii) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට, දේපළ තහනම් කරනු ලැබූ දිනට පෙර, වටිනාකම දී සද්භාවයෙන් ඇති කරනු ලැබ ලියාපදිංචි කරන ලද බදු දීමකට හෝ බැඳීමකට ඉහළින් ප්‍රමුඛත්වයක් පැහැර හැරඇති මුදලට නොලැබිය යුතුය.

87. (1) යම් බද්දක් පැහැර හැර ඇති අවස්ථාවක, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති කවර හෝ ආකාරයකින් ඒ බද්ද ලබා ගැනීම සඳහා කටයුතු කිරීමට පෙර කොමසාරිස්වරයා විසින්

(අ) ඒ බද්දෙහි විස්තර සහ

(ආ) ඒ බද්ද අය කිරීම සඳහා කටයුතු කිරීමට අදහස් කරන බව

සඳහන් කරමින් පැහැර හැර ඇති තැනැත්තා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නිකුත් කළ යුතුය.

(2) පැහැර හැර ඇති තැනැත්තා විසින් 57(1)(ආ) වගන්තිය යටතේ වූ යම් තක්සේරුවකට හෝ දැන්වීමකට විරුද්ධව නිසි කාලසීමාව ඇතුළත අභියාචනයක් කරනු ලැබ නොමැති නම්, මේ වගන්තිය (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ දිනයෙහි සිට දින තිහක් ඇතුළත දී, එසේ නියම කරනු ලැබූ බද්ද පිළිබඳව යම් විරෝධතාවක් ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර කොමසාරිස්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව තම තීරණය දිය යුතුය. එවිට ඒ තීරණය අවසානාත්මක වන්නේය.

(3) මේ වගන්තියේ කුමක් සඳහන් ව ඇත ද, 57(1)(ආ) වගන්තිය යටතේ වූ දැන්වීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූද, ඒ දැන්වීමේ සඳහන් යම් බද්දක් ගෙවීම කොමසාරිස්වරයාගේ නියමයක් අනුව අත්හිටුවා ඇත්තා වූද, ඒ අභියාචනය විභාග කරනු ලබන අතරතුර, ඒ දැන්වීම සම්බන්ධයෙන් ශාස්තු වශයෙන් යම් මුදලක් අයවිය යුතු බවට හෝ අයවීමට ඉඩ ඇති බවට අභියාචක එකඟවන්නා වූ ද අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, අභියාචකට ලියවිල්ලකින් දෙනු ලබන දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන යම් දිනයක හෝ එදිනට පෙර දිනයක, ඒ මුදල ගෙවන ලෙස අභියාචකට නියම කරනු ලැබිය හැකිය. ඒ දිනයට පෙර නොගෙවන ලද යම් මුදලක්

පැහැර හරින ලද මුදලක් ලෙස සැලකිය යුතුය.

(4) යම් අභියාචනයක් මේ කොටස යටතේ අවසානාත්මක ලෙස තීරණය කරනු ලැබූ විටක, පැහැර හැර තිබෙන යම් බද්දක් අඩු කරනු ලබන අවස්ථාවක, ඒ බද්ද සම්බන්ධයෙන් ගෙවිය යුතු දණ්ඩන මුදල ද සමානුපාතිකව අඩුකරනු ලැබිය යුතුය.

88. (1) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් බදු එකු කරන්නන් පත් කරනු ලැබිය හැකිය.

(2) (අ) යම් බද්දක් ගෙවීම පැහැර හරින අවස්ථාවක ඒ බද්ද පිළිබඳ විස්තර ද පැහැර හැර ඇති තැනැත්තාගේ නම ද ඇතුළත් සහතිකයක් දිසාපතිවරයකුට, පිස්කල් වරයකුට, නියෝජ්‍ය පිස්කල් වරයකුට හෝ බදු එකතු කරන්නකු වෙත කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය. ඒ සහතිකයේ නම් කරනු ලැබූ පැහැර හැර ඇති තැනැත්තාගේ චංචල දේපළ තහනමට ගෙන විකිණීමෙන් ඔහුගෙන් ගාස්තු අය කර ගැනීමට සැලැස්වීමට ඒ සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට මෙයින් බලය දෙනු ලබන අතර එසේ කරන ලෙස ද ඒ නිලධරයාට මෙයින් නියම කරනු ලැබේ.

(ආ) චංචල දේපළ තහනමට ගැනීම ඉතාමත් යෝග්‍ය යයි ඒ නිලධරයා සලකන ආකාරයට කළ යුතු අතර, ඒ නිලධරයා විසින් යම් චංචල දේපළක් තහනමට ගනු ලැබූ විගස, ඒ දේපළ වල ලැයිස්තුවක් වහාම පිළියෙල කොට, ඔහු විසින් එය අත්සන් කොට පැහැර හැර ඇති තැනැත්තාට දී එහි පිටපතක් කොමසාරිස්වරයාට යැවිය යුතුය.

(ඇ) එසේ තහනමට ගනු ලැබූ දේපළ :-

(i) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, පැහැර හැර ඇති ගාස්තුව පියවීම සඳහා ඒ මුදල ගෙවිය යුතුය.

(ii) විදේශීය ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, ඒ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කළ යුතු අතර, එයින් ලැබෙන මුදල් පැහැර හැර ඇති ගාස්තුව පියවීම සඳහා ගෙවිය යුතුය.

(iii) මුදල් නොවන වෙනත් දේපළක් වන අවස්ථාවක පැහැර හැර ඇති තැනැත්තා විසින් වියදම් හා වෙනත් අයකිරීම් ගෙවීමේ වගකීම පිට ඒ දේපළ දින පහක කාලයක් තබාගත යුතුය.

පැහැර හැර ඇති තැනැත්තා විසින් එකී දින පහ ඇතුළත පැහැර හැර ඇති ගාස්තුව සහ එකී වියදම් සහ වෙනත් අයකිරීම් ගෙවනු නොලැබුවහොත් දිසාපතිවරයා, සහකාර දිසාපතිවරයා, පිස්කල්වරයා, නියෝජ්‍ය පිස්කල්වරයා හෝ බදු එකතු කරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්වීමට හෝ ඒ දේපළ ගණුදෙනු කළ හැකි සාධන පත්‍රයක් හෝ යම් සංස්ථාවක හෝ පොදු සමාගමක කොටසක් හෝ වන අවස්ථාවක, තැරැව්කරුවකු මගින් එදින පවතින වෙළෙඳ අගය අනුව ඒ දේපළ විකිණීමට සැලැස්වීම හෝ කළ යුතුය.

(ඇ)(iii) වන අනුඡේදයේ සඳහන් විකිණීමෙන් උපලබ්ධවන මුදල් ප්‍රමාණය පහත දැක්වෙන පරිදි යෙදවිය යුතුය.

(i) පළමුව, දේපළ තහනමට ගැනීමේ, තබා ගැනීමේ සහ විකිණීමේ වියදම් සහ ගාස්තු පියවීම සඳහා;
සහ

(ii) දෙවනුව, පැහැර හැර ඇති බද්ද පියවා ගැනීම සඳහා, ඉන්පසු ශේෂ වන යම් මුදලක් වේ නම් එය තහනමට ගනු ලැබූ දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතුය.

(3) තහනමට ගැනීම ක්‍රියාත්මක නොකරන ලද්දේ වුව ද, යම් පැහැර හැරී තැනැත්තකුට විරුද්ධව මේ වගන්තිය යටතේ නීති කෘත්‍යය කරගෙන

යාමේදී බදු අය කරන්නකු විසින් දරනු ලැබූ යුක්ති සහගත වියදම් ඔහු විසින් ඒ පැහැර හැරී තැනැත්තා ගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේය. මුදල් තහනමට ගෙන ඇති අවස්ථාවක දී යටකී අන්දමේ යුක්ති සහගත වියදම් පළමුකොට මුදල් වලින් අඩු කරගනු ලැබිය යුතුය.

(4) යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකදී සහ (2) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ බද්ද අයකර ගැනීම ප්‍රායෝගික හෝ යෝග්‍ය නොවන්නේ යයි කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක දී, ඒ බද්ද පිළිබඳ විස්තර, ඒ බද්ද ගෙවිය යුතු නැතැත්තාගේ හෝ නැතැත්තන්ගේ නම හෝ නම් ඇතුළත් සහතිකයක්, එකී පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ඔහුට අයත් චංචල හෝ නිශ්චල යම් දේපළක් පිහිටා ඇති ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, එවිට ඒ බද්ද අයකර ගැනීම සඳහා අවශ්‍යයයි ඒ දිසා අධිකරණය එයින් සලකනු ලබන පරිදි පැහැර හරින්නාගේ චංචල හෝ නිශ්චල දේපළ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ තහනමට ගෙන විකුණන ලෙස ඒ පිස්කල් නිලධාරියාට බලය දෙමින් ඇස්කිසි රිට් ආඥාවක් නිකුත් කරන ඒ අධිකරණය විසින් විධානය කළ යුතුය. සිවිල් නඩුවිධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එවැනි තහනමට ගැනීමකට සහ විකිණීමකට අදාළ වන්නේය.

මේ වගන්තියේ කාර්ය සඳහා "චංචල දේපළ" යන්නට පිරියත සහ යන්ත්‍රෝපකරණ ඇතුළත් වේ.

(5) මේ වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලබන කවර වුව ද අවස්ථාවකදී, ඒ පිළිතුරු නිවේදනයක් නොපමාව පෞද්ගලිකව භාරදීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් යැවීමෙන් හෝ විදුලි

පුවතක් මගින් හෝ පැහැර හරින්නා වෙත නිකුත් කළ යුතුය. ගෙවීම පැහැර හරින්නා වෙත ඒ නිවේදනය නොලැබීම නිසා මේ වගන්තිය යටතේ වූ නීති කෘත්‍ය අවලංගු නොවන්නේය.

89. (1) එසේ තහනමට ගෙන විකිණීමෙන්, පැහැර හැර ඇති බද්ද අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, හෝ තහනමට ගෙන විකිණීමෙන්, සම්පූර්ණ බද්ද අයකර ගනු නොලැබූ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, ඒ බද්දේ විස්තර ද පැහැර හැර ඇති තැනැත්තාගේ නම සහ ඔහුගේ අන්තිමට දැන සිටි පදිංචි ස්ථානය ද දක්වෙන සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කළ හැකිය.

එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, බද්ද අයකර ගැනීම සඳහා ඒ පැහැර හැර ඇති තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්වීමට තරම් කරුණු තිබේ නම්, ඒ කරුණු ඔහු විසින් දැක්වීම පිණිස තමා වෙත කැඳවිය යුතුය. ඔහු ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත්, පැහැර හැර ඇති බද්ද දඩයකින් පමණක් දඬුවම් කළ හැකි හෝ බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් නොකළ හැකි වරදක් සඳහා ඒ පැහැර හැර ඇති තැනැත්තාට ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දණ්ඩන නියමයකින් නියම කරනු ලැබූ දඩයක් ලෙස සැලකිය යුතු අතර, එවිට, ඒ වරද සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීමට අදාළ 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ) (ආ) සහ (එ) ඡේද හැර) අදාළ විය යුතුය. තවද ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ විධානයක් ද ඔහු විසින් කරනු ලැබිය හැකිය.

(2) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තියේ කාර්ය සඳහා නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව ගැන මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කරනු ලැබීම හෝ විභාග කරනු ලැබීම හෝ නොකළ යුතු අතර, ඒ අනුව, ඒ සහතිකයෙහි ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව ගැන සලකා බැලීමට හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය පවරන්නක් ලෙස ඒ උපවගන්තියෙහි වූ කිසිවක් තේරුම් නොගත යුතුය.

(3) 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උපවගන්තිවල විධිවිධාන කිසිවක් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවකට අදාළ නොවිය යුතුය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් වන්නා වූද, පැහැර හැර ඇති තැනැත්තාට නියම කරනු ලැබූ ලෙස ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරීම නිසා, පැහැර හැර ඇති තැනැත්තා බන්ධනාගාර ගත කිරීමට නියම කරනු ලැබුවා වූ ද යම් අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් ඒ දඩ මුදල ගෙවීමට කල්දීම හෝ ඒ මුදල කොටස් වශයෙන් ගෙවන ලෙස විධාන කිරීම හෝ කළ හැකිය.

(5) (1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා, ඒ උපවගන්තිය යටතේ කල්දීම සඳහා හෝ (4) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල්දීම සඳහා පූර්ව කොන්දේසියක් වශයෙන් ඇප තබන ලෙස අධිකරණය විසින් නියම කළ හැකිය. තවද එසේ ඇප තබන ලෙස පැහැර හැර ඇති තැනැත්තාට නියම කළ විටක, 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතුය.

(6) කොටස් වශයෙන් යම් මුදලක් ගෙවිය හැකි බවට මහේස්ත්‍රාත්වරයකු විසින් (4) වන උපවගන්තිය යටතේ විධාන කරනු ලැබ තිබියදී, ඉන් යම් කොටසක් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලුම කොටස් ගෙවීම පැහැර හැර ඇති විටක මෙන් නඩු කටයුතු ඇරඹිය හැකිය.

(7) (1) වන උපවගන්තිය යටතේ යම් නඩු කටයුත්තක දී කොමසාරිස්වරයාගේ සහතිකය බද්ද ගෙවන ලෙස යථා පරිදි නියම කරනු ලැබූ බවට හා එය පැහැර හැර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, ගාස්තු ප්‍රමාණය අධික බවට හෝ සාවද්‍ය බවට හෝ එයට විරුද්ධව අභියාචනා කොට ඇති බවට ඉදිරිපත් කරනු ලබන කිසිම උත්තරවාදයක් පිළිනොගත යුතුය.

90. (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද පැහැර හැර ඇත්තා වූද -

(අ) පැහැර හැර ඇති තැනැත්තාට හෝ ඔහුගේ අනුයෝජිතයාට යම් තැනැත්තකුගෙන් යම් මුදලක් ලැබිය යුතු බව හෝ යම් තැනැත්තකු මුදල් ගෙවීමට සූදානම් ව සිටින බව; හෝ

(ආ) පැහැර හැර ඇති තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ සඳහා නැතහොත් වෙනුවෙන් යම් තැනැත්තකු මුදල් තබාගෙන සිටින බව; හෝ

(ඇ) පැහැර හැර ඇති තැනැත්තාට හෝ; ඔහුගේ අනුයෝජිතයාට ගෙවීම සඳහා වෙනත් යම් තැනැත්තකු මුදල් තබා ගෙන සිටින බව; හෝ

(ඈ) පැහැර හැර ඇති තැනැත්තාට හෝ ඔහුගේ අනුයෝජිතයාට මුදල් ගෙවීමට වෙනත් යම් තැනැත්තකුගෙන් යම් තැනැත්තකු බලය ලබා සිටින බව.

කොමසාරිස්වරයාට පෙනී යන්නා වූ ද අවස්ථාවක, පැහැර හැර ඇති බදු ප්‍රමාණය නොඉක්මවන මුදලක් දැන්වීමේ සඳහන් කරනු

ලබන නිලධරයා වෙත ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කෙරෙන (පැහැර හැර ඇති තැනැත්තා වෙත පිටපතක් තැපෑලෙන් යැවිය යුතු ය) ලියවිල්ලකින් වූ දැන්වීමක් කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට දිය හැකි ය. දැන්වීම ලැබුණු දිනයෙහි ඔහු අතෙහි ඇති හෝ ඔහුගෙන් ලැබිය යුතු සියලුම මුදල්වලට ද, දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත්වන හෝ ඔහුගෙන් ලැබිය යුතු වන හෝ ඔහු විසින් ගෙවීමට ඉඩ ඇති සියලුම මුදල් වලට ද ඒ දැන්වීම අදාළ විය යුතුය.

(2) මේ වගන්තිය ප්‍රකාර යම් ගෙවීමක් කළ තැනැත්තකු පැහැර හැර ඇති තැනැත්තාගේ සහ සම්බන්ධතාවක් ඇති වෙනත් සියලු තැනැත්තන්ගේ බලය යටතේ ක්‍රියා කළ ලෙස සැලකිය යුතු අතර, යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟවීමක කුමක් සඳහන් ව තිබුණ ද,ඒ ගෙවීම සම්බන්ධයෙන් සියළු සිවිල් හා අපරාධ නඩු කටයුතුවලින් ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබේ.

(3) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ උපවගන්තියෙහි සඳහන් කාලසීමාව ඇතුළත ඒ උපවගන්තියේ සඳහන් මුදල් ඔහුගේ අතට නොලැබීමේ හෝ ඒ මුදල් ඔහුගෙන් ලැබිය යුතු නොවීමේ හේතුව නිසා ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ විට, ඔහු විසින් ඒ කාලසීමාව ඉකුත්වීමෙන් පසු දින දහහතරක් ඇතුළත ඒ කරුණු සඳහන් කරමින් කොමසාරිස්වරයාට ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය යුතුය.

(4) මෙහි (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වී ඇත්තා වූද, (3) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි කොමසාරිස්වරයාට දැනුම් දීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇත්තා වූ අවස්ථාවක හෝ දැන්වීම අදාළ වන ගාස්තුව හෝ ඉන් කොටසක් හෝ ඒ

තැනැත්තා විසින් ගෙවනු ලැබූ හෝ ගෙවනු ලැබිය හැකි ව තිබූ සහ කොමසාරිස්වරයා විසින් දෙන ලද දැන්වීමෙන් නියම කරනු ලැබූ පරිදි ඒ ගාස්තුව හෝ එහි කොටස හෝ (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ කාලසීමාව ඉකුත්වීමෙන් දින දහ හතරක් ඇතුළත, ගෙවා නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා පුද්ගලයකු නම්, ඒ තැනැත්තා ද, ඒ තැනැත්තා සංස්ථා ගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නම් ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම් කළමනාකරු හෝ එහි ප්‍රධාන නිලධරයා ද, එකී තැනැත්තා විසින් ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබූ සම්පූර්ණ ගාස්තුව ගෙවීම සඳහා පෞද්ගලිකව වගකිව යුතුය. තවද ඒ මුදල මෙම පනතේ විධිවිධාන මගින් සලස්වනු ලැබූ සෑම මාර්ගයකින් ම අවස්ථාවෝචිත පරිදි, ඒ පුද්ගලයාගෙන් ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ ප්‍රධාන නිලධාරියාගෙන් ලබාගත හැකිය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා "පැහැර හැරී තැනැත්තා" යන යෙදුමට, පැහැර හැරී තැනැත්තකුගේ අනුයෝජිතයකු ද ඇතුළත් වන ලෙස සැළකිය යුතු අතර යම් තැනැත්තකු ජීවත්ව සිටී නම් ඔහු විසින් ගෙවිය යුතුව තිබෙන බද්ද පැහැර හැර ඇති අවස්ථාවලට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය. තවද එවැනි අවස්ථාවකට මෙම විධිවිධාන අදාල කිරීමේ කාර්යය සඳහා (1) වන උපවගන්තියේ "පැහැර හැරී තැනැන්තා" යන යෙදුමෙන් -

(අ) මියගිය තැනැත්තකුගේ පොල්ම:කරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු; හෝ

(ආ) මියගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය භාර ගන්නා වූ හෝ දේපළ පරිශීලනය කරන්නා වූ යම් තැනැත්තෙක්; හෝ

(ඇ) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ

අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තෙක්,

අදහස් වේ.

ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන්ගෙන් අය කර ගැනීම.

91. (1) යම් තැනැත්තකු විසින් ගෙවීමට නියමිත බදු මුදල නොගෙවා, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ආසන්න බව හෝ එසේ බැහැර යාමට ඉඩකඩ ඇති බව හෝ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ මුදල පිළිබඳ විස්තර ද ඒ තැනැත්තාගේ නම ද අඩංගු සහතිකයක් කොමසාරිස්වරයා විසින් මහේස්ත්‍රාත්වරයකු වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ මහේස්ත්‍රාත්වරයා වෙත එය ලැබුණු විට, මුදල නොගෙවා හෝ එය ගෙවීම සඳහා කොමසාරිස්වරයා සෑහීමට පත්වන ආකාරයට ඇප නොතබා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාම වැළැක්වීමට ඒ මහේස්ත්‍රාත්වරයා විසින් පොලිස්පති වරයාට විධානයක් නිකුත් කළ යුතුය.

(2) මහේස්ත්‍රාත්වරයා වෙත තමාගේ සහතිකය නිකුත් කරනු ලබන වේලාවෙහි, කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට ඒ පිළිබඳව නිවේදනයක් පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ තැපැලෙන් යවනු ලබන ලියාපදිංචි කරනු ලැබූ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළ යුතුය. එහෙත් මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු එවැනි නිවේදනයක් ඒ තැනැත්තාට නොලැබීමේ හේතුවෙන් බලරහිත නොවිය යුතුය.

(3) මුදල ගෙවූ බවට හෝ මුදල ගෙවීම සඳහා ඇප තැබූ බවට හෝ පොලිස් ස්ථානයක් භාර පොලිස් නිලධාරියකුට ඒ මුදල ගෙවූ බවට කොමසාරිස්වරයා විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ඉඩ හැරීම සඳහා ප්‍රමාණවත් බලයක් විය යුතුය. යම් බදු මුදලක් යම් පොලිස් නිලධරයකුට ගෙවනු ලැබූ විට ඒ පොලිස්

නිලධරයා විසින් ඒ මුදල කොමසාරිස්වරයා වෙත නොපමාව ගෙවිය යුතුය.

අයකර ගැනීම සඳහා එකකට වැඩි මාර්ග ගණනක් උපයෝගී කර ගැනීම.

92. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අය කළ යුතු සම්පූර්ණ ගාස්තුව මේ පරිච්ඡේදයේ යම් විධිවිධානයක් අදාළ කිරීමෙන් අය කර ගැනීමට නොහැකි වී ඇති බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, 89 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කර, එය ක්‍රියාත්මක කර තිබුණද, නොගෙවා ඉතිරිව ඇති යම් මුදලක් ලබා ගැනීම සඳහා මේ පරිච්ඡේදයෙන් විධිවිධාන සලස්වනු ලැබූ වෙනත් යම් මාර්ගයක් කොමසාරිස්වරයා විසින් අනුගමනය කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

ගාස්තුව අයකර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීමට ඇති බලය.

93. කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තකු වෙත දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ තැනැත්තාගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ ලැබිය යුතු යම් ගාස්තුවක් ලබා ගැනීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයාට අවශ්‍ය වන යම් තොරතුරක්, ඒ දැන්වීමේ සඳහන් කර ඇති කාලය ඇතුළත තමා වෙත සපයන ලෙස කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

## 4 වන කොටස

## XXVIII වන පරිච්ඡේදය

## සුරාබදු ආදායම

සුරාබදු බලපත්‍ර ගාස්තු සහ තැබෑරුම් කුලී.

94. රේන්ද, ගස් මැදීමේ ගාස්තු සහ (සංශෝධිත පරිදි වූ) 1912 අංක 8 දරන සුරාබදු ආඥාපනත යටතේ, මත් බව ඇති කරන මත්පැන් සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය, මිළදී ගැනීම හා විකිණීම පිළිබඳව වූ මත්පැන් බලපත්‍ර සම්බන්ධයෙන් නියම කරනු හෝ අය කරනු ලබන්නා වූ ද පළාත තුළදී ගෙවනු හෝ අයකර ගනු ලබන්නා වූද, සියලු ගාස්තු (සංශෝධිත පරිදි වූ) ඉහත කී ආඥාපනතට අනුකූලව අයකර ගත යුතු අතර, ඒවා පළාතේ පළාත් අරමුදලේ බැරට ප්‍රේෂණය කළ යුතුය.

95. පළාතේ ආදායම් කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද තක්සේරුකරුවකුගේ නිලයට අඩු නොවන නිලයක නිලධරයකු විසින් බලපත්‍ර ගාස්තු හෝ රේන්ද අයකර ගැනීමට අදාළ යම් කාරණයක් සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා, ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලේඛන ඒ නිලධරයා විසින් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස මත්පැන් ප්‍රවාහනය කිරීමේ, සන්තකව සිටීමේ, මිලදී ගැනීමේ හෝ සිල්ලරට විකිණීමේ යෙදී සිටින යම් තැබෑරුම් රේන්ද කරුවකුට හෝ මත්පැන් බලපත්‍රලාභියකුට ලිඛිත නියමයක් මගින් නියම කළ හැකිය.

## 5 වන කොටස

## XXIX වන පරිච්ඡේදය

### ලොතරැයි

ලොතරැයි බද්ද

96. (1) ජාතික ලොතරැයිය හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් සංවිධානය කරන ලද ලොතරැයියක් හැර, යම් නීතියකට අනුකූලව බස්නාහිර පළාතේ පවත්වනු ලබන යම් ලොතරැයි සම්බන්ධයෙන්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුප්‍රමාණයක වූ බද්දක් සෑම ලොතරැයියකම දළ ලැබුම් මත පැනවිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම එම නියමයේ නිශ්චිතව සඳහන් දිනයේ දී ක්‍රියාත්මක විය යුතු අතර එම නියමය, එය පළ කිරීමේ දිනයේ සිට එක් මාසයක් ඇතුළත හෝ එම කාලසීමාව ඇතුළත සභාවේ රැස්වීමක් නොපැවැත්වුවහොත් එම කාල සීමාව ඉකුත් වීමෙන් පසුව පවත්වනු ලබන 1 වන රැස්වීමේදී හෝ සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) අනුමත කිරීමට සභාව, විසින් ප්‍රතික්ෂේප කරනු ලබන යම් නියමයක්, එම ප්‍රතික්ෂේප කිරීමේ දී සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුසේ සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කරන ලද කිසිම දෙයකට ඉන් හානියක් නොවිය යුතුය. එම නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැළකෙන දිනය

පිළිබඳව නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

(4) මේ වගන්තියේ ලොතරැයියක් යන්නට ලොතරැයියක ස්වභාවයේ වූ යම් ව්‍යවසායයක් ඇතුළත් වේ.

බද්ද ගෙවීම.

97. (1) 96 වන වගන්තිය යටතේ පනවන ලද යම් බද්දක් ලොතරැයියේ සංවිධායක හෝ සංවිධායකයින් විසින් පළාත් අදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය. එම බද්ද ගෙවනු නොලැබුවහොත් එය පළාත් සභාවට අයවිය යුතු ණයක් සේ සංවිධායකගෙන් හෝ සංවිධායකයන්ගෙන් අය කරගනු ලැබිය හැකිය.

(2) සංවිධායක හෝ සංවිධායකයන් බද්ද නොගෙවන අවස්ථාවක ඔහු හෝ ඔවුන් ප්‍රඥප්තියේ මේ කොටස යටතේ වරදකට වරදකරු හෝ වරදකරුවන් විය යුතුය.

(3) මේ ප්‍රඥප්තියේ මේ කොටස යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රු.5000/- කට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් යන දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

## 6 වන කොටස

## XXX වන පරිච්ඡේදය

## මෝටර් වාහන

මෝටර් වාහන ගාස්තු.

98. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද (සංශෝධිත පරිදි වූ ලංකා නීති ප්‍රඥප්තියේ 203 වන අධිකාරය වන) මෝටර් ප්‍රවාහන පනත යටතේ පනවනු හෝ නියම කරනු ලැබූ යම් ගාස්තු හෝ දණ්ඩන සමග බලපත්‍ර ගාස්තු ඇතුළු සියලූ ගාස්තු වූ ද පනත යටතේ ඒවා ලැබීමට හිමිකම් ඇති බලධරයාට ගෙවනු ලැබූ හෝ පළාත ඇතුළත එම බලධරයා විසින් හෝ පළාත් සභාව විසින් පත් කරන ලද වෙනත් යම්

බලධරයකු විසින් එකතු කරගෙන, එම බලධරයා විසින් පළාතේ පළාත් අරමුදලේ බැරට ප්‍රේෂණය කළ යුතුය.

## 7 වන කොටස

## XXXI වන පරිච්ඡේදය

### අධිකරණ දඩ

අධිකරණ දඩ සහ ගාස්තු.

99. (1) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් විසින් වරදවල් සම්බන්ධයෙන් පනවනු ලබන සහ අධිකරණයට ගෙවන ලද සහ යම් ලිඛිත නීතියක් යටතේ වූ යම් බද්දක්, ගාස්තුවක් හෝ වෙනත් අයකිරීමක් අයකර ගැනීම සඳහා පනවන ලද දඩයක් නොවන සියලුම දඩ, යම් ලිඛිත නීතියක් ප්‍රකාර ඒ දඩවලින් කළ යුතු යම් ගෙවීමක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් දෙනු ලබන යම් විධානයකට යටත්ව, ඒ පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(2) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් අධිකරණයක් විසින් එකතු කරනු ලබන සියලු අධිකරණ ගාස්තු ඒ පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

## 8 වන කොටස

## XXXII වන පරිච්ඡේදය

### සාමාන්‍ය කරුණු

දැන්වීමක් අත්සන් කිරීම, එය භාරදීම.

100. (1) මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස්වරයා විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ තක්සේරුකරුවකු විසින් හෝ දෙනු ලැබිය යුතු සෑම දැන්වීමකම, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ ඒ තක්සේරුකරුගේ නම සඳහන් විය යුතු අතර පළාත් කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය පළාත් කොමසාරිස්වරයාගේ හෝ පළාත් තක්සේරුකරුගේ නම යථා පරිදි එවැනි සෑම දැන්වීමක ම මුද්‍රණය කොට හෝ ඒ මත අත්සන් කරනු ලැබ හෝ තිබේ නම්,එය වලංගු විය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය ප්‍රකාර දෙන ලද සෑම දැන්වීමක් ම යම් තැනැත්තකු වෙත පෞද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු අවසන් වරට පදිංචිව සිටි ස්ථානයට හෝ ඔහු තම ව්‍යාපාරය පවත්වාගෙන යන හෝ පවත්වා ගෙන ගිය ස්ථානයට තැපැල් මගින් යැවීමෙන් හෝ භාර දෙනු ලැබිය හැකිය.

එසේ වුවද 13 වන හෝ 14 වන වගන්තිය යටතේ වූ තක්සේරු දැන්වීමක් පෞද්ගලිකව හෝ ඉහත කී පරිදි එවැනි යම් ස්ථානයකට ලියා පදිංචි ලිපියක් මගින් තැපෑලෙන් යැවීමෙන් භාරදෙනු ලැබිය යුතුය.

(3) තැපැල් මගින් යවන ලද යම් දැන්වීමක්, සාමාන්‍ය තැපෑලේ ලැබිය හැකි දින භාර දුන් ලෙස සලකනු ලැබිය යුතුය.

(4) තැපැල් මගින් භාරදුන් බව ඔප්පු කිරීමේදී දැන්වීම ඇතුළත් ලිපියෙහි නිසි ලෙස ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වන්නේය.

(5) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා දෙන ලද හෝ නිකුත් කරන ලද යම් දැන්වීමක් මත මුද්‍රණය කරන ලද හෝ අත්සන් කරන ලද හෝ යම් සහතිකයක් මත අත්සන් කරන ලද සහ එය දීමට හෝ නිකුත් කිරීමට බලය ලද තැනැත්තාගේ නම ලෙස සැලකෙන සෑම නමකටම අධිකරණ සැළකිල්ල ලැබිය යුතුය.

අනවධානයෙන් ගෙවන ලද මුද්දර ගාස්තුව හෝ දණ්ඩන මුදල්.

101. (1) යම් තැනැත්තකු විසින් එකතුකර ගැනීමක් මගින් හෝ වෙනත් ආකාරයකින්, ගෙවන ලද යම් මුද්දර ගාස්තුවක් හෝ දඩයක් ඔහු විසින් නිසි පරිදි ගෙවිය යුතු ප්‍රමාණයට වඩා වැඩි බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන ආකාරයට ඒ ගෙවීම කරන ලද දින සිට තුන් වර්ෂයක් ඇතුළත ලියවිල්ලකින් කරන ලද හිමිකම් පෑමක් මගින් ඔප්පු කරනු ලැබුවහොත්, එසේ වැඩියෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතුය.

වැඩියෙන් ගෙවූ පිරිවැටුම් බදු

(2) යම් තැනැත්තකුගෙන් යම් කාර්තුවක් සඳහා අය කළ යුතු නිසි ගණනට වැඩියෙන් ඔහු

ආපසු ගෙවිය යුතු බව.

විසින් පිරිවැටුම් බදු ගෙවා ඇති බව ඒ කාර්තුව අවසාන වීමෙන් පසු තුන් අවුරුද්දක් ඇතුළත ලියවිල්ලකින් කරන ලද හිමිකම් පෑමක් මගින් කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් එසේ වැඩියෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතුය.

(3) එසේ වුවද, මේ වගන්තියේ කිසිවක්, වෙනත් යම් වගන්තියක සඳහන්ව ඇති අභියාචනා කිරීමේ හෝ ආපසු ගෙවීමේ කාලසීමාව දීර්ඝ කිරීම හෝ අඩු කිරීම හෝ අන් ආකාරයකින් අවලංගුව ඇති යම් විරෝධය පෑමක් හෝ අභියාචනයක් වලංගු කිරීමට හෝ අවසානාත්මක වූ හා තීරණාත්මක වූ යම් දෙයක් ප්‍රතිශෝධනය කිරීමට අවසර දීම හෝ සිදුවන සේ ක්‍රියාත්මක නොවිය යුතුය.

(4) 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් මුදලක් යම් තැනැත්තකු විසින් ගෙවූ බව ද, එම මුදල එම වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව එය ගණන් බැලුවේ නම් ඔහු විසින් ගෙවිය යුතුව තිබූ මුදලට වැඩි බවද යම් තැනැත්තකු විසින් ලියවිල්ලකින් කරනු ලබන හිමිකම් පෑමක් මගින් කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක එම හිමිකම් පෑම ඉහත කී (1) වන උපවගන්තියේ සඳහන් මුදල ගෙවූ කාර්තුවේ අවසානයෙන් තුන් අවුරුද්දක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබුවේ නම්, එසේ වැඩියෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතුය.

නිල රහස්‍යතාව

102. (1) මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීමෙහි ලා හැර මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකු ම, ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට

දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාව ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහායවීම කළ යුතුය. තවද ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ හැර යම් තැනැත්තකුට එවැනි යම් කාරණයක් නොදැන්විය යුතු අතර කොමසාරිස්වරයාගේ සන්තකයෙහි භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසරදීම හෝ නොකළ යුතුය.

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ සෑම තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී අත්සන් කළ යුතු අතර අමාත්‍යවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර, සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ හැකිය.

(3) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට, මේ ප්‍රඥප්තියෙහි හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, යම් වාර්තාවක් ලේඛනයක් හෝ තක්සේරුවක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට හෝ මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේදී තමාට දන ගැනීමට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට හෙළි දරවු කිරීමට නැතහොත් දැන්වීමට හෝ නියම කරනු නොලැබිය යුතුය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, මේ ප්‍රඥප්තිය යටතේ හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය කාර්ය ඉටු කිරීමේදී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක් පළාත් අදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ එකී වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා දැනුම්දීම අවශ්‍ය නම්, ඒ ඒ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයකුට දැනුම් දිය හැකි අතර, ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද කොමසාරිස්වරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඔහු විසින් ක්‍රියාවේ යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තමාට ලැබුණ හෝ තමා සන්තකයෙහි ඇති, යම් වාර්තාවක හෝ ලේඛනයක සඳහන් යම් විස්තරවල පිටපතක්, එය ඒ විස්තරවල සත්‍ය පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ, මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකිය.

එසේ වුව ද, එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන් ඔප්පු කිරීමට අවශ්‍ය කවර හෝ විටක එසේ ඔප්පු කිරීමේ කාර්යය සඳහා පමණක්, ඒ වාර්තාවේ හෝ ලේඛනයේ පිටපත කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකිය.

එසේම තවදුරටත්, එවැනි ලේඛනයක හෝ වාර්තාවක මුල් පිටපත හෝ එවැනි ලේඛනයක හෝ වාර්තාවක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ යම් අධිකරණයකට ඉදිරිපත් කිරීමට කවර හෝ විටක දී කොමසාරිස්වරයාට බල කරනු නොලැබිය යුතුය.

(5) මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා නිසියාකාරව බලය දෙනු ලැබූ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයකුට, ස්වකීය නිල කාර්ය කිරීමට අවශ්‍ය විය හැකි යම් පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ලබා ගැනීමට කොමසාරිස්වරයා විසින් අවසර දිය හැකිය. විගණකාධිපතිවරයා හෝ මේ උපවගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු මේ පනතේ විධිවිධාන ඉෂ්ට කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ තැනැත්තකු වශයෙන් (2) වන උපවගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

102. (අ) (1) මේ වගන්තියේ මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන ආදායම් දිරිගැන්වීමේ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) 1991 ජනවාරි මස 1 දින හෝ ඉන්පසුව ආරම්භ වන එක් එක් වර්ෂ වෙනුවෙන් අරමුදලේ කාර්ය සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන යම් මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

(3) (අ) කොමසාරිස්වරයා විසින් සකස් කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව බස්නාහිර පළාතේ ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභ සාධනය සඳහා අවශ්‍ය මුදල් සහ

(ආ) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යක්ෂමතාවය සහතික කරනු පිණිස කරනු ලබන යෝජනා ක්‍රමයකට අනුකූලව බස්නාහිර පළාතේ ආදායම් දෙපාර්තමේන්තුවට අයත් නිලධරයන්ට සමූහ දිරිගැන්වීමේ දීමනා,

අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

(4) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් යෝජනා ක්‍රමය නියමිත කාර්ය පටිපාටියට අනුකූලව අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතුය.

මෙම වගන්තිය 1991 ජනවාරි 1 දා සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

ආකෘති හා ගණුදෙනු ලේඛන.

103. මේ ප්‍රඥප්තියේ කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා භාවිතා කළ යුතු ආකෘති සහ ගණුදෙනු ලේඛනය කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කල හැකිය. එසේ නියම කරනු ලැබූ යම් ආකෘති හෝ ගණුදෙනු ලේඛනය කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ එසේ නියම කරනු ලැබූ යම් ආකෘති හෝ ගණුදෙනු ලේඛනය වෙනුවට වෙනත් යම් ආකෘති හෝ ගණුදෙනු ලේඛනයක් ආදේශ කිරීම කොමසාරිස්වරයා විසින් කළ හැකිය.

## XXXIII වන පරිච්ඡේදය

## ක්‍රියාත්මක කිරීම

නිලධරයන්

104. (1) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම කොමසාරිස්වරයා වෙත භාර විය යුතුය.

(2) මේ ප්‍රඥප්තියෙන් කොමසාරිස්වරයා වෙත පවරන ලද, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් තක්සේරුකරුවකුට බලය දෙනු ලැබිය හැකිය.

(3) මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් මගින් කොමසාරිස්වරයා වෙත පවරන ලද, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කරන, ඉටු කරන හෝ කරන යම් තක්සේරුකරුවකුට ඒ බලය, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට බලය දෙනු ලැබූ බවට, එසේ නොවන බව ඔප්පු කරනු ලබන තෙක්, සියලු කාර්යය සඳහා සලකනු ලැබිය යුතුය.

(4) මේ ප්‍රඥප්තියෙන් යම් තක්සේරුකරුවකු වෙත පවරන ලද, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ

කාර්තව්‍යයක් කොමසාරිස්වරයකු විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම කරනු ලැබිය හැකිය.

105. 73 වන වගන්තිය යටතේ තමා වෙත දෙන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

## XXXIV වන පරිච්ඡේදය

## අර්ථ නිරූපනය

අර්ථ නිරූපනය

106. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි -

"ඇලෙන මුද්දරය" යන්නෙන් අලවනු ලැබිය හැකි වන්නා වූද, 76 (1) වන වගන්තිය යටතේ නියමයක් බලාත්මකව ඇත්තා වූද මුද්දරයක් අදහසක් වේ.

"අනුයෝජිතයා" යන්නට වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් ව්‍යාපාරයක මෙහෙයවීම, පාලනය හෝ කළමනාකරණය භාරව සිටින යම් තැනැත්තකු අදහස් වේ.

"තක්සේරුකරු" යන්නෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද පළාත් තක්සේරුකරුවකු අදහස් වන අතර, ඒ පනතේ කාර්ය සඳහා පත් කරන ලද ජ්‍යෙෂ්ඨ ආදායම් තක්සේරුකරුවකු ද ඊට ඇතුළත් වේ.

"බලය ලත් නියෝජිතයා" යන්නෙන් -

(1) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා යම් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ සහ -

(අ) සෑම අවස්ථාවකදීම -

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ සාමාජිකයෙක්;

(ii) කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ගණකාධිකාරීවරයෙක්

(iii)නීතිඥවරයෙක් හෝ

(iv)ඒ තැනැත්තා විසින් ස්ථිර ලෙස සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තයෙක් වන්නා වූ හෝ

(ආ)පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට ඒ පුද්ගලයාගේ ඥාතියෙක්

(ඇ)සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ අධ්‍යක්ෂවරයෙක් හෝ ලේකම්වරයා

(ඈ)හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙක්

(ඉ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජියෙක් වන්නා වූ; හෝ

(2) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා, බලය දෙන ලියවිල්ලේ සඳහන් කරුණු සම්බන්ධයෙන්, යම් තැනැත්තකු විසින් තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ ද සමාගම් (විගණකවරයන්) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි පුද්ගලයකු වන්නා වූ ද කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද හෝ තත් කාර්යය සඳහා 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනත යටතේ සාදන ලද නියෝග යටතේ, ඒ පනතේ කාර්යය සඳහා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් පුද්ගලයෙක් අදහස් වේ.

"බැංකුව" යන්නට බැංකු ආයතනයක් ද ඇතුළත් වේ.

"බැංකු ආයතනය" යන්නෙහි මුදල් නීති පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේය.

"පුද්ගල මණ්ඩලය" යන්නෙන්, යම් සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් හෝ යම් සහෝදරත්වයක්, මිත්‍ර සංගමයක්, සංගමයක්, සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන්ගේ

සමිතියක් හෝ යම් හවුල් ව්‍යාපාරයක් අදහස් වේ.

"ව්‍යාපාරය" යන්නෙන්, යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීම අදහස් වන නමුත් නිෂ්පාදකයකු විසින් විකිණීමක් ඊට ඇතුළත් නොවිය යුතුය.

"අය කළ යුතු" යන්නෙන්, ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් හෝ මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනට පසු ප්‍රථම වරට ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් හෝ සම්බන්ධයෙන් වන විට, මේ ප්‍රඥප්තිය යටතේ මුද්දර ගාස්තුවක් අය කළ යුතු බව අදහස් වේ.

"චෙක්පත" යන්නෙන්, නිශ්චිත බැංකුවක් වෙත අණ කරන ලද, එහෙත් ඉල්ලූ විට හැර, වෙනත් අවස්ථාවක, නොගෙවිය යුතු ලෙස ප්‍රකාශිත විනිමය පත්‍රයක් අදහස් වේ.

"කොමසාරිස්වරයා හෝ පළාත් කොමසාරිස්වරයා" යන්නෙන්, පළාත් ආදායම් කොමසාරිස්වරයා අදහස් වන අතර මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා පත් කරනු ලැබ තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට කොමසාරිස්වරයා විසින්, සමාන්‍ය වශයෙන් හෝ යම් නිශ්චිත කාර්යයක් සඳහා, බලය දෙන ලද නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරයකු ද ඊට ඇතුළත් වේ.

"සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක බල පවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරන ලද හෝ ලියාපදිංචි කරන ලද යම් සමාගමක් අදහස් වන අතර රාජ්‍ය සංස්ථාවක් ද ඊට ඇතුළත් වේ.

"සමර්පණය කිරීම" යන්නට, විකිණීමක් මත සමර්පණය කිරීම සහ යම් දේපළ හෝ යම් දේපළක් පිළිබඳ යම් සම්බන්ධතාවක් පවරනු ලබන සෑම සාධන පත්‍රයක් ම ඇතුළත් වේ.

"මුද්‍රාංකනය" යන්නට, සාධන පත්‍රයක් සම්බන්ධයෙන් යම් මුද්දර ගාස්තුවක් හෝ

දණ්ඩනයක් ගෙවා ඇති බව හෝ සාධන පත්‍රයක විධිමත් ලෙස මුද්දර ගසා ඇති බව හෝ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් හෝ මුද්දර ගාස්තුවක් අය කළ යුතු බව ප්‍රකාශ කිරීම හෝ ඒ බව දක්වීම සඳහා කොමසාරිස්වරයාගේ විධානය යටතේ භාවිතා කරන ලද යම් තහඩු මුද්‍රණයක්, අකුරු ආයුධයක් හෝ උපකරණයක් හෝ එහි කොටසක් ඇතුළත් වේ.

"ලේඛනය" යන්න යම් අධිකරණයක නඩු කටයුතු සම්බන්ධයෙන් යෙදෙන විට, ඊට නීතිඥවරයකු පත් කිරීම, පැමිණිල්ල, උත්තරය, ප්‍රතිඋත්තරය හෝ වෙනත් උත්තරවාදයක්, පෙත්සමක්, ඉල්ලීමක්, දිවුරුම් පත්‍රයක්,පත් කිරීමක්, සිතාසියක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, යම් ආකාරයක ආඥාවක්, ප්‍රදානයක්, රිට් ආඥාවක්, වරෙන්තුවක්, ඉන්වෙන්ටරියක්, ගිණුමක්, අධිකරණ විධානයක්, බැඳුම්කරයක් හෝ ඇප පත්‍රයක්, කැඳවීමක්, මෝසමක් නොවන ඉල්ලුම් පත්‍රයක්, ප්‍රශ්න මාලාවක්, ප්‍රශ්නමාලාවට පිළිතුරු, අභියාචන දැන්වීමක්, ගාස්තු බිල් පත්‍රයක්, අධිකාර පත්‍රයක්, ඉන්ජන්ෂන් තහනමක් හෝ දැන්වීමක් ඇතුළත් වේ.

"නිසි පරිදි මුද්දර ගසන ලද" යන්න යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් නිසි වටිනාකමට අඩු නොවන ඇලෙන මුද්දරයක් හෝ ලාංඡිත මුද්දරයක් හෝ පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බව ද නැතහොත් ගෙවීම පිළිබඳ සහතිකයක් ඊට අලවා ඇති බවද ඒ මුද්දරය ඇලෙන මුද්දරයක් වන අවස්ථාවක, මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව ඒ මුද්දරය ගසා, අවලංගු කොට ඇති බව ද අදහස්වේ.

"ලියා අත්සන් කරන ලද" සහ "ලියා අත්සන් කිරීම" යන්න, සාධන පත්‍රයක් සම්බන්ධයෙන් භාවිතා කරනු ලබන විට, පිළිවෙලින් "අත්සන් කරන ලද" සහ "අත්සන" යන්න ඉන් අදහස් වේ.

"පොල්මඃකරු" යන්නෙන්, මියගිය තැනැත්තකුගේ පොල්ම:කරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු අදහස් වන අතර, ඊට පහත දැක්වෙන අය ඇතුළත් වේ.

(අ) මියගිය තැනැත්තකුගේ දේපළ වල සන්තකය භාර ගන්නා වූ හෝ දේපළ පරිශීලනය කරන්නා වූ තැනැත්තෙක්; හෝ

(ආ) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තෙක්; හෝ

(ඇ) භාරයේ කර්තෘගේ අන්තිම කැමති පත්‍රය යටතේ ඇති කරන ලද භාරයක් යටතේ ක්‍රියා කරන භාරකරුවෙක් අදහස් වේ.

"ත්‍යාගය" යන්නෙන්, ස්වෙච්ඡාවෙන් සහ මුදලින් වූ ප්‍රතිෂ්ඨාවක්, හෝ මුදල් වටිනාකම ඇති ප්‍රතිෂ්ඨාවක් නොමැතිව යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකුට පවරා දීමක් අදහස්වේ.

"අබලතාවයට පත් තැනැත්තා" යන්නෙන්, යම් බාලවයස්කරුවෙක්, උන්මත්තකයෙක්, මුග්ධයෙක් හෝ සිහිවිකල තැනැත්තෙක් අදහස් වේ.

"ලාංඡිත මුද්දරය" යන්නෙන්, මුද්‍රාංකනයක මාර්ගයෙන් සහ රුපියල් දහයක් නො ඉක්මවන මුද්දර ගාස්තුවක් අය කළ යුතු යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වූ ලාංඡනය කරන ලද මුද්දර අදහස් වන අතර, සභාව විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ පාවිච්චි කරනු ලබන, තැපැල් නිල මුද්‍රා යන්ත්‍රයක් මාර්ගයෙන් ලාංඡනය කරන ලද මුද්දර ද ඇතුළත් වේ.

"සාධන පත්‍රය" යන්නට බස්නාහිර පළාත තුළ යම් නිශ්චල දේපළක් පැවරීමට සම්බන්ධ හෝ බස්නාහිර පළාත තුළ මෝටර් වාහනයක් පැවරීමට සම්බන්ධ සෑම ලේඛනයක්ම ඇතුළත් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන්, මුදල් විෂය භාර කරනු ලැබ ඇති පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා අදහස් වේ.

"මුදල්" යන්නට ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් ප්‍රකාශ කරනු ලැබූ හෝ විදේශයක ව්‍යවහාර මුදලින් ප්‍රකාශ කරනු ලැබූ සියලූ මුදල් ඇතුළත් වේ.

"මෝටර් වාහනය" යන්නෙන්, මෝටර් ප්‍රවාහන පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතුය.

"ඇටෝර්නි බලය" යන්නට යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කරන තැනැත්තා වෙනුවෙන් හෝ ඒ තැනැත්තාගේ නාමයෙන් ක්‍රියා කිරීමට යම් නිශ්චිත තැනැත්තකුට බලය දෙන්නා වූ ඒ සාධන පත්‍රය ඇතුළත් වේ.

"තැනැත්තා" යන්නට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් ඊට ඇතුළත් වේ.

"පළාත" යන්නෙන්, ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත අදහස් වේ.

"පළාත් තක්සේරුකරු" යන්නෙන්, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත්කරන ලද අදායම් තක්සේරුකරුවෙක් අදහස් වේ.

"පළාත් කොමසාරිස්වරයා" යන්නෙන්, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද පළාත් ආදායම් කොමසාරිස්වරයා අදහස් වේ.

"නියෝජ්‍ය පළාත් කොමසාරිස්" යන්නෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස් අදහස් වේ.

"පළාත් සභාව"යන්නෙන් පළාතක පළාත් සභාව අදහස් වේ.

"ප්‍රමුඛ හවුල්කරු" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සක්‍රිය හවුල්කරුවන් අතරින්

(අ) හවුල් ව්‍යාපාර ගිවිසුමේ පළමුවෙන් නම් කොට ඇති; හෝ

(ආ) ගිවිසුමක් නොමැති නම් හවුල් ව්‍යාපාර හෝ සාමාන්‍ය නාමයෙන් තනිවම හෝ අනික් හවුල් කරුවන්ට ප්‍රමුඛව නමින් හෝ මුලකුරුවලින් සඳහන් කොට ඇති ; හෝ

(ඇ) ව්‍යාපාර නාම ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයෙහි පළමුවෙන් නම් කොට ඇති; හවුල්කරු අදහස් වේ.

"කාර්තුව" යන්නෙන්, එක් එක් වර්ෂයේ ජනවාරි මස 1 වන දින, අප්‍රේල් මස 1 වන දින, ජූලි මස 1 වන දින සහ ඔක්තෝබර් මස 1 වන දින ආරම්භ වන මාස තුනක කාල පරිච්ඡේදය අදහස් වේ.

"පැවරීම" යන්නෙන්, විකිණීමක් අදහස් වන අතර, ඊට මියගිය තැනැත්තකුගේ බූදලයේ පොල්මෑකරු විසින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් යම් දේපළක් සම්බන්ධයෙන් අර්ථලාභී අයිතිවාසිකමක් තිබෙන යම් තැනැත්තකුට හෝ මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය යටතේ පත්කරන ලද භාරකරුවකුට හෝ භාරකරුවකු විසින් අර්ථ ලාභියකුට හෝ ප්‍රතිෂ්ඨාවක් රහිතව ඒ දේපළ තැගිදීම හෝ හුවමාරු කිරීම හෝ සමර්පණය කිරීම හෝ භාරකරුවකු විසින් හෝ මියගිය භාරකරුවකුගේ පොල්මෑකරු විසින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් ජීවත්ව සිටින භාරකරුවකුට හෝ අලුත් භාරකරුවකුට ප්‍රතිෂ්ඨාවක් රහිතව ඒ දේපළ සමර්පණය කිරීම ඇතුළත් වන

නමුත් පොදුවේ දරන ලද යම් ඉඩමක් බෙදා වෙන්කිරීමේ ඔප්පුවක් හෝ පැවරීමේ ගිවිසුමක් ඊට ඇතුළත් නොවේ.

"භාරකරු" යන්නට යම් භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක් කළමණාකරුවෙක්, අනුයෝජිතයෙක් හෝ යම් තැනැත්තකු වෙනුවෙන් යම් දේපළක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය සතුව ඇති වෙනත් තැනැත්තෙක් ඇතුළත්වන නමුත් පොල්මෑකරුවෙක් ඊට ඇතුළත් නොවේ.

"වටිනාකම" යන්න

(අ) (තෑගි කරන ලද නිශ්චල දේපළක් නොවන) යම් දේපළක් සහ යම් දිනයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් තක්සේරුකරුගේ මතය අනුව, ඒ දිනයේදී විවෘත වෙළෙඳ පොළේදී ඒ දේපළ සඳහා ලබාගත හැකි මිළ අදහස් වේ.

(ආ) 1977 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ත්‍යාගදායකයා විසින් අත්කර ගන්නා ලද නිශ්චල දේපළක් වන, තෑගි කරන ලද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් -

(1) ඒ දේපළ 1977 මාර්තු මස 31 වන දින විවෘත වෙළෙඳ පොළේදී විකුණනු ලැබිණි නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලබාගත හැකි මිළට 1977 මාර්තු මස 31 වන දිනට පසු සහ ඒ දේපළ තෑගි කරනු ලැබුවේ යම් සාධන පත්‍රයක් මගින්ද, ඒ සාධන පත්‍රයේ සඳහන් වන දිනට පෙර ඒ දේපළට වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම්, හා එකතු කිරීම් කරනු ලැබුවේ නම්, ඒ වැඩිදියුණු කිරීම් වෙනස් කිරීම් සහ එකතු කිරීම් සඳහා ගිය වියදමට සමාන මුදලක් එකතු වූ විට ලැබෙන ප්‍රමාණය; හෝ

(11) ඒ දේපළ තෑගි කරනු ලැබුවේ යම් සාදන පත්‍රයක් මගින් ද ඒ සාධන පත්‍රයේ සඳහන්වන දිනයේදී ඒ දේපළ විවෘත වෙළෙඳ පොළේදී විකුණනු ලැබිණි නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලබාගත හැකි මිළ

යන දෙකෙන් අඩු මුදල අදහස්වේ.

(ඇ)1977 මාර්තු මස 31 වන දිනට පසු ත්‍යාගදායකයා විසින් අත්කර ගන්නා ලද නිශ්චල දේපළක් වන, තෑගි කරන ලද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් -

(1) ත්‍යාගදායකයා විසින් ඒ දේපළ අත්කරගන්නා ලද දිනයේ දී ඒ දේපළ විවෘත වෙළෙඳ පොළේදී විකුණනු ලැබිණි නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලබාගත හැකි මිළට, ත්‍යාගදායකයා විසින් ඒ දේපළ අත්කර ගන්නා ලද දිනයෙන් පසු සහ ඒ දේපළ තෑගි කරනු ලැබුවේ යම් සාධන පත්‍රයක් මගින්ද ඒ සාධන පත්‍රයේ සඳහන් වන දිනයට පෙර ඒ දේපළට වැඩි දියුණු කිරීම්, වෙනස් කිරීම් සහ එකතු කිරීම් කරනු ලැබුවේ නම් ඒ වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම් සහ එකතු කිරීම් සඳහා ගිය වියදමට සමාන මුදලක් එකතු වූ විට ලැබෙන ප්‍රමාණය; හෝ

(11)ඒ දේපළ තෑගි කරනු ලැබුවේ යම් සාධන පත්‍රයක් මගින්ද, ඒ සාධන පත්‍රයේ සඳහන් වන දිනයේදී ඒ දේපළ විවෘත වෙළෙඳ පොළේදී විකුණනු ලැබිණි නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලබාගත හැකි මිළ; යන දෙකෙන් අඩු මුදල අදහස්වේ.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## XXXV වන පරිච්ඡේදය

## 1989 අංක 6 දරණ මුදල් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම බස්නාහිර පළාත් සභාව

107. 1991 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව එළඹෙන කවර හෝ කාල පරිච්ඡේදයක් සඳහා පිරිවැටුම් බද්ද, ලොතරැයි, මෝටර් රථ වාහන හා උසාවි දඩ මුදල් අය කර ගැනීම සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1989 අංක 6 දරණ මුදල් ප්‍රඥප්තිය අදාල නොවේ.